කොවිඩ් ව්‍යාප්තිය
ප්‍රතිකාර ලබන පිරිස 383
මරණ 16,518
සුව වූ පිරිස 646,968

# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ

කොවිඩ් එන්නත්කරණය
දෙවැනි බූස්ටර් මාත්‍රාව ගත් පිරිස 6,720
ප්‍රථම බූස්ටර් මාත්‍රාව ගත් පිරිස 7,985,971
දෙවැනි මාත්‍රාව ගත් පිරිස 14,513,375
ප්‍රථම මාත්‍රාව ගත් පිරිස 17,072,641

ශ්‍රී බුද්ධ වර්ෂ 2566ක් වූ පොසොන් පුර අටවක තිථිය ලත් කුජ දින | කාණ්ඩය 113 | පත්‍රය 145 | පිටු 16 | මිල රු.50 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත්පතකි | 2022 ජූනි 07 අඟහරුවාදා




## ප්‍රසන්න රණතුංගට වසර 5ක අත්හිටුවූ සිරදඬුවම්

රෝෂන් තුෂාර

6 පිටුවට



# රට යන්න කැමැති රාජ්‍ය සේවකයන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට තොරතුරු දෙන්න

මහින්ද අලුත්ගෙදර සහ අනුර ප්‍රේමලාල්

6 පිටුවට



## ‘ඒරොෆ්ලොට්’ එරෙහි අධිකරණ නියෝගය අත්හිටුවයි

## යානය රුසියාව බලා පියාසර කරයි

රෝෂන් තුෂාර සහ කටුනායක කේ.ටී.ජී. කපිල

6 පිටුවට

## වගා සංග්‍රාමයට කොළඹ දිසාව සූදානම්

දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න

මහින්ද අලුත්ගෙදර සහ රක්ෂණ ශ්‍රියන්ත

6 පිටුවට

## සංචාරක කර්මාන්තයෙන් අමෙරිකන් ඩොලර් මිලියන 800ක ආදායමක් අපේක්ෂා කරනවා

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

මහින්ද අලුත්ගෙදර

6 පිටුවට



‘ඒරොෆ්ලොට්’ රඳවා ගැනීම

## පිස්කල්ට නීතිඥයාට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගන්නවා

රජය අවධාරණය කරයි

මහින්ද අලුත්ගෙදර

6 පිටුවට

## නිෂ්පාදනය අඩු වී එළවළු මිල ඉහළට

ඉන්ධන නැති නිසා අලෙවිය පහළට

සීගිරිය විශේෂ

දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට ඊයේ (06) එළවළු ලැබීම මෙන්ම එළවළු මිල දී ගැනීම සඳහා වෙළෙන්දන් පැමිණීම ද සියයට 80කින් පමණ අඩු වීම හේතුවෙන් ආර්ථික මධ්‍යස්ථානයේ එළවළු මිල ශීඝ්‍ර ලෙස ඉහළ යමින් පවතින බව ව්‍යාපාරිකයෝ පෙන්වා දෙති. 6 පිටුවට



## බිලියන 695ක පරිපූරක ඇස්තමේන්තුව අද පාර්ලිමේන්තුවට

ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ සන්ධ්‍යා කරුණාරත්න

6 පිටුවට

## සමාජ මාධ්‍ය නිහඬ කරන්න දුරකතන බදු වැඩි කළා



දුරකතන ආශ්‍රිතව දැවැන්ත බද්දක් හඳුන්වා දී ඇත්තේ සමාජ මාධ්‍ය නිහඬ කිරීමේ න්‍යාය පත්‍රය අනුව බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

පසුගියදා ආණ්ඩුව බදු පිට බදු ගැසූ බවත්, ඍජුව සහ වක්‍රව ඒ බදු සමාජ මාධ්‍යවලටත් අදාළ බවද විපක්ෂ නායකවරයා පෙන්වා දෙයි. 6 පිටුවට



## ගුවන්ගත වීමට තිබූ යානය දඬිබිඩියේ නවතා ගත්තේ කාගේ වුවමනාවකට ද?

නුවන් කොඩිකාර

12 පිටුවට

## ක්‍රිකට් ප්‍රවේශ පත්‍රවල මුළු ආදායම ජනතා සහන අරමුදලට

ප්‍රින්ස් ගුණසේකර

ශ්‍රී ලංකාව හා ඔස්ට්‍රේලියාව අතර අද (07) ආරම්භ වන ක්‍රිකට් තරගාවලියේ සම්පූර්ණ ප්‍රවේශපත්‍ර ආදායම ජනතා සහන වෙනුවෙන් ඇති රජයට පිරිනමන බව ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පවසයි. ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම් මොහාන් ද සිල්වා මහතා පැවසුවේ ක්‍රිකට් සභාපති ශම්මි සිල්වා මහතාගේ උපදෙස් පරිදි ප්‍රවේශපත්‍රවල සියලු ආදායම් ක්‍රීඩා ඇමැති රෝෂාන් රණසිංහ මහතා මඟින් රජය වෙත පිරිනැමීමට ක්‍රියා කරන බවයි.

6 පිටුවට



21 වැනි ව්‍යවස්ථා සංශෝධනයට

## ජාතික ජන බලවේගයේ යෝජනා සකසා අවසන්

උපාලි කරුණාරත්න

විසිඑක් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ජාතික ජන බලවේගයේ යෝජනා මාලාව මේ වන විට සකසා අවසන් බව පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා පැවසීය. 6 පිටුවට

## පෙරේදා රිය අනතුරුවලින් 5 දෙනෙක් මරුට

රක්ෂණ ශ්‍රියන්ත

දිවයින පුරා පෙරේදා (05) සිදු වූ රිය අනතුරුවලින් 05 දෙනකු මියගොස් ඇති බව පොලිස් මූලස්ථානය සඳහන් කරයි. ඒ අනුව මරදන්කඩවල ගනේවල්පොළ බෝක්කුව අසලදී මාර්ගය අලුත්වැඩියාවේ යෙදුණු පුද්ගලයකු එස්කැවේටර් රථයක ගැටීමෙන් මියගොස් ඇත. 6 පිටුවට

## වක්වැල්ලේ බස්වලින් ඩීසල් අදින ජාවාරමක්

හිනිදුම විශේෂ රවීන්ද්‍ර ලියනගේ

ඉන්ධන මිල සහ ඉන්ධන හිඟය හමුවේ බස් රථවලින් ඩීසල් සොරකම් කිරීමේ ජාවාරමක් ක්‍රියාත්මක බව ගාල්ල වක්වැල්ල ප්‍රදේශයේ පෞද්ගලික බස්රථ හිමියෝ පවසති. 6 පිටුවට

## රාජ්‍ය සේවා කොමිසම අද රැස් වෙයි

සුභාෂිණී සේනානායක සහ රක්ෂණ ශ්‍රියන්ත


හදිසියේම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් තිදෙනකුට ස්ථාන මාරු දීම සම්බන්ධයෙන් වාර්තා දෙකක් සමාලෝචනය කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිසම අද (07) රැස් වීමට නියමිත බව වාර්තා වේ. 6 පිටුවට





AA CEYLON Estd. 1904
පවුලේ අවන්හල දැන් විවෘතයි
FOOD
AUTO WHEEL
Restaurant and Lounge
Managed by :
Automobile Association of Ceylon
40, Sir M. M. M. Mawatha, Colombo-3
www.aaceylon.lk
Hotline - 0117555557
077 4369013 (Krishon)
RESERVATION ACCEPTED FOR PRIVATE FUNCTIONS

# වරාපිටියේ ආනන්ද නාහිමි ආදාහන පූජෝත්සවය හෙට



උතුරු තලංගම, හිනැටිකුඹුර පුරාණ විහාරය, බණ්ඩාරවත්ත ආනන්දාරාමය යන උභය විහාරාධිපති වරාපිටියේ ආනන්ද නාහිමියෝ අපවත් වූහ.

පුරා වසර පනහකට වැඩිකාලයක් ආගමික හා ශාසනික වශයෙන් විශාල සේවාවක් ඉටු කළ උන්වහන්සේ විවිධ ප්‍රදේශවලින් වැඩම කළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන කටයුතුවලට මහත්සේ උපකාර කළ හිමිනමකි.

අපවත් වනවිට 72 වැනි වියේ පසුවූ ආනන්ද හිමියන්ගේ දේහය පිළිබඳ ආදාහන පූජෝත්සවය හෙට (8) සවස 4ට කලපලුවාව සිද්ධාර්ථ විද්‍යාලයීය ක්‍රීඩාංගණයේ දී සිදුකෙරේ. ආගමික කටයුතු සවස 1ට හිනැටිකුඹුර විහාරස්ථානයේදී සිදුකෙරේ.

# විශ්‍රාමික ලේක්හවුස් සේවිකාවගේ අවසන් කටයුතු අද

ලේක්හවුස් ආයතනයේ සේවය කරමින් සිටියදී නැසී ගිය ආර්.ඒ.එස්.රණසිංහ මහතාගේ බිරිය වූ ලේක්හවුස් ආයතනයේ දැන්වීම් අතිරේක අංශයට අනුයුක්තව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරිනියක ලෙස සේවය කරමින් සිට විශ්‍රාම ලැබූ ශාන්ති රණසිංහ මහත්මිය අවුරුදු 65ක් ආයු වළඳා අභාවප්‍රාප්ත වූවාය.

ඒ මහත්මියගේ දේහය මේ වන විට මහජන ගෞරවය සඳහා පිළියන්දල බයිපාස් මාර්ගය ඉදිරිපිට පිහිටි 'බොරලැස්ගමුව මල් ශාලාවේ' තැන්පත් කර ඇත.

ශාන්ති රණසිංහ මහත්මිය සිංහ සමාජ සාමාජිකාවක ලෙසද කටයුතු කර ඇති අතර මිය යන තෙක්ම සමාජ සේවා කටයුතු රැසක ඉතා උද්‍යෝගීමත්ව නිරත වූවාය.

දේහය පිළිබඳ අවසන් කටයුතු අද (7) සවස 3ට කැස්බෑව පොදු සුසාන භූමියේදී සිදු කෙරේ

## රුසියා ගුවන් යානය රඳවා ගැනීම

# දෙරටේ වෙළෙඳ ගනුදෙනුවලට මරු පහරක්

## පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර



**සුභාෂිණී සේනානායක**

රුසියානු එරොෆ්ලොට් ගුවන් යානය ශ්‍රී ලංකාවේ රඳවා තැබීම දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සහ වෙළෙඳ ගනුදෙනුවලට මරු පහරක් බව සම සමාජ පක්ෂයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා පැවසීය.

අධිකරණ තීන්දුව දීමට පෙර එය රටවල් අතර ප්‍රශ්නයක් වීමට හැකි බව දැන තිබිය යුතුව තිබුණා යැයිද මහතා කියා සිටියේය.

වෙනත් රටවල දේපොළ ආරක්ෂා කිරීමට අප නීතියෙන් බැඳී සිටිනවා. එසේ කිරීමට නොහැකි වීම බරපතළ වරදක්.

ඒ මහතා මේ බව කියා සිටියේ ඊයේ කොළඹ පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමිනි.

# ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් විදේශ වෙළඳපොළ ජය ගැනීම සඳහා කෘෂි ව්‍යවසායකයින්ට අවශ්‍ය දැනුම ලබාදීම





අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින ව්‍යවසායකයන් හට විදේශ වෙළඳපොළ සඳහා කෘෂි නිෂ්පාදන අපනයනයේ දී අවශ්‍ය වන සහතිකකරණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සුහුරුපායේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මෙහිදී SLS ලාංඡන සහතිකකරණය, විද්‍යා සහතිකකරණය, GMP සහතිකකරණය, HACCP, ISO 22000 සහ කාබනික නිෂ්පාදන සහතිකකරණය පිළිබඳ රැස්ව සිටි ව්‍යවසායකයින් දැනුවත් කෙරිණි. මෙම වැඩමුළුව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කොළඹ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ මධුෂානි සිල්වා මහත්මිය විසින් සංවිධානය කරන ලද අතර, මෙහි දේශනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පද්ධති සහතිකකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තෙරුණි විජේසූරිය මහත්මිය විසින් පවත්වන ලදී. එමෙන්ම වැඩසටහනට සහභාගී වූ ව්‍යවසායකයින්ගේ ප්‍රශ්න හා ගැටලු නිරාකරණය කර අවශ්‍ය සහතිකකරණයන් ලබාගැනීම සඳහා මාර්ගෝපදේශනය ද සිදු කෙරිණි.

## ගාලුමුවදොර උද්ඝෝෂණයට පහර දීම

# අත්අඩංගුවට ගත් 27 වැනි සැකකරු රිමාන්ඩ්

**සුභාෂිණී සේනානායක**

අරලියගහ මන්දිරය අසල සහ ගාලුමුවදොර අරගල භූමියේ සාමකාමී උද්ඝෝෂණයට පහරදුන් සිද්ධියට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ 27 වැනි සැකකරු අද (8) දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් තිළිණ ගමගේ මහතා ඊයේ (6) නියෝග කළේය. මෙලෙස රක්ෂිත බන්ධනාගාර ගත කළ සැකකරු හඳුනා ගැනීමේ පෙරට්ටුවට ඉදිරිපත් කිරීමට ආවරණ සහිතව ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සනත් නිශාන්ත මිලාන් ජයතිලක ඇතුළු සැකකරුවන් පිරිසක් ද රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ.


SINCE 1978 44th OBSERVER SLT-MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2022
Recognizing talent, inspiring greatness.
SLTMOBITEL The Connection

## 44th OBSERVER SLT-MOBITEL

### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2022

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ **OBSERVER SLT-MOBITEL** වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2021/2022 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2022**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2021/2022 වයස අවු.19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..............................
අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐
සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..............................
**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංග වේ)**
පාසල : ..............................
ඔබේ නම : ..............................
ලිපිනය : ..............................
ජංගම දුරකථන අංකය : ..............................

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : රු. 2,500/- **දෙවන ත්‍යාගය** : රු. 1,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,000/-

44 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස්, **SLT-MOBITEL** ආයතන සේවක/සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 11-06-2022 **අංකය** 11






### බලශක්ති අමාත්‍යාංශය
### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
## දීර්ඝ කිරීමේ දැන්වීමයි

**යාපනය ගුවන් තොටුපළ සඳහා ලීටර් 15,000 ධාරිතාවයේ, ගුවන් යානා ඉන්ධන පිරවුම් රථ (Aircraft Refuller) 02 ක් සැලසුම් නිර්මාණය කර සැපයීම**

**B/25/2022**

ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව විසින් ඉහත ශීර්ෂය යටතේ මෙම පුවත්පතේ පළවූ දැන්වීමට අනුව, ලංසු ක්‍රියාවලියට සම්බන්ධවීමට හා සහභාගි වීමට කැමැත්තක් හා උනන්දුවක් දක්වන අයගේ සහ දැනටමත් ලංසු ලිපිලේඛන ලබාගෙන ඇති අපේක්ෂිත ලංසුකරුවන්ගේ අවධානය මෙයින් යොමු කරවනු ලැබේ.

ලංසු ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ (ලංසු ඉදිරිපත් කළ යුතු) අවසාන දිනය හා වේලාව වන "**2022.06.10 වන දින පැය 14.00 දක්වා**" යන්න **2022.06.24 වන දින පැය 14.00 දක්වා** වශයෙන් දීර්ඝ කරනු ලැබේ.

තවද ලංසු වලංගුතා කාලසීමාව ලංසු භාරගන්නා අවසාන දින සිට දින 91 ක් දක්වා වශයෙන් වන ලංසු වලංගුතා කාලය (**එනම් 2022.09.23 දක්වා වශයෙන්**) ද, ලංසු සුරක්ෂණ ඇපකරයේ වලංගුතා කාලසීමාව ලංසු භාරගන්නා අවසාන දින සිට **දින 119 ක්** දක්වා වශයෙන් (**එනම් 2022.10.21 වන දින දක්වා වශයෙන්**) ද විය යුතු බවද සලකනු මැනවි.

පෙර දැන්වීමේ සඳහන්ව තිබූ අනෙකුත් සියලු කොන්දේසි හා නියමයන් නොවෙනස්ව පවතී.

**කළමනාකරු (ප්‍රසම්පාදන හා ගබඩා),**
**ප්‍රසම්පාදන හා ගබඩා අංශය,**
**ලංකා ඛනිජ තෙල් (නීතිගත) සංස්ථාව,**
**1 වන මහල, අංක 609,**
**දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.**
**දුරකථන : 0094 11 5455331**
**ෆැක්ස් : 0094 11 5455424**


දිනය 2022.06.05 ඉරිදා ඹිල ප්‍රතිඵල NLB

**මහජන සම්පත** — දිනුම් වාරය : 4777 — දිනා ඇති මුළු මුදල රු. 5,333,810.00 — ජයග්‍රාහී අක්ෂරය X — ජයග්‍රාහී අංක 2 1 3 8 2 9 — මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.15,919,064.00

**ධන නිධානය** — දිනුම් වාරය : 807 — දිනා ඇති මුළු ත්‍යාග මුදල රු. 1,969,680.00 — ඉංග්‍රීසි අක්ෂරය N — ජයග්‍රාහී අංක 63 69 79 82 — මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.113,118,692.00

**ජාතික සම්පත** — දිනුම් වාරය : 1255 — දිනා ඇති මුළු මුදල රු. 1,410,000.00 — ජයග්‍රාහී අංක 2 4 3 3 2 5 — මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු. 11,541,542.80

**හඳහන** — දිනුම් වාරය 0086 — දිනා ඇති මුළු මුදල රු.3,461,340.00 — ජයග්‍රාහී අංක 04 11 27 44 — මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.2,737,871.60

**ගොවිසෙත** — දිනුම් වාරය 3019 — දිනා ඇති මුළු මුදල රු. 3,209,920.00 — ඉංග්‍රීසි අක්ෂරය N — ජයග්‍රාහී අංක 15 36 71 77 — මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය රු.67,221,429.36

**Mega POWER** — දිනුම් වාරය : 1125 — දිනා ඇති මුළු මුදල රු.2,495,840.00 — මීළඟ සුපිරි ත්‍යාගය රු.254,765,726.00 — O 22 38 53 72 73 — රු.10,000,000.00 — රු.10,000,000.00

ජාතික ලොතරැයි මණ්ඩලය National Lotteries Board — දුර.: 011-4607900, 011-4607001-2 — ෆැක්ස් : 011-4601475 — Web : www.nlb.lk


## ප්‍රසම්පාදන දැන්වීමයි
### රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

N - 64

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ දේශීය නිෂ්පාදකයන්ගෙන් / සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ලංසු කැඳවනු ලැබේ. තොග පවත්වාගන්නන් හෝ ඇණවුම් භාර දී දින 45 කින් සැපයිය හැකි අය ලංසු සඳහා ඉදිරිපත් විය යුතුය.

01. White Printing Paper - 30" x 40" - 70gsm ± 2.5%-100MT±10%
යොමු අංකය : SCP06/WPP/30X40/70/NCB32/2022-03
ආපසු නොගෙවන තැන්පතුව : රු. 5,000.00

02. White Printing Paper IK- 24" x 36" - 80gsm ± 2.5%-1,000 Reams
යොමු අංකය : SCP06/WPP/BCF/NCB33/2002-20
ආපසු නොගෙවන තැන්පතුව : රු. 5,000.00

03. One Side Coated White Back Board - 31" x 43" - 400gsm ± 2.5%-10,000 Sheets
යොමු අංකය : SCP06/Duplex/31"x43"/NCB31/2022-32
ආපසු නොගෙවන තැන්පතුව : රු. 1,000.00

**ලංසු කැඳවීමේ අවසාන දිනය** : 2022.06.28 – ප.ව. 2.00

2022.06.28 දින ප.ව. 2.00 ට ලංසු කැඳවීම අවසන් වන අතර, එම වේලාවටම විවෘත කරනු ලැබේ. ලංසුවලට අදාළ ලිපි ලේඛන පහත ලිපිනයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සැපයීම් අංශයෙන් සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා නිකුත් කරනු ලැබේ. සෑම ලංසුවක් සඳහාම ආපසු නොගෙවන ගාස්තුවක් සමග ලංසු අයදුම්පතක් ඉහත සඳහන් ලංසු අවසන් කරන දිනයට පෙර දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පැමිණ ලබාගත යුතුයි.

වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා මගේ කාර්යාලයෙන් ලබාගත හැක.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**
**2022.06.07**
**දුරකථන - ෆැක්ස් : 011-2694898**
**වෙබ් අඩවිය : www.documents.gov.lk**



### පරිසර අමාත්‍යාංශය
### ජී.එස්. එම්. බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම
### GSMB Technical Services (PVT) Ltd

## මනම්පිටිය වැලි ව්‍යාපෘතිය සඳහා කුලී පදනම මත ලෝඩර් (Loader) ලබාගැනීම සඳහා ප්‍රසම්පාදනය

**ප්‍රසම්පාදන අංකය : GSMBTS/PUR/NCB/2022-36**

GSMB ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මනම්පිටිය වැලි ව්‍යාපෘතිය සඳහා කුලී පදනම මත Loader (ලෝඩර්) ලබාගැනීම අරභයා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අයිතම අංකය | විස්තරය | ලංසු බැඳුම්කරය (රුපියල්) |
|---|---|---|
| 01 | මනම්පිටිය වැලි ව්‍යාපෘතිය සඳහා, කුලී පදනම මත ලෝඩර් ලබා ගැනීම (ලෝඩර් 09 ක්) | රුපියල් 25,000.00 (එක් ලෝඩරයකට) |

ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ මෙහෙවනු ලැබේ. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු GSMB ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි (දුරකතන අංක : 0112824025) වෙතින් විමසා ලබාගත හැකි වන අතර, ලංසු ලිපිලේඛන ප්‍රසම්පාදන අංශයේ කාර්යාලයේදී 2022 ජුනි මස 07 වන දින සිට 2022 ජුනි මස 24 වන දින පැය 15.00 දක්වා කාර්යාල වේලාවන් තුළදී පරීක්ෂා කර බැලිය හැකිය.

අභිලාෂී ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ජීඑස්එම්බී (GSMB) ටෙක්නිකල් සර්විසස් (පුද්ගලික) සමාගමේ ගිණුම් අංශයට ආපසු ගෙවනු නොලබන රු. 3,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව මිලදී ගත හැකිය.

මුද්‍රා තබන ලද ලංසු 2022 ජුනි මස 27 වනදින පැය 14.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ GSMB ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. සියලුම ලංසු සමග ඉහත වගුවේ සඳහන් වටිනාකමට වන ලංසු සුරක්ෂණ ඇපකරයක් ද ඉදිරිපත් කළ යුතුය. වලංගු ලංසු සුරක්ෂණයක් රහිතව ඉදිරිපත් කරනු ලබන ඕනෑම ලංසුවක් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ප්‍රමාද ලංසු භාරගැනීමද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලංසු, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී ජීඑස්එම්බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගමේ සම්මන්ත්‍රණ කාමරයේදී විවෘත කරනු ලැබේ. ලංසු 2023 ජූලි මස 27 වන දින දක්වා වලංගුව පැවතිය යුතුය.

**සභාපති (ප්‍රසම්පාදන කමිටුව),**
**GSMB ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,**
**190/A, රත්නවීර ගොඩනැගිල්ල,**
**ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.**

# ආහාර අර්බුදය පියවීමට බංග්ලාදේශයෙන් අර්තාපල්



**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාව මුහුණ දෙන වත්මන් තත්ත්වය සැලකිල්ලට ගෙන රටේ ජනතාවගේ ආහාර අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වෙනුවෙන් අර්තාපල් ලබා දීමට බංග්ලාදේශය කැමැත්ත පළ කර තිබේ.

කලාපීය සහයෝගිතාව සඳහා වන දකුණු ආසියානු සංගමයේ (සාර්ක්) මහලේකම් ඇසල වීරකෝන් මහතා හමු වූ අවස්ථාවේ බංග්ලාදේශ අගමැති ෂීක් හසීනා මහත්මිය මේ බව ප්‍රකාශකර තිබේ.

කොවිඩ් වසංගත තත්ත්වය සහ රුසියා - යුක්රේන යුද්ධය වාතාවරණ තත්ත්වය හමුවේ මේ වන විට බංග්ලාදේශය වැඩි වශයෙන් වගා කිරීමට පියවර ගෙන තිබෙන බව පෙන්වාදී තිබෙන අගමැතිනිය නියඟයට ඔරොත්තු දෙන සහල් වර්ග මෙන්ම සේලයින් නිෂ්පාදනය සඳහා තම රට පියවර ගෙන තිබෙන බවද සඳහන්කර තිබේ.

මේ අතර සාර්ක් කෘෂිකර්ම මධ්‍යස්ථානය වෙනුවෙන් බංග්ලාදේශය දක්වන දායකත්වය ඇගයීමට ලක් කර තිබෙන සාර්ක් මහලේකම් ඇසල වීරකෝන් මහතා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව අද වන විට ආහාර අර්බුදයකට පැමිණ තිබෙන බවද, එවැනි තත්ත්වයක් තුළ බංග්ලාදේශය දෙන සහයෝගය අගය කරන බවද සඳහන් කර ඇත.

මේ වන විට ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය සියයට 50 කින් පමණ පහත වැටී තිබෙන බව සඳහන් කර තිබෙන ඇසල වීරකෝන් මහතා ඒ අනුව සහල් නිෂ්පාදනය තව දුරටත් ඉහළ නැංවීම වෙනුවෙන් පොහොර අවශ්‍ය වන බවද, කලාපීය රටවල් සහයෝගයෙන් කටයුතු කළ යුතු බවද පෙන්වාදී තිබේ.

# යුද්ධ හමුදාධිපති නාවික හමුදාපති හමු වෙයි



**රක්ෂණ ශ්‍රියන්ත**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 24 වැනි යුද්ධ හමුදාධිපති ලෙස අභිනවයෙන් පත්වූ ලුතිනන් ජෙනරාල් විකුම් ලියනගේ මහතා ඊයේ ( 6) නාවික හමුදා මූලස්ථානයේදී නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා හමු විය.

නාවික හමුදා මූලස්ථානය වෙත පිවිසි අභිනව යුද්ධ හමුදාපතිවරයා, නාවික හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් (පරිපාලන), රියර් අද්මිරාල් ප්‍රසාද් කාරියප්පෙරුම මහතා නාවික හමුදා මූලස්ථානය වෙත උණුසුම් අයුරින් පිළිගැනීමෙන් පසු සම්ප්‍රදායානුකූලව නාවික හමුදා සම්මාන ආචාර මුරයක් මඟින් උත්තමාචාර පිරිනැමීමට කටයුතු කෙරිණි. අනතුරුව, නාවික හමුදාපතිවරයා නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානි ඇතුළු කළමනාකරණ මණ්ඩලය යුද්ධ හමුදාපතිවරයාට හඳුන්වා දුන්නේය.

මෙම නිල හමුව සනිටුහන් කරමින් නාවික හමුදාපතිවරයා සහ යුද්ධ හමුදාපතිවරයා අතර සමරු තිළිණ හුවමාරුවක් ද සිදු කෙරිණි.

# ඩීසල් සැඟ වූ පොහොට්ටුවේ නාගරික මන්ත්‍රීට ඇප

**මිහිර විජේසේකර-මාරවිල සමූහ**

නීති විරෝධී අන්දමින් ඩීසල් තොගයක් අලෙවි කිරීමට සඟවා ගෙන සිටි පුත්තලම නගර සභා මන්ත්‍රීවරයකු රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුදා හැරීමට පුත්තලම වැඩබලන මහේස්ත්‍රාත් සම්සු රාෆි මහතා නියෝග කළේය.

පුත්තලම නගර සභාවේ පොදුජන පෙරමුණ නාගරික මන්ත්‍රී මොහාන් දුමින්ද නැමැති මන්ත්‍රීවරයා මෙසේ රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුදා හැරිණි.

මන්ත්‍රීවරයා පසුගිය දා (3) පුත්තලම මූලස්ථාන පොලිසියේ දූෂණ මර්දන අංශයේ නිලධාරීන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබුණි.

පොලිසියට ලැබුණු තොරතුරක් මත පුත්තලම කොළඹ මාර්ගයේ කලපුව ඉදිරිපිට ඇති මන්ත්‍රීවරයාගේ නිවස පරීක්ෂා කිරීමේදී බැරලයක් තුළ දමා තිබූ ඩීසල් ලීටර් 212ක් හා පෙට්‍රල් ලීටර් කීපයක් හා බැරල්වලින් ඩීසල් ඇදීම සඳහා භාවිතා කරන වයරයක් ද සොයා ගත් බව පොලිසිය පැවසීය.

පොලිසිය පැවසුවේ අදාළ මන්ත්‍රීවරයා පුත්තලම නගර සභාවේ වාහනයකින් මෙම ඩීසල් තොගය පුත්තලම සමුපකාර ඉන්ධන පිරවුම්හලෙන් රැගෙන ඇති බවට උප නගරාධිපති සුසන්ත පුෂ්පකුමාර මහතා පොලිසියට පැමිණිලි කළ බවයි.

එම පැමිණිල්ල ද සැලකිල්ලට ගනිමින් රජයේ දේපොළ අවභාවිතා කරමින් ඉන්ධන ගබඩා කර තිබූ බවත්, ඒවා වැඩි මිලට විකිණීමට සමුපකාර ඉන්ධන තිබූ බවත් පොලිසිය අධිකරණයට කරුණු ඉදිරිපත් කරමින් පැවසීය.

සැකකාර මන්ත්‍රීවරයාට ඇප නියම කළ වැඩබලන මහේස්ත්‍රාත්වරයා ජූලි 28 වැනි දින නැවත අධිකරණයේ පෙනීසිටින ලෙස නියෝග කළේය.

පුත්තලම පොලිසියේ අධිකරණ භාර සැරයන් අසංක මහතා අධිකරණයට කරුණු ඉදිරිපත් කළේය.

# නාවලපිටියට කුඩු බෙදන මහ මොළකරු ඇතුළු සැක 12ක් කොටු වෙති

**අසේල කුරුළුවංශ**

නාවලපිටිය නගරයේ හෙරොයින් සහ ගංජා බෙදාහැරීමේ ප්‍රධානියා ඇතුළු දොළොස් දෙනකු හෙරොයින් මිලි ග්‍රෑම් 2,880ක් හා ගංජා මිලි ග්‍රෑම් 560ක් සමඟ නාවලපිටිය පොලිසිය න් පෙරේදා (5) සැකපිට අත්අඩංගුවට ගෙන ඇත.

නාවලපිටිය හා ගම්පොළ ඇත්ගාල පොලිස් ස්ථානත් ගම්පොළ කොට්ඨාස දූෂණ මර්දන ඒකකයත් එක්ව මෙම මෙම වැටලීම සිදු කර තිබේ. නිලධාරීන් එක්ව මෙහෙයුමක් සිදු කර සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29-45 වයසේ පසුවන අතර ඔවුන් නාවලපිටිය, ඕවිට, ආගරඔය, දොන්සයිඩ් යන ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

මත්ද්‍රව්‍යය බෙදා හැරීමේ ප්‍රධානියා හා එක්ව මත්ද්‍රව්‍යය අලෙවි කිරීමේ නිරත පුද්ලෙයන් සිව් දෙනකු සැකකරුවන් අතර සිටින බවත්, සෙසු පිරිස මත්ද්‍රව්‍ය මිලට ගත් අය බවත් පොලිසිය පැවසීය.

ගම්පොළ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ප්‍රදීප් රත්නායක, සහකාර පොලිස් අධිකාරි කමල් ආරියවංශ, නාවලපිටිය පොලිසියේ වැඩබලන ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක සම්පත් අරියරත්න යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම වැටලීම සිදු කර තිබේ.

ඒරොෆ්ලොට් ගුවන් යානාව සම්බන්ධ සිද්ධිය

# රුසියාව- ශ්‍රී ලංකාව අතර මිතුදම පළුදු කරන්න ඕනෑකමින් කළා දැයි සැකයි

හිටපු ඇමැති ආචාර්ය **සරත් වීරසේකර**

ඒරොෆ්ලොට් ගුවන් යානාව සම්බන්ධ සිද්ධිය සම්බන්ධයෙන් රුසියාව වන්දි ඉල්ලුවා නම් අනිවාර්යයෙන්ම එම වන්දිය දිය යුත්තේ රජය ජනතාවගේ බදු මුදල්වලින් නෙවෙයි මේ ක්‍රියාවට සම්බන්ධ වූ සියලු දෙනාගේ පුද්ගලික වත්කම් වලින් බව හිටපු මහජන ආරක්ෂක අමාත්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී රියර් අද්මිරාල් (විශ්‍රාමික) ආචාර්ය සරත් වීරසේකර මහතා පැවසීය.

ඒරොෆ්ලොට් ගුවන් යානා සම්බන්ධ සිද්ධිය රුසියාව සහ ලංකාව අතර තිබ්බ දීර්ඝ මිත්‍රත්වය පළුදු කිරීමට ඕනෑකමින් කළ වැයමක් දැයි සැක බවද මන්ත්‍රීවරයා කීවේය. රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ රුසියාව අපට ඉතා විශාල වශයෙන් උදව් කරන්න සූදානමින් සිටි රටක්. මේ ගුවන් යානය රඳවා ගැනීම පිළිබඳ වැරදි රැසක් වී තිබෙනවා. අපේ නායකයො කියනවා මේක රටවල් දෙකක් අතර ප්‍රශ්නයක් නෙවෙයි කියා. රට ගැන අංශු මාත්‍රයක්වත් ආදරයක් තියෙන කිසි කෙනෙක් මේ වගේ දෙයක් කරන්නේ නැහැ. අපි 17% ක් තේ අපනයනය කරන්නේ රුසියාවට. ඒ වගේම සංචාරකයො දහස් ගණනක් රුසියාවෙන් ලංකාවට එනවා. අපේ දරුවන් දහස් ගාණනක් රුසියාවේ ඉගෙන ගන්නවා. ඒ වගේම ජිනිවාවලින් අපේ රටට විරුද්ධව එන හැම යෝජනාවකටම අපේ සහායට රුසියාව හිටියා . එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේදී නිශේධ බලය පාවිච්චි කර අපේ සහායට හිටියේ රුසියාව සහ චීනය පමණයි. ඒ නිසා මෙය ඕනෑකමින් දෙරටේ මිත්‍රත්වය පළුදු කර අප රටට ගන්න තිබුණු සහාය නවත්තන්න කළ කූට වැයමක්.

# ආහාර අර්බුදයට මුහුණදීමට සියලු දෙනා කඩිනමින් වගාවට යොමු විය යුතුයි

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්

**සුභාෂිණී සේනානායක**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් එම්.පී.කේ. මායාදුන්නේ ආහාර අර්බුදයට මුහුණදීමට සියලු දෙනා කඩිනමින් වගාවට යොමු විය යුතු බව රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් එම්.පී.කේ මායාදුන්නේ මහතා පැවසීය.

රට මුහුණ දී ඇති මේ අභියෝගය ජය ගත හැකි වන්නේ සියලු දෙනා මහ පොළව සමඟ කටයුතු කළහොත් බව කියා සිටි ඒ මහතා, අපට සරුසාර පොළවක් ඇති හෙයින් ආහාර අභියෝගය ජය ගැනීම අසීරු නොවන බවද කියා සිටියේය.

සියලු රාජ්‍ය නිලධාරීන් හමුවේ රට මුහුණ පා ඇති තත්ත්වය පැහැදිලි කර එම අභියෝගවලට මුහුණ දීමට ගත යුතු හා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඔවුන් දැනුම්වත් කළ බවත් ආහාර නිෂ්පාදනය වැඩි කරගැනීමට ක්‍රමවේදයක් ඇති කරගත යුතු බවත් ලේකම්වරයා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

# අළුබෝමුල්ල ප්‍රදේශයේ දී බොල්ගොඩ ගං ඉවුරේ තිබී මළ සිරුරක් හමු වෙයි

**හල්තොට සමූහ**
**විනිතා මානෙල් ගමගේ**

බණ්ඩාරගම, අළුබෝමුල්ල ප්‍රදේශයේ බොල්ගොඩ ගඟේ ඉවුරේ තිබී පුද්ගලයකුගේ මළ සිරුරක් පෙරේදා (5) සවස සොයා ගත් බව අළුබෝමුල්ල පොලිසිය පැවසීය.

සවස පහට පමණ පොලිසියට ලැබුණු තොරතුරකට අනුව මැදගම ගඟ පාරේ ලැඟුම්හලක් ආසන්නයේ බොල්ගොඩ ගඟ ඉවුරේ සම්පූර්ණයෙන්ම නිරුවත්ව තිබූ මෙම මළ සිරුර සොයා ගෙන ඇති අතර, මෙම මළ සිරුරේ වම් අත සහ දකුණු පාදය මුලින් ඉවත්ව තිබූ බව පොලිසිය පවසයි. එසේම මෙම පුද්ගලයාගේ මුහුණ විකෘති වී තිබූ අතර හිසෙහි හා පපුවේ තුවාල කීපයක් තිබුණු බවද පොලිසිය වැඩිදුරටත් පැවසීය.

පානදුර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන්ත වෙදගේ මහතාගේ උපදෙස් පරිදි සහකාර පොලිස් අධිකාරි 2 නිරෝෂ් ධර්මසේන මහතාගේ මග පෙන්වීමෙන් විමර්ශන කටයුතු ආරම්භ කෙරිණි.

මෙම ස්ථානයට පානදුර හදිසි මරණ පරීක්ෂක අදිකාරම් මහතා පැමිණි අතර පානදුර ප්‍රධාන මහේස්ත්‍රාත් ජයරුවන් දිසානායක මහතා මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කළේය.

# රන්මාල කඩන්න යතුරු පැදියක් සොරතම් කළ සැකකරු කුඩුත් සමඟ කොටු වෙයි

**රක්ෂණ ශ්‍රියන්ත**

රන්මාල කොල්ලකෑම් රැසකට අවශ්‍ය කර සිටි සැකරුවකු හෙරොයින් ග්‍රෑම් 5 මිලි ග්‍රෑම් 200ක් සන්තකයේ තබාගෙන යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදී මත්තෙගොඩ පොලිස් වසමේ කිරිගම්පමුණුව ප්‍රදේශයේදී පෙරේදා (5) මත්තේගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් පිරිසක් අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගෙන ඇති සැකකරු වයස අවුරුදු 34ක් වන පෝරුවදණ්ඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෙම සැකකරු ගමන් කරමින් සිටි යතුරුපැදිය කුරුවිට පොලිස් වසමේදී සොරා ගත් යතුරුපැදියක් බව පොලිස් විමර්ශනවලදී අනාවරණය වී ඇත. සැකකරු කොට්ටාව, පාදුක්ක සහ තලංගම පොලිස් වසම්වලදී රන්මාල කොල්ලකෑමට සොරාගත් යතුරුපැදිය භාවිතා කර ඇති බව අනාවරණය වී තිබේ. සැකකරු කොල්ල කෑ රන් භාණ්ඩ කොටසක් ද පොලිසිය සොයා ගෙන තිබේ.

සැකකරු ඊයේ (6) හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. මත්තේගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.




ශ්‍රීකාන්තගේ ප්‍රිදූපත






දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2022 ජුනි 07 අඟහරුවාදා

# අධිවේගයේ නාටකය

අධිවේගයේ නාටකය කියූ සැණෙන් රටේ ලොකු කුඩා කවුරුත් දන්නා සිද්ධියක් අපගේ සිහියට නැඟෙයි. එක අතෙකින් බලන විට එය රට පුරා ප්‍රචලිත විය යුතු දෙයක් නොවේ. තව අතෙකින් බලන විට එහි බරපතළ තත්ත්වයක් ද තිබේ. කුමක් වුව සමාජමාධ්‍ය අදාළ සිද්ධියට තටු ලබා දුන් අතර පසුව එය ප්‍රධාන ජනමාධ්‍යවලට ද කටගැස්මක් විය. අද වන විට එය ජාතික සංවාදයකට අවශ්‍ය පදනම සකස් කර තිබේ. දේශපාලකයා හා පොලිස් නිලධරයා අතර ගැටුමක් හැටියට එය හැඳින්විය හැකිය. පුද්ගලයන් දෙදෙනාට ම යම් බලයක් තිබේ. ගැටලුව ඇත්තේ ඔවුන් ස්වකීය බලය භාවිත කරන ආකාරය තුළය.

සියල්ලන්ම සිද්ධියට අදාළ ජවනිකා නරඹා ඇතැ'යි සිතන බැවින් එය නැවත නැවත කතාන්දරයක් ලෙස හුවා දක්වන්ට වුවමනාවක් නැත. එහෙත් ආරම්භයක් හැටියට නාටකයේ මුල් ජවනිකාව පමණක් නැවත සිහි කරන්නට කැමැත්තෙමු. දේශපාලකයකුගේ පුත්‍රයෙක් කැබ් රථයක අනාරක්ෂිත ලෙස ශීතකරණයක් පටවාගෙන අධිවේගී මාර්ගයේ ගමන් කරයි. පොලිස් මුරපොළක දී රථය නවත්වන අතර තවදුරටත් ඉදිරියට ගමන් කිරීමට අවසර දිය නොහැකි බව එහි සිටි පොලිස් නිලධාරීහු කියති. එතැන් සිට බහින් බස්වීමක් සිදුවන අතර චූදිත පුද්ගලයාගේ බිරිය ද ගැටුමට සම්බන්ධ වෙයි. එතැන් සිට දේශපාලකයාගේ පුත්‍රයා තම බලය පෙන්වන අතර පොලිස් නිලධාරීහු තම බලය පෙන්වති.

සිද්ධි නිරීක්ෂණය කරන පිරිසක් දේශපාලකයන්ට හා ඔවුන්ගේ හත්මුතු පරම්පරාවට ම බැණ වදිති. තව පිරිසක් පොලිස් දෙපාර්තමේන්තුවට බැණ වදිති. සිද්ධිය දෙස මධ්‍යස්ථ ඇසකින් බලන කෙනකු නැති ගණනය. මේ කාලය වනාහී ජනතාව නීතිය අතට ගැනීමට උත්සාහ දරන පීඩිත කාලපරිච්ඡේදයකි. විශාල පිරිසකට දේශපාලකයන් පෙනෙන්නට බැරි තත්ත්වයක් පවතී. තව අතෙකින් පොලිසිය කෙරෙහි ද අමනාපයක් ජනතාව තුළ තිබේ. පොලිසියට කැමැති අය දේශපාලකයන් වැරැදිකාරයන් කිරීමට උත්සුක වෙති. පොලිසියට අකැමැති අය දේශපාලකයන් නිවැරැදි කිරීමට උත්සුක වෙති. නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නම් පාර්ශ්ව දෙකම නීතිය හමුවේ එක සමානය. පාර්ශ්ව දෙකෙහිම වැරැදි ඇතොත් ඒවාට දඬුවම් හිමි විය යුතුය.

අප සතු තොරතුරුවලට අනුව දේශපාලකයාගේ පුත්‍රයා වැදගත් පුරවැසියකු ලෙස හැසිරෙන්නේ නැත. එම පුත්‍රයා ද නගරාධිපති තනතුරක් දරා ඇති බැවින් ඔහු වඩාත් ආදර්ශවත් ලෙස හැසිරෙන්නට ද නීතියට අවනතව ක්‍රියා කරන්නට ද උගත යුතුය. එවැන්නක් සිදු වී නැත. චූදිතයාගේ බිරිය නීතිගරුක නැති වා පමණක් නොව; අපේ ශිෂ්ටාචාරය තුළ ස්ත්‍රියකට හිමි ප්‍රතිරූපය ද විනාශ කරන තැනට කටයුතු කරයි. පොදු ව්‍යවහාරයෙන් ගතහොත් ඇයගේ හැසිරීම අන්තිමය. නැවත පොලිස් නිලධාරීන් දෙසට අවධානය යොමු කළහොත් එම නිලධාරීන් ද සිය වෘත්තියේ ගෞරවය ආරක්ෂා වන අයුරින් ක්‍රියා කරන්නේ නැත. ඔවුන්ගේ කතා විලාසය පවා අශීලාචාරය. බලාගෙන යන විට අදාළ සිද්ධිය ඔඩු දුවන්නට ඇත්තේ සමාජයේ පවත්නා පොදු දුර්වලතා පාදක කරගෙනය.

සිද්ධිය තාර්කික විග්‍රහයකට ලක් කළහොත් මහා මාර්ගය නීති විරෝධී ලෙස භාවිත කරන කෙනකුට උපදේශන සැපයීමට, ඔහු අත්අඩංගුවට ගැනීමට හා අවශ්‍ය නම් අවම බලය පාවිච්චි කිරීමටත් පොලිස් නිලධරයාට නීති ප්‍රතිපාදන සපයා ඇත. දේශපාලකයා නීතිය ඉදිරියේ කිසිදු ආකාරයකින් විශේෂ පුද්ගලයකු නොවන අතර ඔහු නීතියට අවනත විය යුතුය. පොලිස් නිලධාරීන්ට ඇහුම්කන් දිය යුතුය. නීතිය ක්‍රියාත්මක කිරීමට සහාය දැක්විය යුතුය. මෙහිදී චූදිතයාට තර්ජනය කිරීමට, හෝ පහරදීමට හෝ අයිතියක් පොලිස් නිලධරයාට නැත. දඩබ්බරකම් කරන චූදිතයකුට පහර නොදී ඔහු අඩපණ කොට අත්අඩංගුවට ගත හැකි උපායමාර්ග පොලිස් අභ්‍යාස විද්‍යාලයයේ දී උගන්වයි. පොලිසිය ඒවා භාවිත කළ යුතු අතර මැරයන් සේ ක්‍රියා නොකළ යුතුය. දෙපාර්ශ්වය ම තම තමන්ගේ නිදහසට කරුණු කියන බව පෙනෙයි. දේශපාලකයන්ගේ පාර්ශ්වය කියන හැටියට පොලිස් නිලධාරීන් චූදිතයාගේ කමිස කොලරයෙන් අල්ලා ඔහුට පහර දී ඇත. පොලිස් නිලධාරීන් කියන හැටියට එවැන්නක් සිදු වී නැති අතර චූදිතයා රාජකාරියට බාධා කර ඇත. මෙහි ඇත්ත නැත්ත සොයා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුය. දැන් එවැන්නක් සිදුවෙයි. සිද්ධියෙන් පසු චූදිතයා හා ඔහුගේ බිරිය සැඟව සිටි බවක් ද වාර්තා වී ඇත. චූදිතයන්ට සැඟවීම සඳහා පහසුකම් සැපයූ කෙනකු ද අත්අඩංගුවට ගෙන ඇත. චූදිත යුවළ නීතිය හමුවට දිරිපත් කරන බව චූදිතයාගේ පියා පවසයි. මේ සෑම පුද්ගලයකුටම ගෞරවනීය ලෙස අදාළ ගැටුම සමථයකට පත් කර ගැනීමේ අවස්ථාව තිබේ. දැන් සියල්ලන්ම ඒ වෙත යොමු විය යුත්තේ පරණ කුණු ඉවත දමමින්ය.

මේ සිද්ධියෙන් උගත යුතු පාඩම් කිහිපයක් තිබේ. එක; දේශපාලකයන් තම උඩගුකම පසෙකලා සැබෑ මහජන නියෝජිතයන් සේ නීතිගරුකව කටයුතු කිරීමට උගත යුතුය. දෙක; පොලිස් නිලධාරීන් ද තම සීමාවන් දැනගෙන නීතිය ක්‍රියාත්මක කළ යුතු බවය. තුන සමාජ මාධ්‍ය වගකීමකින් යුතුව තම කාර්යභාරය ඉටු කළ යුතු බවය. එවිට ලස්සන රටක් අපට හිමිවනු ඇත.

# සුරක්ෂිත ආහාර වේලක් වෙනුවෙන්
# හෙට දිනයේ බලාපොරොත්තුව



මහාචාර්ය
ඉරේෂා මෙන්ඩිස්
ආහාර විද්‍යා හා
තාක්ෂණ
දෙපාර්තමේන්තුව
කෘෂිකර්ම පීඨය
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය

(සෑම වසරකම ජුනි මස 07 වැනිදාට ලෝක ආහාර සුරක්ෂිතතා දිනය යෙදේ. 2022 වසරේ තේමාව “නීරෝගී දිවියක් සඳහා ආරක්ෂිත ආහාර” යන්නයි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.)



ශ්‍රී ලංකාවට පමණක් නොව මුළු ලෝකයටම ආහාර සුරක්ෂිතතාව හමුවේ ආහාරවල ආරකෂාව අභියෝගයක් බවට පත්ව තිබේ. ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදයට සමගාමීව ඉදිරියේ දී ඇති විය හැකි ආහාර හිඟය හමුවේ ආහාර සුරක්ෂිතතාව පිළිබඳව වැඩි කතිකාවක් ගොඩ නැඟී තිබේ. සියලු දෙනාම තර්ක විතර්ක ඉදිරිපත් කරමින් පවසන්නේවැඩි වැඩියෙන් ආහාර නිෂ්පාදනය කර සුරක්ෂිතව තබා ගැනීම පිළිබඳවයි. නමුත්, ආහාර සුරක්ෂිත කිරීමට පමණක් උත්සුක වුවහොත් ආහාර වල ආරක්ෂාව හීන විම, ගිළිහියාම, නොසළකා හැරිම නිසා තවත් ජාතික අර්බුදයක් සිදු විමට ඇති ඉඩ ප්‍රස්ථාව වැඩිය. එවැනි තත්ත්වයක් තුළ ආහාර පරිභෝජනය කරන රටේ ජනතාව අත් වන ඉරණම කුමක්ද යන්න පිළිබඳව ආහාර සුරක්ෂිතා දිනය නිමිත්තෙන් අපි වැඩියෙන් අවධානය යොමු කළ යුතුව ඇත.

## ■ ආහාරවල ආරක්ෂිත බව

ආහාර සුරක්ෂිතාව යනු පෝෂණය පමණක් නොවේ. එනම් ආහාර සුරක්ෂිතාව වඩාත් පුළුල් ලෙස අර්ථ දක්වන්නේ නම් සෑම පුද්ගලයකුටම අවශ්‍ය සෑම අවස්ථාවකදීම අවශ්‍ය ප්‍රමාණයට ආරක්ෂිත හා පෝෂණ ගුණයෙන් යුත් ආහාර ලබා ගැනීමට ඇති හැකියාව යන්නයි. තවද වැඩි වැඩියෙන් වගා කිරීම, වැඩි වැඩියෙන් ආහාර නිෂ්පාදනය තුළින් ආහාර සුලභ වීමෙන් පමණක් ආහාර සුරක්ෂිතවීම සිදු නොවන අතර රටේ ජනතාවට ඒවා පහසුවෙන් ලබා ගැනීමට ඇති හැකියාව ද මෙහිලා වඩාත් අවධාරණය විය යුතු කාරණයකි. එනම් ඉල්ලුමට සරිලන ලෙස ආහාර නිපදවිම මෙන්ම ඒවා සැකසුම්කරණය, බෙදාහැරීම වඩාත් විධිමත්ව විය යුතු අතර ඊට සමගාමීව ආහාරවල ආරක්ෂිත බව උපරිමයෙන් තහවුරු විය යුතුය.

ශ්‍රී ලංකාවේ වත්මන් තත්ත්වය තුළ ආහාර නිෂ්පාදනය මෙන්ම ඊට අදාළ චක්‍රිය ක්‍රියාවලියම යම් ආකාරයක බිඳ වැටිමක් සිදු වී ඇත. එක් අතෙකිනකෘෂිකර්මාන්තය ද ඇල් මැරුණු ස්වභාවයක් ගෙන ඇත. එමෙන්ම බෙදා හැරිම, සැකසුම්කරණයට ඉන්ධන හිඟය සහ විදුලි බලය බාධාවක්ව ඇත. එම හේතු නිසා ආහාරවල මිල ඉහළ ගොස් ඇත. නමුත්, මේ තත්ත්වය සුබදායි දිශාවකට අවතීර්ණ කිරිමේ ජාතක වගකීම අප සියලු දෙනා සතුය. අභියෝගවල විකල්ප විසැඳුම් ජනනය කරමින් ආහාරවල සුරක්ෂිතාව සහ ආරක්ෂිත බව රැක ගැනීම කළ යුතුව ඇත.

ජුනි 07 වැනි දිනට යෙදෙන ආහාර සුරක්ෂිතා දිනයේ මූලික තේමාව නීරෝගි දිවියක් සඳහා ආහාරවල ආරක්ෂාව යන්නයි. මෙම තේමාව සෙසු රටවලටත් වඩා වත්මන් තත්ත්වය තුළ අපිට මනාව පැහෙනු ඇත. එනම් මතුවට එන ආහාර සුලභ නොවිමේ ගැටළුව හමුවේ පාරිභෝගිකයාට ආරක්ෂාකාරි නොවන ආහාර ලැබීමට ඇති ඉඩ කඩ නිසයි. එනම් රෝගි කාරක, රෝගවලට තුඩු දෙන ආහාර යන්නයි. මෙය භෞතිකමය, ජෛවමය වශයෙන් ආසාත්මිකතා ඇති කරන බෝවන රෝගවලට මුල පාදන, බෝනොවන රෝග ඇති කරවන ආහාර වෙළෙඳපොළට පැමිණිමට ඇති හැකියාව ඉතාමත් වැඩිය. කෙසේ වෙතත් මේ කාරණය සම්බන්ධයෙන් රජයත් වගකිව යුතු සියලු පාර්ශ්වයන් සියලු දෙනාත් අවධානය යොමු කරන්නේ නම් බරපතළ සෞඛ්‍ය ප්‍රශ්න මතු නොකරන යහපත් මට්ටමකට පත් කර ගැනිමට පුළුවන.

## ■ සත්ත්ව පාලනය සහ භෝග නිෂ්පාදනය

කෙසේ වෙතත් පසු ගිය කාල වකවාණුව තුළ වඩාත් ආන්දෝලනාත්මක මාතෘකාව බවට පත් වූයේ රසායනික පොහොර, කෘමිනාශක භාවිතය තහනම සහ පූර්ණ කාබනික වගාවක් සඳහා රට අවතීරණ කරවිමයි. කාබනික වගාව ලොව පිළිගත් ඉතා උසස් තත්ත්වයේ ක්‍රමයක් වුවත් කාබනික වගාවෙන් ලොව ජයගත් රටවල් අනුගමනය කළ විධික්‍රම අප විසින් නොසළකා හැරීම හා අධ්‍යයනය නොකිරීම නිසා මේ සංකල්පය වැරැදි දිශානතියකට අවතීරණ වු බව අපගේ හැඟිමයි. රසායනික පොහොර භාවිතය හා කෘමි නාශක නිසා රට තුළ සෞඛ්‍යමය වශයෙන් නිදන් ගත රෝග සහ පාරිසරික ගැටලු ද රැසක් මතු වු බව රහසක් නොවේ. නමුත් එසේ සිදු වුයේ නමුදු සියයට සියයක් රසායනික භාවිතයෙන් ඉවත් විම ඊට ආදේශ කළ යුතු හොඳම විකල්ප ලෙස හුවා දැක්වීම සපුරා වැරැදි අර්ථ ගැන්වීමක් බව නොවළහා කිව යුතුය. ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුළ අන්තර්ගත වූ විශිෂ්ට අදහසකට හරි දැනුමකින් තොර පිරිසක් ලබා දුන් වැරැදි උපදෙසක් නිසා එය වැරැදි මාර්ගයකට අවතීර්ණ වූ බව අපි සඳහන් කරමු. මේ නිසා ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය ක්ෂණයකින් කඩා වැටීම සිදු විය. සිදු කළ යුතුව තිබුණේ මේ තීරණය නොව සත්ත්ව පාලනය සහ භෝග නිෂ්පාදනයට රසායනික පොහොර භාවිතයේ දී ප්‍රජාව විසින් සිදු කරන ලද වැරැදි ක්‍රමෝපායන් වහා වහා නිවැරැදි කිරීමය. එය නීතිමය මාර්ගයෙන් හෝ කුමන ක්‍රමවේදයක් යටතේ වුව සිදු කළේ නම් රට තුළ මතු වුණු ආහාර අර්බුදය සිදු නොවන්නට තිබිණි. මෙය වඩාත් සරලව පැහැදිලි කරන්නේ නම්, කෘෂිකර්මාන්තයේදී රසායනික තෙල් පොහොර යෙදිය යුතු නියමිත ප්‍රමාණය, ක්‍රමානුකූල භාවිතය, යෙදිය යුතු කාලවකවාණුව, තෙල් පොහොර යෙදිමෙන් පසු අස්වනු නෙළිය යුතු කාලය පිළිබඳ ගොවි ජනතාව අලුත් දැනුමකින් සන්නද්ධ කළේ නම් මීට වඩා යහපත් ප්‍රතිඵලයක් ළඟා කර ගැනීමට හැකියාව තිබිණි. මෙය නිවැරැදි කෘෂි පිළිවෙත් ලෙස අපි අර්ථ දක්වමු.

කෙසේ වෙතත් පසුගිය සමයේ රටේ ධාන්‍යාගාරය සඳහා ලැබිය යුතු ආහාර සංචිතය නොලැබිම ඉදිරියේ දී ඇති විය හැකි ආහාර අර්බුදයට එය යම් අහිතකර රුකුලක් වනු ඇත. නමුත් සිදු වූ වරද නිවැරැදි කරන බවට ජනාධිපතිතුමා ජනතාවට දුන් පොරොන්දුවත් සමඟ මෙවර යල කන්නය සඳහා ඉන්දීය ආධාර යටතේ රසායනික පොහොර ගොවීනට ලැබෙනු ඇත. මේ පණිවුඩය ගොවින්ට අස්වැසිල්ලක් වුවත් සංයමයකින් යුතුව නිවැරැදි කෘෂි පිළිවෙත් අනුව භාවිතය ගොවි ජනතාව ට පැවරි ඇති බරපතළ වගකිමක් බව අපි දැඩිව අවධාරණය කරමු. මෙය තවදුරටත් පැහදිළි කරන්නේ නම් රජය සද්භාවයෙන් කෘෂිකර්මාන්තය නැංවීම සඳහා ලබා දුන් පොහොර සහනාධාරය ඇතැම් ගොවින් අවභාවිත කිරීම නිසා සිදු වු හානිය සුළුවෙන් නොතකා කටයුතු කළ යුතුය යන්නයි. තවද එදා තෙල් පොහොරවලින් ගොවි බිම් නහවන ලද මුත් මෙදා එසේ කිරීමට හැකියාවක් නැත. ඉන්දියාවෙන් අපට ලැබෙන්නේ ඉතා සීමිත පොහොර ප්‍රමාණයකි. එය වගාවට යෙදිය යුත්තේ ඉතා සකසුරුවමිනි. මේ තත්ත්වය අප දකින්නේ අඳුරු වළාවක් අතරින් රිදි රේඛාවක් මතු විමක් වැනි බවයි. එනම් අපේම යහපතට සිදු වුවක් බවයි.

මේ තත්ත්වය මෙසේ තිබියදී ඉදිරියේ දි මෙරට ගොවි ප්‍රජාව යම් ප්‍රමාණයකට හෝ රටේ ආහාර ගබඩා ශක්තිමත් කිරීමට කටයුතු කරනු ඇත. එය ප්‍රමාණවත් නොවීමට පුළුවන. නමුත් ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ආහාරවල ආරක්ෂාව පිළිබඳ වගකීමෙන් මිදීමට කිසිදු අයිතියක් කිසිවකුට නැත. ආහාර හිඟයත් සමඟ ලැබෙන සුළු ප්‍රමාණය හෝ වසවිසෙන් තොර නම්, කෘත්‍රිම විස සහිත රසකාරකාදියෙන් තොර නම් ජනතාව රෝගී විමේ අවධානම අඩු වනු ඇත. ප්‍රමාණවත් ආහාර නොලැබීමෙන් පෝෂණ ඌනතා ඇති වීම නොවැළැක්විය හැකිය. ජනතාවගේ ප්‍රතිශක්තිකරණය අඩු වනු ඇත. රෝග ඇති වුවද ඖෂධ හිඟයක් රට තුළ ඇත. මේ නිසා ජනතාව අතට පත් වන ආහාර ප්‍රමාණයෙන් ස්වල්ප වුවද එය සියයට සියයක් ආරක්ෂිත ආහාර නම් යම් සහනයක් අපට ළඟා කර ගත හැකිය.

## ■ වෙළෙඳ සංස්කෘතිය

වර්තමානයේ ජනතාවගේ පරිභෝජනය සඳහා වෙළෙපොළට නන් දෙසින් එන සෑම ආහාරයකම පාහේ ආරක්ෂිත බව පිළිබඳ යම් යම් ගැටළු පවතී. මුදල් ඉපයීම සඳහා පමණක් ඉලක්කය කර ගත් වෙළෙඳ සංස්කෘතියක් තුළ මේ තත්ත්වය නිර්මාණය වී තිබේ. එමෙන්ම මේ ප්‍රශ්නය අපට පමණක් නොව අද වන විට මුළු ලෝකයම මුහුණ පා ඇති ප්‍රශ්නයකි. එනම් ආහාරවල ආරක්ෂිත බව බිඳ වැටීමෙන් මුළු ලෝකයම පිඩාවට පත් ව සිටී. ලෝක සෞඛ්‍ය සංවිධානය සිය වාර්තා අනුව පෙන්වා දෙන්නේ ලෝක ජන ගහනයෙන් 1/10 ක් ආරක්ෂිත නොවන ආහාර නිසා ඇති වන රෝගවලට ගොදුරු වී ඇති බවයි.


ආහාර සුලභ වීම තුළ පාරිභෝගිකයාට ආරක්ෂාකාරි නොවන ආහාර පරිභෝජනයෙන් මිදී ආරක්ෂාකාරි ආහාර තෝරා ගැනීමට යම් හැකියාවක් පවතී. නමුත් ආහාර සිමිත නම් එවැනි තෝරා ගැනීමක් සිදු නොවන අතර කුසගින්න නිවා ගැනීම සඳහා ලැබෙන ඕනෑම දෙයක් කුසට දමා ගැනීමට සිදු වනු ඇත. කෙසේ වෙතත් ආහාර නිසා ඇතිවන රෝග අතර අපි වැඩි වශයෙන් කතා කරන්නේ පාචනය වැනි බැක්ටීරියා දිලීර සහ ක්ෂුද්‍ර ජීවින් නිසා ඇති වන කෙටිකාලීන රෝගයි. නමුත් ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ සිට සැකසුම්කරණය ගබඩාකරණය සහ ප්‍රවාහනය යන චක්‍රය තුළ දී ආහාරවලට එකතුවන සහ එකතු කරන මිනිස් ශරීරයට හිතකර නොවන වස විස මෙතෙකැයි කිව නොහේ. මෙහිදි දේශගුණය , කාලගුණය වැනි පරිසර තත්ත්ව , උෂ්ණත්වය ඉහළ යාම වැනි සාධක ද ලෙඩ රෝග ඇති කරන ක්ෂුද්‍ර ජීවින්ගේ වර්ධනය ට බලපායි. අපි ආහාරයට ගන්නා බෝගවලට ක්ෂේත්‍ර යේදී ම දිලිර ආශ්‍රිත රෝග වැඩිමනත් හට ගන්නේ පාරිසරික බලපෑම් නිසාය. එම දිලීර මගින් සෑදෙන ජලක මගින් මිනිස් ශරීරය ලෙඩ කරවයි. ඇෆලටොක්සින් එවැනි බහුලව හට ගන්නා දිලීරයකි. තවද උෂ්ණත්වය යන සාධකයේ දී පසේ අඩංගු බැර ලෝහ බෝගවලට උරා ගැනීමේ සක්‍යතාව ඉහළ උෂ්ණත්වයේ දී වැඩි ය. මේ සියල්ල ඉදිරියේ දී මුහුණ පෑමට තිබෙන ආහාර අර්බුදයත් සමඟ අප හමුවේ පවතින තවත් අභියෝගයකි. මොන යම් හේතුකාරකයක් නිසා හෝ මිනිසා ලෙඩ කරවන කෙටි කාලින මෙන්ම දිගු කාලීන රෝග ද අප්‍රමාණය. මෙවැනි පරිසරයක් තුළ සහ ඉදිරියේ දී ඇති වන ආහාර අර්බුදය හමුවේ අප විසින් සිතිය යුතු පැති බොහෝය.

## ■ ආචාර ධර්ම සහිත කෘෂි කාර්මික මග

ආහාර සුරක්ෂිතතාව සහ ආරක්ෂාව යන කාරණය බරපතළ අභියෝගයක් නොවන තැනට රට මෙහෙයවාලීම සඳහා වඩාත් විධිමත් සහ කාර්යක්ෂම යාන්ත්‍රණයක් වහා කඩිනමින්ම ජනතාව අතට පත් කළ යුතුව ඇත. ආහාර සුරක්ෂිතාව සහ ආරක්ෂාව එකිනෙක පෑහි ඇති එකම කාසියේ දෙපැත්ත වැනිය. මෙහිදි වඩාත් සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගත හැකි ක්‍රමය ලෙස අපි පෙන්වා දෙන්නේ ගෙවතු වගාව කේන්ද්‍ර කර ගත් වගා සංග්‍රාමයකි. තමන්ට තිබෙන භූමියේ තම පවුලේ පරිභෝජනය සඳහා මොනයම් හෝ ආහාර බෝගයක් වගා කරන්නේ නම් එය අපේ අභියෝගාත්මක ගමනට අත්වැළක් වනු ඇත. විශේෂයෙන් ආහාර අර්බුදයක දී නාගරික ප්‍රජාවට ඇති එකම විසැඳුම සුළු ඉඩකඩක වුව පුංචි ගෙවත්තක් නඩත්තු කිරිමයි. අපි වෙනදා විසිතුරු මල් පැළයක් රෝපණය කළ පෝච්චිය මිරිස් පැළයක් බටු පැළයක් සිටුවිම දක්වා පරිවර්තනය විය යුතුය. එසේ නොවුවහොත් අර්බුදයේ ස්වභාවය අපි නොසිතන දිශාවක් කරා ඇදි යනු ඇත.

ඉන් නොනැවතී වානිජ වගාව ද වහ වහා විධිමත් කළ යුතුය. මේ කාරණයට අධීක්ෂණය, මනා කෘෂි කාර්මික පිළිවෙත් ගැන සමාජය මෙහෙය විය යුතුය. මක් නිසා ද ගෙවත්තක තමන් පරිභෝජනය කරන ගහට, වැළට වස විස එකතු කර නොගත්තද වානිජ වගාවේ දී මෙම ආචාරධර්ම සපුරා බිඳ වැටෙනු ඇත. අප හමුවේ ඇති අභියෝගය ආහාරවල ආරකෂාව බිඳ වැටීමෙන් ආහාර අර්බුදයත් සමඟ මුළු රටම ලෙඩ කරවන රෝග රැල්ලක් ද ඇති වීමට තිබෙන ඉඩ අසුරාලීම නම්, ආහාර චක්‍රයේ සිටින නිෂ්පාදකයාගේ සිට සියලු පාර්ශ්වයන් ආචාර ධර්ම සහිත කෘෂි කාර්මික මඟකට ප්‍රවේශ කළ යුතුය. මේ සඳහා ගොවියාට, නිෂ්පාදකයාට සැකසුම්කරුවාට උපදෙස් හා මග පෙන්වීම ලබා දෙන වගකිවයුත්තන්ට විශාල ජාතික වගකීමක් පැවරි ඇත.

ආහාරවල ප්‍රමාණාත්මක බව තවදුරටත් අභියෝගයක් වන්නේ ආහාර නාස්තිය සහ අපතේ යාම වැඩිවුවහොත්ය. එම නිසා පසු අස්වනු තාක්ෂණය ද අප වැඩියෙන් අවධානය යොමු කළ යුතු කාරණයකි. එමෙන්ම බෝග විවිධාංගීකරණය ද හොඳ ක්‍රමෝපායකි. මෙවැනි වඩාත් විධිමත් යාන්ත්‍රණයක් ඔස්සේ ඉදිරියට කෘෂිකර්මාන්තය මෙහෙය වන්නේ නම් රට ගොඩ ගත හැකි එකම මාර්ගය ද එය වන බැව් අපි අවධාරණය කරමු. ආහාර අර්බුදයක් මිස එය දරුණු සාගතයක් නොවන තැනට රට නිවැරැදි මඟට ගැනීම මේ මොහොතේ අප සියලු දෙනාට පැවරී ඇති ජාතික වගකීමයි.




සකුන්තලා ජයසිංහ



# මේ මොහොතේ තරුණයන්ට විශාල වගකීමක් තිබෙනවා

## කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන්

**ස**මාජ, ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සෞඛ්‍ය මේ ආදී වූ සෑම පැතිකඩක් ඔස්සේම ශ්‍රී ලංකාව මේ වන විට දරුණු අර්බුදයකට මුහුණ පා සිටින බව නොරහසකි. එක් පැත්තකින් ඩොලර් හිඟය. තවත් අතෙකින් ගෑස්, තෙල් පෝලිම් ය. බඩු මිල අහස උසට ය. ජනතාවගේ ආදායම් මාර්ග අහිමි වෙමින් පවතී. පීඩාවට පත් ඇතැම් පිරිස් පීඩිතයින්වම පෙළමින් සිටී. ජන ජීවිතය දුක්ඛිතය. ආදරයේ අරගලය තවත් අතෙකය. මේ අර්බුදය හමුවේ යළි නැඟී සිටීමට නම්, සමාජයේ සෑම ජන කොට්ඨාසයකටම වෙන්වූ වගකීම් පැහැදිලිව හඳුනාගත යුතුය. ඒ අතර තරුණ ප්‍රජාව විශේෂ වන්නේ ඔවුන් රටේ ජවය හා ජීවය වන බැවිනි. අර්බුදය හමුවේ තරුණයන්ගේ වගකීම පිළිබඳව මේ දිගහැරෙන සාකච්ඡාව කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ඉරේෂා ලක්ෂ්මන් සමඟිනි.

**● රට හමුවේ මේ වන විට ඇති අර්බුදයේ බරපතළ බව පිළිබඳ ඔබේ අදහස කුමක්ද ?**

සමාජයේ කුමන පැතිකඩකින් බැලුවත් රට තුළ අර්බුදයක් පවතින බව පැහැදිලියි. ආර්ථික, දේශපාලනික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික ආදී වශයෙන් මේ හැම ක්ෂේත්‍රයක් තුළම නිදහසින් පසු ශ්‍රී ලංකාවේ නිසි නායකත්වයක් නැති වීම, නිසි කළමනාකරණයක් නැති වීම යන කාරණා උඩ අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ ගොඩනැගුණු අර්බුදයක් අද වන විට වර්ධනය වී තිබෙනවා. මෙය මහා භයානක තත්ත්වයක්. විශේෂයෙන්ම අපේ තරුණ පරම්පරාව, ළමා පරපුර කොවිඩ් සමයේ මුහුණ දුන්නේ පුදුමාකාර ආතතියකට. කොවිඩ් අවසන් වෙලා ජන ජීවිතය යථා තත්ත්වයට පත්වෙයි කියලා බලාපොරොත්තු වෙනකොට අලුත්ම ප්‍රශ්න ගොඩකට තමයි ඒ අයට මුහුණ දෙන්න වෙලා තියෙන්නෙ. මේ වන විට රටේ විවිධාකාරයේ භයංකර පුරෝකථන තිබෙනවා. අගෝස්තු මාසයේ කන්න නැති වෙනවා කියනවා. අධ්‍යාපනයට මොනව වෙයිද කියලා අහනවා. නොමිලේ ලබා දෙන සෞඛ්‍ය සේවයට මොනවා හරි වෙයිද කියලා හිතෙනවා. අවිනිශ්චිතාවන් ගණනාවක් මැදයි අද අපි කාටත් ජීවත් වෙන්න සිද්ධ වෙලා තියෙන්නෙ.

**● මේ අර්බුදය හමුවේ රට ගොඩගැනීමට රටේ තරුණ ප්‍රජාවට කළ හැක්කේ කුමක්ද ?**

පවතින ප්‍රධාන ප්‍රවාහයේ දේශපාලන රාමුව තුළ දශක ගාණක් පුරා තරුණයන්ට දීපු පොරොන්දු දිගින් දිගට ම කඩ වෙලා තියෙනවා. මේ පොරොන්දු කඩවීම හමුවේ ඒ අයට ඔවුන්ගේ අනාගතය ගැන ධනාත්මක විදිහට බලන්න අවශ්‍ය පසුබිමක් සැකසිලා නෑ. මේ සන්දර්භය තුළ ඉතා ම දරුණු ඉච්ඡා භංගත්වයකට, අසරණ භාවයකට, වික්ෂිප්ත ස්වභාවයකට මෙන් ම ඒ සියල්ලේ ම ප්‍රතිඵලයක් හැටියට ආන්තිකරණයට මේ තරුණයන් අද ලක්වෙලා ඉන්නවා. ඔවුන් අද මේ වන්දි ගෙවන්නේ ඔවුන් කරපු දේකටවත් ඔවුන් නොකරපු දේකටවත් නෙවෙයි. දශක ගණනාවක් පුරා ඔවුන්ගේ වැඩිහිටි පරම්පරාව ගත් නොගැලපෙන තීරණවල ප්‍රතිඵලයක් හැටියට තමයි ඒ අය මේ අපහසුතාවන්ට අද මුහුණ දී සිටින්නෙ. මෙතන තිබෙන බරපතලම කාරණයක් වන්නේ මේ සා විශාල අර්බුදයක් ඇති වෙලා ජීවිත හානි වෙන තැන දක්වා පැමිණ තිබියදී අද වනවිට වත් මේ වැඩිහිටි පරම්පරාව ඔවුන්ගේ වගකීම හරියට තේරුම් අරගෙන තියෙනවාද? කියන සැකය මතුවෙනවා. අද අපි සාකච්ඡා කරන්න උත්සාහ කරනවා මේ අර්බුදයෙන් මිදෙන්න තරුණයන්ට කොහොමද දායකත්වයක් සපයන්න පුළුවන් කියන කාරණාව. වැඩිහිටි පරම්පරාව විසින් ඇති කරන ලද ප්‍රශ්නයක් හමුවේ අපි අහනවා තරුණයො කොහොමද මේකෙන් මිදෙන්න කටයුතු කරන්න ඕනෙ කියලා. අපි එහෙම අහන ඒකේ ම පොඩි අසාධාරණකමක් තියෙනවා කියලයි මට හිතෙන්නෙ. ඔවුන් කිසිසේත්ම දායක නොවුණ තත්ත්වයකට අපි ඔවුන්ට කියනවා ඇවිත් විසඳුම් හොයන්න කියලා. වැඩිහිටි පරම්පරාවට සාපේක්ෂව තරුණ පරම්පරාව බොහොම ජව සම්පන්නයි. ඒ ජවය තමයි අපි මේ අවස්ථාවේ හැම පැත්තෙන්ම අහන්නෙ දකින්නෙ. ඒ ජවයට නිසි අර්ථයක් සපයන්න වැඩිහිටි පරම්පරාවට තිබෙනවා විශාල වගකීමක්. මෙතනදි තරුණයෝ ළඟ ඔවුන් විසින් ඇති නොකරන ලද ප්‍රශ්නයකට ඇත්තට ම විසඳුම් නෑ. මේ ප්‍රශ්නයේ ඉතිහාසය සමහරවිට තරුණයො දන්නෙත් නැති වෙන්න පුළුවන්. ඔවුන් ළඟ තිබෙන්නේ තරුණ ජවය විසින් මෙහෙයවනු ලබන යම් යම් ශක්‍යතාවන්. ඒ ශක්‍යතාවන් තමයි මේ අද අපි අරගලයක් හැටියට හැමතැනම අහන්නෙ දකින්නෙ. මේ ව්‍යුහාත්මක ගැටලුවලට විසඳුම් තරුණයො ළඟ තියෙනවා කියලා අපට හිතන්න බෑ. ඇතැම්විට තරුණයෝ ළඟ විසඳුම් තියෙනවා වෙන්නත් පුළුවන්. නමුත් ඒවා නිවැරදි මාර්ගයට යොමු කරන්න වැඩිහිටි පරම්පරාවේ නිසි මඟ පෙන්වීමක් අවශ්‍යයි.

**මෙරටේ තරුණ පරම්පරාව ජව සම්පන්නයි**

**● මේ අර්බුදය හමුවේ තරුණයෝ සැබැවින්ම කළ යුත්තේ කුමක්ද ?**

මේ වෙලාවේ ඔවුන්ට කරන්න පුළුවන් ලොකුම දේ අරගලයක මුහුණුවරින් කරලා දුන්නා. ඔවුන්ගේ ජීවිතයේ ආතතිය, ඉච්ඡා භංගත්වය මේ හැමදේකම පුපුරා යෑමක් තමයි අපි පසුගිය දිනවල අරගලයක් හැටියට දැක්කෙ සහ දැනටත් අත්විඳින්නෙ. ඒ කියන්නෙ ගෙවල්වලට වෙලා අපි අපේ වැඩක් බලාගෙන ඉඳලා හරියන්නෙ නෑ. රටේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ඒ ප්‍රශ්නයට විසඳුම් සෙවීමට සක්‍රීයව දායක වෙන්න ඕනෑ කියන අදහස සමාජගත කරන්න තරුණයින් සෑහෙන්න කාර්යභාරයක් මේ වන විට කරලා තිබෙනවා. එතනින් එහාට යන්න අවශ්‍ය ව්‍යුහාත්මක සැකැස්ම, සමහර විට දැනුම අතින් අවශ්‍ය පසුබිම තරුණයන් ළඟ නැති වෙන්න පුළුවන්. ඒ නිසා මේ අරගලය ආදරයේ අරගලය හැටියට දිගින් දිගට ම ප්‍රකාශ වෙමින් පවතිනවා. නමුත් කිසියම් විසඳුමකට නිවැරදි යොමුවීමක් මෙතැන තිබෙනවා කියලා හඳුනාගන්න ඇත්තෙන්ම අපහසුයි. ලෝකෙ පුරා දේශපාලන විද්‍යාඥයො පවුල් දේශපාලනය ගැන කතා කරනකොට ශ්‍රී ලංකාව අනිවාර්යයෙන් උදාහරණයක් හැටියට ගන්නවා. මේ රටේ තිබෙන සම්ප්‍රදාය තමයි කෙනෙක් දේශපාලනයට පිවිසුණොත් ඔහු හෝ ඇය සෑහෙන කාලයක් දේශපාලනය තුළ රැඳෙනවා. ඊළඟට ඔහුගේ හෝ ඇයගේ ඊළඟ පරම්පරාව, ඊටත් පසු පරම්පරාව ආදී වශයෙන් දේශපාලන වශයෙන් ඉදිරියට එන ස්වභාවයක් තියෙනවා. මේ සාම්ප්‍රදායික දේශපාලන රාමුව තුළ අලුත් අදහස් තියෙන තරුණයින්ට ඉදිරියට එන්න, තැනක් හදාගන්න, අවස්ථාවක් ගන්න හරිම අපහසුයි. පසුගිය කාලය තුළ සමාජ මාධ්‍ය තුළ විවිධ අදහස් පළ වුණා තරුණ නායකත්වය ඉදිරියට එන්න ඕන කියලා. ඒ වුණත් ඔවුන්ට මේ අවස්ථාවේ විධිමත් රාමුව තුළට ඇතුළු වෙන්න අවකාශයක් නෑ. රට ගොඩනැගීම වෙනුවෙන් තරුණ පිරිස් ළඟ හොඳ අදහස් තිබෙනවා. යම් මග පෙන්වීමක් දුන්නොත් සහ ඔවුන්ට විධිමත් රාමුවට ඇතුළු වෙන්න අවස්ථාව දුන්නොත් තමයි තරුණයින්ට පුළුවන් වෙන්නේ ඒ අයගේ අදහස් ක්‍රියාත්මක කරන්න. එහෙත් අවාසනාවකට ඔවුන්ට මේ විධිමත් රාමුවට ප්‍රවිශ්ට වීමට අවශ්‍ය අවකාශය සහ මඟ පෙන්වීම නිර්මාණය වෙලා නැහැ. එය තමයි මෙතන තිබෙන ලොකුම ගැටලුව. රටේ තරුණ පිරිස් තමයි සිස්ටම් චේන්ජ් එකක් ගේන්න ඕනෑ කියන අදහස ජනතාවට දුන්නෙ. එහෙත් ඔවුන්ට එය සිදු කරගැනීමට අවශ්‍ය පසුබිම තවම සැකැසී නැහැ.

**රට ගොඩනැඟීමට තරුණ පිරිස් ළඟ හොඳ අදහස් තිබෙනවා**

**වැඩිහිටි පරම්පරාවේ නිසි මඟ පෙන්වීම අවශ්‍යයි**

**● තරුණයින් ගෝල්ෆේස් පිටියට වෙලා සෙනග එක්රොක් කරගෙන සාමකාමී අරගලයක් ගෙන යනවා. යමෙක් පෙන්වා දෙන්න පුළුවන්, නෑ මේක නෙවෙයි මේ වෙලාවේ තරුණයින් අතින් වෙන්න ඕන, වගා කිරීම, දේශීය නිෂ්පාදන නගා සිටුවීම, නාස්තිය අවම කිරීම, තම රැකියාව තුළ උපරිම දායකත්වයක් සැපයීම වැනි කාරණායි කියලා. මේ ගැන ඔබේ අදහස කුමක්ද?**

ඒ අදහස නොසලකා හරින්න බෑ කිසිසේත්ම. එයත් අනිවාර්යයෙන්ම ඉටුවිය යුතු කොටසක්. තරුණයින් මේ අරගලය ආරම්භ කරලා මේ වනවිට දින 50ක් ඉක්මවා ඉදිරියට ගොස් තිබෙනවා. එහෙත් තැන තැන කණ්ඩායම් ගැහිලා පමණක්ම රටට එලක් වෙන දෙයක් සිද්ධ වෙයි කියලා හිතන්න බෑ. අපි අහලා තියෙනවා අරගල භූමියේ ඉන්නවා කියලා උදේට රැකියාවට ගිහින් හවසට අරගල භූමියට එන බොහෝ පිරිස්. එතකොට අපි දන්නෙ නෑ ඔවුන් කරන රැකියාවට 100%ක දායකත්වයක් ඔවුන්ගෙන් මේ අවස්ථාවේ ලැබෙනවාද කියලා. ඇත්තෙන්ම එහෙම දායකත්වයක් ලැබෙන්නේ නැත්නම් එයිනුත් හානියක් සිදු වන්නේ රටටමයි. පොදු මහජනතාවටමයි. ඒ වගේ ම අපි දකිනවා ඇතැම් පිරිස් තෙල් පෝලිම්වල, ගෑස් පෝලිම්වල සිදු වන අසාධාරණකම්වලට විරෝධය පෑමක් විදිහට පාරවල් අවහිර කරනවා. එවැනි දේවලින් අපහසුතාවට පත්වෙන්නෙ රටේ මේ ප්‍රශ්නවලට වගකිව යුතු පිරිස් නෙවෙයි, මේ ප්‍රශ්නවලින් මිරිකෙන පිරිස්මයි. අරගලය නම් මං හිතන්නෙ නෑ ඒ අය දැන්ම නිමා කරයි කියලා. එහෙත් ඒ අරගලය වගේම මේ රට ගොඩගන්නත් කුමක් හෝ සැලැස්මක් අපට තිබිය යුතුයි. අරගලයෙන් පොදු ගැටලුවලට අවධානය ලබාගෙන තිබෙනවා. ඒ වගේ ම දේශපාලනඥයින්ට පෙන්නුම් කරලා තියෙනවා දැන් අපි ඉස්සර වගේ නෙවෙයි කියලා. නව දේශපාලන සංස්කෘතියක් මේ රට තුළ ගොඩනගලා තියෙනවා. අවධියෙන් සිටින ඡන්ද දායකයන් පිරිසක් ඉන්න බව පෙන්නුම් කරලා තියෙනවා. එවැනි පසුබිමක් සැකසීම තුළ අරගලය ඉතාම වැදගත් මෙහෙයක් සිදු කර තිබෙන බව පැහැදිලියි. ඒ වුණත් දැන් රට ඉදිරියට ගෙනයන්න, සමාජ ආර්ථික වශයෙන් දියුණු කරන්න, දේශපාලනික වශයෙන් ස්ථාවර කරන්න සැලැස්මක් අනිවාර්යයෙන් අවශ්‍ය වනවා. එහිදී මුලින්ම තරුණයින් නිසි නායකත්වයක් සොයාගත යුතුයි. ඔවුන් මේ වනවිට අවබෝධ කරගෙන තිබෙනවා මේ කියන නිසි නායකත්වය, පවත්නා සාම්ප්‍රදායික දේශපාලන ප්‍රවාහය තුළින් ගොඩනැගෙන්නෙ නෑ කියලා. එසේනම් අවශ්‍ය විකල්ප නායකත්වය ඔවුන් විසින් සොයා ගත යුතුයි. එවැනි නායකත්වයක්, නායකත්ව කණ්ඩායමක් ඔවුන්ම සොයා ගෙන සංවිධානය කිරීම අවශ්‍යයි.

**● ආදරයේ අරගලයෙන් රටට වැඩක් වුණාද ? එසේ නම් එහි මීළඟ පියවර විය යුත්තේ කුමක්ද ?**

මා පෙරත් සඳහන් කළ පරිදි අරගලයෙන් පොදු ගැටලුවලට සමාජ අවධානය අරගෙන දුන්නා වගේම දැන් අපට තියෙන්න ඕන සක්‍රීයව මේ රට ගොඩ නඟන්න, මේ පිරිස මෙහෙය වන්න සැලැස්මක්. එහිදී ඉතාම වැදගත් වන්නෙ තැන් තැන්වල කුඩා කණ්ඩායම් වශයෙන් නොවෙයි. ජාතික වශයෙන් ගොඩනැගුණු නිවැරදි නායකත්වයක් යටතේ මේ තරුණයන් සංවිධානය වීමයි. එහිදී සාම්ප්‍රදායික පක්ෂ දේශපාලනයෙන් තරමක් මධ්‍යස්ථ වූ මනා දේශපාලන විඥානයක් තිබෙන අලුත් නායකත්වයක් මේ තරුණයන්ට අවශ්‍ය වනවා. ඒ නායකත්වය හරහා බොහෝ දෙනාගේ අප්‍රසාදයට පත් මේ දේශපාලන සංස්කෘතියට බලවත් පහරක් එල්ල කරන්න ඔවුන්ට පුළුවන්. ඒ වගේම ඒ නායකත්වය හරහාම ඔවුන් රටට ආදර්ශයක් සපයන වැඩසටහනක් දියුණු කර ගත යුතු වනවා. මේ රටට ආදර්ශමත් වැඩසටහනක් දියුණු කරගැනීම යන කාරණයේදී ඔවුන්ගෙන් මුලින්ම සිදු විය යුත්තේ මේ ගැටලුව හොඳින් අවබෝධ කර ගැනීමයි. මොකද්ද මේ ගැටලුව ? මේ ගැටලුව කොහොමද හට ගත්තෙ ? කොයි කාලෙ ද හට ගත්තෙ ? මොන, මොන ක්‍රියාවන් නිසා ද මේක හටගත්තෙ ? මේක විසඳන්නෙ කොහොමද ? කියන කාරණා පිළිබඳ ඔවුන් මනා අවබෝධයක් ඇති කර ගන්න නම්, මේ ඇති වෙලා තිබෙන තත්ත්වය සහ එහි ඉතිහාසය ගැන පැහැදිලි අදහසක් ඇති කර ගත යුතුයි. ඒ සඳහා මඟ පෙන්විය හැකි පිරිස් එක්කරගත් සාකච්ඡා, සමාජ මාධ්‍ය, ජනමාධ්‍ය ඔස්සේ මේ ප්‍රශ්නය පිළිබඳ විශ්ලේෂණ සිදු කෙරෙනවා. පොත්පත්වල ලියැවුණු දේවල් තිබෙනවා. මේ හැම දෙයක්ම දේශීය විදේශීය වශයෙන් අද මහා පරිමාණ වශයෙන් සාකච්ඡා වෙනවා. මේ ගැන හැදෑරීම තුළින් මේ තරුණයන්ට දැනුවත් වෙන්න පුළුවන් මොකක්ද වෙලා තියෙන්නෙ ? දැන් අපි මොකක්ද කරන්න ඕනේ කියලා. මේ දැනුවත්භාවය ලබා ගැනීමේ පටන් අර මං කිව්ව නිසි නායකත්වයක මඟ පෙන්වීම මොවුන්ට අවශ්‍ය වනවා. ඒ කරුණු ඉටු වීමෙන් පසු තරුණයන්ට පුළුවන් පරිසර වැඩසටහන් ඇති කරන්න. වගා නොකළ ඉඩම්වල වගා කිරීම, නව නිෂ්පාදන කෙරෙහි යොමු වීම, ගෙවතු වගාවන් දියුණු කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වයට අතදීම වැනි තවත් බොහෝ දේ සිදු කිරීමට මේ තරුණයන්ට පුරෝගාමී වී කටයුතු කරන්න පුළුවන්. මේ ඇතිවෙලා තිබෙන අප්‍රසන්න දේශපාලනය, සමාජ ආර්ථික වියවුල ඇතුළු මේ හැම දෙයක්ම ව්‍යුහාත්මක වශයෙන් වෙනස් කරගන්න පදනමක් සකසා ගන්න පුළුවන්, මේ තරුණ පිරිස නිසි ලෙස මෙහෙයවීම ඔස්සේ.

**● මේ අවස්ථාවේ රටේ වැඩිහිටියන් හැසිරිය යුත්තේ කෙසේද?**

වැඩිහිටි පරපුරට මේ අවස්ථාවේ විශාල වගකීමක් තිබෙනවා. තරුණයන් මොකද කරන්නෙ ? කියලා අහන්න කලින් තරුණයන්ගේ තියෙන ජවය නිවැරදිව මෙහෙයවීම සඳහා වැඩිහිටියන්ට තිබෙන වගකීම කුමක්ද යන්න වටහා ගත යුතුයි. ඒ වගකීම තමයි මම දිගින් දිගටම විස්තර කළේ. වැඩිහිටියන් විසින් දේශීය වශයෙනුත් විදේශීය වශයෙනුත් ශ්‍රමය ඵලදායි ලෙස යොදා ගැනීමට අවශ්‍ය පසුබිම තරුණයන්ට සකසා දිය යුතුයි. ඊ ළඟට අධ්‍යාපනයේ යම් යම් ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කොට වෘත්තීය පුහුණුවක් ලැබෙන ආකාරයේ අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දිය යුතුයි. දිගින් දිගටම විභාග සහ සහතික පත් අරමුණු කර ගත් අධ්‍යාපන ක්‍රමයකින් නිර්මාණය කරන තරුණයන් කොයිතරම් දුරට අද අපි මුහුණ දී තිබෙන අර්බුදය ජය ගැනීමේදී ප්‍රයෝජනවත් වෙනවාද යන්න අප නැවත නැවතත් සිතිය යුතු කාරණයක්. මෙතෙක් අපි කතා කළේ සාර්ව මට්ටමෙන් තරුණයන්ට මේ අවස්ථාවේ මොනවද කරන්න පුළුවන් කියන කාරණය ගැනයි. එනම් ව්‍යුහාත්මක වශයෙන් සමාජය ආර්ථිකය දේශපාලනය වෙනස් කිරීම හරහා තරුණයන්ව කොයි ආකාරයෙන්ද රටේ සංවර්ධනයට හේතුවන පිරිසක් හැටියට යොදා ගන්න පුළුවන් වෙන්නේ කියන කාරණය ගැන අපි කතා කළා. මී ළඟට සූක්ෂම මට්ටමෙන් තරුණයන්ටත් යම් වගකීමක් තියෙනවා. බොහෝ විට නිවෙස තුළින්, පාසල තුළින්, ආගමික ස්ථාන තුළින් තරුණයින්ව බලගැන්විය යුතුයි මෙවැනි කාරණා සම්බන්ධයෙන්. මෙහිදී ප්‍රධාන වශයෙන්ම සකසුරුවම් වූ ජීවන ක්‍රමයකට මේ තරුණ පිරිස් හුරු විය යුතුයි. මෙතෙක් කල් සාමාන්‍යයි කියලා හිතපු බොහෝ දේ අත හරින්න වෙන තැනකට දැන් අපි ඇවිත් ඉන්නවා. ඒ රස කෑමක් හෝ ලස්සන ඇඳුමක් විය හැකියි. නැතිනම් වෙනත් යමක් විය හැකියි. මේ තත්ත්වයට මුහුණ දෙන්න පුළුවන් විදිහේ තරුණයන් පිරිසක් ඇති කිරීමේ වගකීමක් අපට තිබෙනවා. එසේම එය අවබෝධ කර ගැනීමේ වගකීමක් තරුණයන්ට තිබෙනවා. විසි එක්වැනි සියවසේ වැඩ ලෝකයට අවශ්‍ය වන ආකල්ප හා කුසලතා, නායකත්ව ලක්ෂණ, තීරණ ගැනීමේ හැකියාව, ස්වාධීන බව, විචාරශීලීව යමක් දෙස බැලීමේ හැකියාව වැනි ලක්ෂණ විශේෂයෙන්ම නව යොවුන් වියේ පසුවන තරුණයන් අතර ඇති කිරීමට අප කොතරම් වෙහෙස වෙනවාද ? එහෙත් මේ කුසලතාවන් සහ ආකල්ප, විභාග හා සහතිකපත්ම අරමුණු කර ගත් සාම්ප්‍රදායික අධ්‍යාපන රාමුව තුළින් තරුණයන්ට ලබාදෙන්න පුළුවන් කියලා හිතන්න අපහසුයි. මේ සාකච්ඡාවේ ප්‍රධාන අදහස හැටියට ඇත්තෙන්ම කියන්න තිබෙන්නේ මේ සිස්ටම් චේන්ජ් එකක් ඉල්ලා සිටියේ තරුණයින්. ඒ සිස්ටම් චේන්ජ් එකට යන්න අවශ්‍ය මාර්ගය සකසා දීම සඳහා අවශ්‍ය සිස්ටම් චේන්ජස් මේ අවස්ථාවේදී වැඩිහිටියන් විසින් සිදු කර දිය යුතුයි. එයයි ඔවුන්ගේ වගකීම. තරුණයින්ට අවශ්‍ය ආරම්භය ලබා දීම සඳහා නිදසුන් ලෙස ගත හොත් අධ්‍යාපනයේ ව්‍යුහාත්මකව සිදු කළ යුතු යම් යම් වෙනස්කිරීම්, ශ්‍රම බලකායේ සිදු කළ යුතු වෙනස් කිරීම් දැන් සිටම සිදුකොට දිය යුතුයි. ඉන් පසුව නිසි නායකත්වයක් හරහා ලැබෙන මනා මඟපෙන්වීමකින් මීට වඩා පුළුල් මට්ටමේ සාධනීය වූ සිස්ටම් චේන්ජ් එකකට යොමුවෙන්න තරුණයින්ට පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

**කාංචනා සිරිවර්ධන**




# නිවැරදි වූ දාට අපි දිනුම්

**ර**ට පුරා මේ දිනවල පවතින වැසි සහිත කාලගුණයත් සමඟ ඩෙංගු රෝගීන්ගේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ. ඩෙංගු රෝගය යනු වයිරසයක් මඟින් බෝවන රෝගයකි. මෙම රෝගය කෙනෙකුගෙන් තවත් කෙනෙකුට ගෙනයන වාහකයා මදුරුවාය. ඊඩිස් ඊජිප්ටයි හා ඊඩිස් ඇල්බොපික්ටස් යන මදුරු විශේෂ දෙක ඩෙංගු රෝග කාරක වයිරසය සංසරණය කිරීම සඳහා දායක වේ. ඩෙංගු රෝගය ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ, ආර්ථික, හා සෞඛ්‍ය අංශ කෙරෙහි ඇති වන බලපෑම නිසා රක්තපාත උණ සහ ඩෙංගු වයිරසය මඟින් ඇති විය හැකි බරපතළ සංකූලතා නිසා එය ප්‍රධාන මහජන ගැටලුවක් ලෙස හඳුනාගෙන ඇත.

කිසියම් රටක හෝ භූගෝලීය ප්‍රදේශයක ඩෙංගු රෝගය පැතිරීම සඳහා ස්වභාවධර්මයේ නිර්මාණ තුනක බලපෑමකින් සිදු වේ. එනම් මිනිසා, මදුරුවා සහ වයිරසයයි. මේ සත්ත්ව කොට්ඨාස තුන ස්වභාවධර්මයා විසින් සම්බන්ධ කර ඇත්තේ එයින් එක් වර්ගයක පැවැත්ම සඳහාය. එහෙත් එහි අහිතකර ප්‍රතිවිපාක භුක්තිවිඳීමට සිදු වී ඇත්තේ මිනිසාටය.

යම් ප්‍රදේශයක ඩෙංගු වසංගතයක් පැවැතීමට මේ අවශ්‍යතා තුනම සම්පූර්ණ වී තිබිය යුතුය. සාධක තුනෙන් එකක් යම් ප්‍රදේශයකින් ඉවත් කළ හොත් ඩෙංගු රෝගය සමාජයෙන් තුරන් කළ හැකිය. මදුරුවන් ඉවත් කළොත් ඉතිරි වන්නේ මිනිසා සහ ඩෙංගු වයිරසයයි. එසේ වුවහොත් ටික කලකින් රෝගය පැතිරීම නවතී.

ඩෙංගු වයිරසය සමාජයෙන් ඉවත් කළ හැකි නම්, ඉතිරි වන්නේ මිනිසා සහ මදුරුවා පමණි. එවිට වෛරසය නැති නිසා රෝගය බෝවීමක් සිදු නොවේ. එහෙත් වයිරසය විනාශ කිරීමට ඖෂධයක් තවම සොයාගෙන නැත. එමෙන්ම රෝගයෙන් වැළකී සිටීමට ප්‍රතිශක්තිකරණ එන්නතක් ද තවම නිපදවා නැත. මෙහිදී පැහැදිලි වන්නේ ඩෙංගු රෝගය සුව කිරීමට ඖෂධයක් හෝ එයින් වැළකී සිටීමට එන්නතක් ද නැති බවයි.

වැඩිම රෝගීන් ප්‍රමාණයක් වාර්තා වෙන්නේ බස්නාහිර පළාතෙනි. එය සියයට 68 පමණ වේ. ඊට අමතරව මහනුවර, ගාල්ල, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුර සහ කෑගල්ල වැනි දිස්ත්‍රික්කවලින් රෝගීන් වැඩි වශයෙන් වාර්තා වේ.

කොවිඩ් වයිරස තත්ත්වය නිසා පසුගිය කාලයේ පරිශ්‍ර පරීක්ෂාවන්වල අඩුවක් දක්නට තිබුණි. නමුත්, මේ වන විට යළිත් ඩෙංගු මදුරු මර්දන වැඩසටහන් බස්නාහිර පළාත සහ නැගෙනහිර පළාතේ සක්‍රීයව ක්‍රියාත්මක කළ යුතුව ඇත.

මෙරටේ පාසල් දරුවන්ගේ අධ්‍යාපනය පසුගිය කාලය තුළ ක්‍රමානුකූලව සිදු නොවිණි. කොවිඩ්, උද්ඝෝෂණ හා කෝලාහල විටින් විට ඇති විය. අපි ඒ සියල්ල පසු කළෙමු. දැන් අප සියල්ලෝම පසු කරන්නේ ආර්ථික අර්බුදයකය. කෙසේ වෙතත් මේ අභියෝග හමුවේ දරුවන්ට ඉගැන්විය යුතුය. දරුවන් ඉගෙන ගත යුතුය. පසුගිය දා අ. පො. ස. සා. පෙළ විභාගය සඳහා සෙසු රජයේ පාසල්වලට නිවාඩු දී තිබිණි. එබැවින් නැවත පාසල් ආරම්භ කළ මේ අවස්ථාවේ කළ යුත්තේ විශේෂයෙන්ම පාසල් පරිශ්‍ර තුළ මදුරුවන් බෝවිය හැකි ස්ථාන තිබෙනවා ද යන්න පරීක්ෂාවට ලක් කිරීමය. අනතුරුව එම පරිශ්‍ර ද පිරිසිදු කිරීමට කටයුතු කළ යුතුය.

රටේ පවතින ආහාරවල මිල ඉහළ යාම, උද්ධමනය, බෙදී නොයෑම වැනි හේතු කාරණා හේතුවෙන් රටේ දරුවන් ඇතුළු සියලු ප්‍රජාවට මේවාගේ අනිසි බලපෑම්වලට ලක් වීමට සිදු වේ. ඒ අතරට වසංගත හා ලෙඩ රෝග වැළඳීම යනු තව දුරටත් අප පහළට ඇද දමන්නට හේතු වන දෑය. එසේ හෙයින් අප ලෙඩ රෝග ඇතුළු උවදුරුවලින් ආරක්ෂා විය යුතුය. තවද ඩෙංගු රෝගය සුව කිරීමට ඖෂධයක් හෝ එයින් වැළකී සිටීමට එන්නතක් ද නැති තත්ත්වය තුළ බොහෝ පරිස්සම් විය යුතුය.

ඩෙංගු වයිරසය සහිත මදුරුවෙකු දෂ්ට කිරීමෙන් ඕනෑම පුද්ගලයෙකුට රෝගය වැළඳිය හැකිය. යම් අයෙකුට මේ දිනවල කිසියම් උණ තත්ත්වයක් තිබෙනවා නම්, එය ඩෙංගු රෝග තත්ත්වයක් විය හැකියි. එමෙන්ම උණ, හිසරදය, ඇස්යට වේදනාව, මස්පිඩු, හන්දිපත් වේදනාව වැනි රෝග ලක්ෂණ එහි රෝග ලක්ෂණ ලෙස පෙන්වා දිය හැකිය. එම රෝග ලක්ෂණ තිබෙනවා නම් දින දෙකකට වඩා කල් නොගෙන සුදුසුකම් තිබෙන වෛද්‍යවරයෙක් හමුවීම මඟින් අදාළ පරීක්ෂණ මඟින් ඩෙංගු රෝගය ආසාදිතයකු ද නැද්ද යන්න තහවුරු කර ගත හැකියි.

ඩෙංගු රෝගය යනු වයිරසයක් මඟින් ඇති කරනු ලබන රෝගයකි. ඩෙංගු වෛරසය ශරීරගත වූ අයකු බොහෝ විට රෝග ලක්ෂණ නොපෙන්වන අතර රෝග ලක්ෂණ මතුවුවහොත් වහා ප්‍රතිකාරවලට යොමු විය යුතුය.

මෙහිදී සාමාන්‍ය ඩෙංගු උණ රෝගීන්ට සංකූලතා ඇතිවීමේ අවදානම අවම වේ. ඩෙංගු රක්තපාත උණ හා අසාමාන්‍ය ඩෙංගු වැනි අවදානම් අවස්ථාවලට පත්වන රෝගීන්ගෙන් සුළු පිරිසකට වකුගඩු හා අක්මාව අකර්මන්‍ය වීම, මොළයට සිදුවන බලපෑම් වැනි සංකූලතා ඇති වී කලාතුරකින් මරණය පවා සිදුවිය හැකිය. පමා නොවී නිසි ප්‍රතිකාරවලට යොමු වීමෙන් මෙවැනි තත්ත්වයන් අවම කර ගත හැකිය.

සාමාන්‍යයෙන් ඊඩිස් මදුරුවෝ දවසේ උදය කාලයේ හිරු පායා පැය කිහිපයක් යන තුරු ද, සවස් කාලයේ හිරු බැසීමට පැය කිහිපයකට පෙර ද වැඩිපුර දෂ්ට කරති. එබැවින් මෙම කාලය තුළ දෂ්ටනවලින් ආරක්ෂා වීමට වග බලා ගත යුතුය.

ඩෙංගු මදුරුවා බෝවීම පමණක් නොව ඩෙංගු රෝගය පැතිරීමට හේතුව අන් කිසිවකු නොව මිනිස් ක්‍රියාකාරකම්ය.

ඉවතලන ප්ලාස්ටික්, මැටි හා ලෝහ බඳුන්, විසිතුරු මල් බඳුන්, බැරල්, කුරුලු නාන තටාක, වතුර ටැංකි, ශීතකරණ තැටි, ඉවතලන ටයර්, වියළි පොල් කෝම්බ හා වැහි පීලි වැනි ජලය රැඳෙන ස්ථානවල මෙම මදුරුවෝ බිත්තර දමති. තව ද, බ්‍රෝමිලියා, අන්නාසි පත්‍ර අතර ද, ගස් බෙන වැනි ස්වාභාවිකව ජලය රැඳෙන ස්ථානවල ද ඩෙංගු මදුරුවන් බෝවීම සිදු වේ. වැඩිහිටි මදුරුවන් නිවසින් පිටත මෙන්ම නිවෙස් ඇතුළත අඳුරු ස්ථානවල ද රැඳී සිටිය හැකිය. එසේ හෙයින් කළ යුත්තේ මේ ආකාරයට මදුරුවන් බෝවන ස්ථාන නිතර පරීක්ෂා කොට ඊට ඉඩ කඩ ඇසිරීමයි. අවට පරිසරය ඉතා පිරිසිදුව තබා ගත යුතුය. මේ කාරණා මිනිසුන් වන අපට සිදු කළ නොහැකි දේවල් නොවේ. අපගේ සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් අප ජීවත්වන පරිසරයේ මදුරු ගහණයට කිසිසේත්ම ඉඩ නොතැබිය යුතුය. ජලය හොඳින් බැස යාමට ඉඩ කඩ සලසා තිබිය යුතුය. අඳුරු ස්ථාන වහා පිරිසිදු කොට ආලෝකයට නිරාවරණය වන සේ සකස් කළ යුතුය. තවද අත් පා හොඳින් ආවරණය වන ඇඳුම් ඇඳීම, මදුරු දැලක් භාවිත කිරීම, මදුරු විකර්ශක භාවිතා කිරීම (උදා: පැඟිරි තෙල් හෝ කෘතීම විකර්ෂක) වශයෙන් සිදු කරමින් භාවිතා කළ හැකි ඉවතලන ප්ලාස්ටික්, වීදුරු බඳුන්, බෝතල්, ටින් ආදිය ප්‍රතිචක්‍රීකරණය කරන්න. අනෙකුත් බඳුන් මදුරුවන් බෝ නොවන ලෙස විනාශ කරන්න. වැහිපීලි වල හිර වී ඇති කොළ රොඩු ඉවත් කර නිතර පිරිසිදු කරන්න වතුර ටැංකි, බැරල්, මල් බඳුන්, ශීතකරණ තැටි බුරුසුවකින් අතුල්ලා පිරිසිදු කරන්න. වතුර එක්රැස් වන ස්ථාන ළිං සහ ටැංකිවලට මදුරුවන්ට ඇතුළුවිය නොහැකි ලෙස දැල් යොදා ආවරණය කරන්න. ශ්‍රී ලංකාවේ ඩෙංගු මදුරුවන් වැඩිපුර බෝ වන්නේ මිනිසා විසින් ඇති කරන ජලය එක්රැස්වන භාජන හෝ ස්ථානවලය. මේ ආදී ආකාරයට නිරන්තරයෙන් සතියකට වරක් හෝ තමා ජීවත්වන ගෙවත්ත හා ගෙතුළ ද හොඳින් පරීක්ෂා කර මදුරුවන් බෝවිය හැකි ස්ථාන ඉවත් කරන්න.

ඩෙංගු රෝගය වළක්වා ගත හැකි රෝගයක් බැවින් අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම කළ හැකියි. මදුරුවන් බෝවිය හැකි පරිශ්‍ර විනාශ කිරීමට කටයුතු කළ හැකියි. ඒ වගේම මදුරුවන් පාලනය සඳහා වියදමකින් තොරව කළ හැකි පරිසර හිතකාමී ක්‍රමය වන්නේ මදුරුවන් බෝවන ස්ථාන ඉවත් කිරීමයි. මේ සඳහා විශාල මුදලක් අවශ්‍ය නොවේ. කාලය හා ශ්‍රමය පමණක් ප්‍රමාණවත් වේ.

එසේ හෙයින් මිනිසා විසින් සිදු කරන වැරැදි මිනිසා විසින්ම නිවැරදි කළ යුතුය. මක් නිසාද යත්, ඒ නිරවද්‍යතාවය තුළ මිනිසාට යහපත් සෞඛ්‍ය සම්පන්න හෙටක් නිතැතින්ම ගොඩනැගෙන බැවිනි.

**ශ්‍යාමා සමරසිංහ**

# රට යන්න කැමැති රාජ්‍ය සේවකයන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට තොරතුරු දෙන්න

## ඇමැති මනුෂ නානායක්කාර

**මහින්ද අලුත්ගෙදර සහ අනුර ප්‍රේමලාල්**

විදේශ රැකියා අපේක්ෂිත රාජ්‍ය සේවකයන්ගේ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත දෙන්නැයි කම්කරු සහ විදේශ රැකියා ඇමැති මනුෂ නානායක්කාර මහතා රාජ්‍ය සේවකයන්ගෙන් ඉල්ලීමක් කරයි.

විදේශ රැකියා සඳහා පිටත්ව යෑමේ අපේක්ෂාවෙන් පසු වන රාජ්‍ය සේවකයන්ට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිවීමට අවස්ථාව දී ඇති බවත්, කාර්යාංශයේ වෙබ් අඩවියට පිවිස තමන්ගේ තොරතුරු ඇතුළත් කිරීමට හැකි බවත් ඒ මහතා පෙන්වා දෙයි.

රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන්වා ගැනීම සඳහා වන කඩිනම් වැඩසහනක්, කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් ආරම්භ කර ඇති අතර ඒ අනුව රාජ්‍ය සේවකයන්ට විදේශ රැකියා සඳහා පිටත්ව යාමට අවස්ථාව දීමට අවශ්‍ය පියවර ගන්නා බවද රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වැටුපට සහ ජ්‍යෙෂ්ඨත්වයට බාධාවක් ඇති නොවන ආකාරයට විදේශ ගතවීමේ අවස්ථාව දීමට අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කිරීමට මැදිහත්වෙමින්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කිරීමට තමන් අපේක්ෂා කරන බවද සඳහන් කරයි.

රාජ්‍ය සේවකයන් විදේශගත කිරීමේ දී, ඔවුන්ට අවශ්‍ය රැකියා අවස්ථාවන් සොයා ගැනීමේ දී විදේශ රැකියා නියෝජිතායතන සඳහා විශාල කාර්යභාරයක් පැවරෙන බවද, විදේශ රැකියා නියෝජිත ආයතන හිමිකරුවන් සමඟ ඊයේ (06) පැවැති සාකච්ඡාවක දී ඇමැතිවරයා කීවේය.

# සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකන් ඩොලර් මිලියන 800ක ආදායමක් අපේක්ෂා කරනවා

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**මහින්ද අලුත්ගෙදර**

වත්මන් ශ්‍රී ලංකාවේ පවතින අභියෝගාත්මක පරිසරය තුළ මේ වසරේදී සංචාරක කර්මාන්තයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 800ක ආදායමක් අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පවසයි.

ඒ අනුව මේ වසර අවසානය වනවිට විදෙස් සංචාරකයන් 800,000ත් 850,000ත් අතර ප්‍රමාණයක් මෙරට සංචාරය කරනු ඇතැයි විශ්වාසය පළ කරන එම අධිකාරිය සංචාරක කර්මාන්තය සම්බන්ධ සියලු ආයතනයන් එක්ව ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ද සැලසුම්කර තිබේ.

සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය වෙනුවෙන් එළඹෙන 2023 වර්ෂය දක්වා කෙටිකාලීන සැලැස්මක් ඉදිරිපත් කර තිබෙන අතර එය කෙටිකාලීය, මධ්‍යකාලීන හා දිගු කාලීන වශයෙන් කාණ්ඩගතකර ඇත. මේ වසර අවසන් වනවිට සංචාරකයන් වැඩි ප්‍රමාණයක් අපේක්ෂා කරමින් වඩාත් හොඳ ප්‍රතිඵල අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා පවසයි.

පසුගිය අප්‍රේල් මාසයේ සිට රටේ සිදුවූ නොසන්සුන්තාව මුල්කර ගත් පෙළපාලි හා විරෝධතා හේතුවෙන් සංචාරක කර්මාන්තයේ විශාල කඩාවැටීමක් සිදුව තිබෙන අතර මේ වසරේ දී ඉලක්ක කළ විදෙස් සංචාරක පැමිණීම ලක්ෂ 13ක ප්‍රමාණය අපේක්ෂා කළ නොහැකි බවද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පෙන්වා දෙයි.

පසුගිය මාස පහක කාලයේදී ශ්‍රී ලංකාවට විදෙස් සංචාරකයන් 378,521 දෙනකු ශ්‍රී ලංකාවට පැමිණ තිබෙන අතර මැයි මාසයේදී සංචාරක පැමිණීමේ කඩා වැටීමක් පෙන්නුම් කරමින් 30,207ක් දක්වා පහත වැටී තිබෙන බවද ජාත්‍යන්තරය තුළ රටට දී ඇති සෘණාත්මක ප්‍රචාරය හේතුවෙන් දිවයිනට පැමිණීමට අපේක්ෂාවෙන් සිටින බොහෝ සංචාරකයන් සිය සංචාර අවලංගු කිරීමට පියවර ගෙන තිබෙන අතර මේ තත්ත්වය තුළ හොඳ සන්නිවේදනයක් අපේක්ෂා කරන බවද ඒ මහතා ප්‍රකාශ කරයි.

# ප්‍රසන්න රණතුංගට වසර 5ක අත්හිටුවූ සිරදඬුවම්

**රෝෂන් තුෂාර**

බස්නාහිර පළාත් මහ ඇමැතිව සිටියදී අයුතු ලාභයක් ලැබීමේ අරමුණින් ව්‍යාපාරිකයකුට තර්ජනය කර පොරොන්දු නෝට්ටු පහක් අත්සන් කර දඬුවම් ලැබිය යුතු වරදක් කර ඇති බවට එල්ල වූ අධි චෝදනාවට වරදකරු කරනු ලැබූ අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාට වසර 5කට අත්හිටුවූ වසර දෙකක බරපතළ වැඩ සහිත සිරදඬුවමක් කොළඹ මහාධිකරණය ඊයේ(06) නියම කළේය.

ඇමැති ප්‍රසන්න රණතුංග මහතාට, බිරියට හා ඥාතිවරයකු යැයි කියන පුද්ගලයකුට එරෙහිව නීතිපතිවරයා විසින් කොළඹ මහාධිකරණය හමුවේ අධි චෝදනා 15ක් යටතේ පැවරූ නඩුවේ තීන්දුව දෙමින් කොළඹ මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න මහතා මෙම නියෝගය නිකුත් කළේය.

අමාත්‍යවරයාගේ බිරිය සහ ඔහුගේ ඥාතිවරයකු යැයි කියන පුද්ගලයා අදාළ සියලු චෝදනාවලින් නිදහස් කිරීමට ද විනිසුරුවරයා තීන්දු කළේය.

විත්තිකාර අමාත්‍යවරයාට ගොනු කර තිබූ අනිකුත් චෝදනා සාධාරණ සැකයෙන් ඔබ්බට පැමිණිල්ල මගින් සනාථ කර නොමැති බව පෙන්වා දුන් විනිසුරුවරයා එම චෝදනාවලින් නිදහස් කිරීමට ද නියෝග කළේය.

නඩුවේ 13 වැනි චෝදනාවට පමණක් වරදකරුකරමින් මෙම තීන්දුව දුන් විනිසුරුවරයා රුපියල් මිලියන 25ක දඩයක් නියම කළ අතර එම දඩය නොගෙවන්නේ නම් මාස 9ක බරපතළ වැඩ සහිත සිර දඬුවමක් නියම කළේය. ඊට අමතරව රුපියල් මිලියනයක වන්දියක් ගෙවන ලෙස දන්වා සිටි විනිසුරුවරයා එම වන්දිය නොගෙවන්නේ නම් මාස තුනක තවත් සිර දඬුවමක් හිමිවිය යුතු බවට සඳහන් කළේය.

නීතිපතිවරයා විසින් දෙදහස් දාසය වසරේදී මෙම නඩුව පවරන ලද අතර වසර හතක දීර්ඝ නඩු විභාගයකින් පසුව පිටු 57ක තීන්දුවක් නිකුත් කරමින් විනිසුරුවරයා මෙම නියෝගය කළේය.

2014 වසරේ අප්‍රේල් මස 6 වන සහ එම වසරේ ජූනි මස 02 වන දා අතර කාලසීමාව තුල කොලොන්නාව, මීතොටමුල්ල ප්‍රදේශයේ පිහිටි ඉඩමක පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කර එම ඉඩම ගොඩකිරීමට අවශ්‍යය කටයුතු ඉටු කර දීම සඳහා ජෙරාඩ් මෙන්ඩිස් නමැති ව්‍යාපාරිකයකුට තර්ජනය කර රුපියල් මිලියන 64ක මුදලක් ඉල්ලා සිටි බවට චෝදනා කරමින් එවක බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ වත්මන් අමාත්‍ය ප්‍රසන්න රණතුංග, මහතාගේ බිරිය වන මොරීන් රණතුංග සහ බිරියගේ ඥාති සොහොයුරකු වූ නරේෂ් ෆාරික් යන අයට එරෙහිව ඉකුත් රජය සමයේ(2016) නීතිපතිවරයා විසින් මෙම නඩුව ගොනුකර තිබුණි.

අදාළ ව්‍යාපාරිකයාට තර්ජනය කර පොරොන්දු නෝට්ටු පහක් අත්සන් කර ගනිමින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 373 වැනි වගන්තිය උල්ලංඝනය කර දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර ඇති බවට එල්ල වූ චෝදනාවට මෙසේ වරදකරු කෙරිණි.

නඩුවේ තුන්වැනි විත්තිකරු ලෙස නම් කර සිටින නරේෂ් ෆාරික් නමැත්තා මේ වන විට විදේශයකට ගොස් සිටින අතර ඔහු නොමැතිව නඩු විභාගය කෙරිණි.

අමාත්‍යවරයා සහ බිරිය විත්තිකූඩුවේ සිට කළ ප්‍රකාශය හුදු ප්‍රකාශයක් පමණක් බව පෙන්වාදුන් විනිසුරුවරයා එය ඉවත දමන බවද සඳහන් කළේය.

# ‘එරොෆ්ලොට්’ එරෙහි අධිකරණ නියෝගය අත්හිටුවයි

## යානය රුසියාව බලා පියාසර කරයි

**රෝෂන් තුෂාර සහ කටුනායක කේ.ටී.ජී කපිල**

පැමිණිලිකාර අයර්ලන්ත සමාගම අධිකරණ බලය අයුතු ලෙස භාවිත කරමින් බලවත් වරදක් සිදු කර ඇති බවට සඳහන් කර රුසියා ගුවන් සමාගමකට අයත් ගුවන් යානයට ශ්‍රී ලංකාවෙන් පිටව යාම වළක්වාලමින් පනවා තිබූ වාරණ නියෝගය විසුරුවා හැරීමට කොළඹ වාණිජ මහාධිකරණය ඊයේ (06) නියෝග කළේය.

ඒ අනුව එම යානය රුසියාව බලා පිටත්ව ගොස් ඇත.

නීතිපතිවරයා ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමෙන් අනතුරුව කොළඹ වාණිජ මහාධිකරණ විනිසුරු හර්ෂ සේතුංග මහතා මෙම පනවා තිබුණේ යැයි කියන වාරණය අත්හිටුවීමේ නියෝගය නිකුත් කළේය.

අයර්ලන්ත සමාගමක් විසින් ඉදිරිපත් කළ පැමිණිල්ලක් සලකා බැලූ කොළඹ වාණිජ මහාධිකරණ විනිසුරුවරයා කටුනායක සිට මොස්කව් බලා පියාසර කිරීමට නියමිතව තිබූ ‘එරෝෆ්ලොට්‘ ගුවන් සමාගමට අයත් ගුවන් යානය මෙරටින් පිට වීම අත්හිටුවන ලෙස දන්වමින් ඉකුත් 02 වැනි දා වාරණ නියෝගය නිකුත් කෙළේය.

නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිස්ටර් ජනරාල් සුමති ධර්මවර්ධන මහතා ඊයේ දින අධිකරණය ඉදිරියේ දීර්ඝ වශයෙන් කළ කරුණු දැක්වීම්වලින් පසුව මෙම වාරණ නියෝගය අත්හිටුවීමේ නියෝග නිකුත් කළේය.

අතිරේක සොලිසිටර් ජෙනරාල් සුමති ධර්මවර්ධන මහතා අධිකරණය හමුවේ කරුණු දක්වමින් පෙත්සම්කාර පාර්ශ්වය සත්‍ය වසන් කොට අධිකරණය නොමඟ යවමින් මෙම වාරණ නියෝගය ලබා ගෙන ඇතැයි පැවසීය.

මෙම නඩුව ඉකුත් සිකුරාදා කැඳවූ අවස්ථාවේදී මෙම නඩුකරය හරහා රජයට හෝ කටුනායක ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම වෙත වාරණ නියෝගයක් නිකුත් කර නොමැති බව විනිසුරුවරයා විසින් මීට පෙර ප්‍රකාශ කළේය.

මෙම පිස්කල් නිලධාරියා සහ නීතිඥවරයා ගුවන් පාලක මැදිරිය වෙත පැමිණි ආකාරය තහවුරු කිරීම සඳහා ඡායාරූප 14ක් අඩංගු සංයුක්ත තැටියක් ද අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් අධිකරණයට ඉදිරිපත් කෙරිණි.


විනිසුරුවරයා විවෘත අධිකරණයේ සඳහන් කළේ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා පවසන කරුණු සත්‍යයක් නම් මෙම ක්‍රියාව හරහා තම අධිකරණයේ බලය අයුතු ලෙස පරිහරණය කිරීමක් සිදුවී ඇති බවයි.

මේ සම්බන්ධයෙන් අයර්ලන්ත සමාගම වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා වෙත සිය බලවත් අප්‍රසාදය පළ කළ විනිසුරු හර්ෂ සේතුංග මහතා නීතිඥවරයකුට මේ ආකාරයට කටයුතු කිරීමට හැකියාවක් නොමැති බවත් චෝදනාකරමින් සඳහන් කළේය.

නීතිඥවරයා විසින් සිදු කර තිබෙන්නේ බරපතළ වරදක් බවත් මෙම කරුණ බැහැර කිරීමට අධිකරණයට හැකියාවක් නොමැති බවද විනිසුරුවරයා විසින් ප්‍රකාශ කෙරිණි.

දීර්ඝ වශයෙන් පස්වරු 01:30 තෙක් සියලු පාර්ශ්ව විසින් ඉදිරිපත් කළ කරුණු සලකා බැලීමෙන් අනතුරුව විනිසුරුවරයා මෙම නියෝගය ප්‍රකාශයට පත් කළේය.

## සඳදස් කෝපරහේවා සුකිවි වියොව



(‘හෙළ බස් මිණි’ සඳදස් කෝපරහේවා සූරින්ගේ අවසන් කටයුතු අද (07) සවස 5.00ට බොරැල්ල කනත්තෙහි දී සිදු වේ.)

සඳ සත් සයුරු පිහිනු හෙළ බස් ඉසුරු
වැදගත් බසට බැඳැලූ මහ මිණි පවුරු
සඳදස් කිවිඳු කෝපරහේවා ඇදුරු
අද අප අතැර යයි රඳවා ගුණ සිරුරු

හෙළ පෙළ පැළඳිගුන් බස් වහරෙහි සුරු ව
හෙළයට පණ පිදූ පඬිවරයෙකි ගුරු ව
දළ සොව නැගේ හද තුළ වාවනු බැරු ව
කළ දෑ බොහෝ වෙයි ඔබ සුබසින් සරු ව

සඳගෝමී, සනත් දෙ පුතුන් දී දැයට
නිදහස් මගට දී ඉඩ ඔවුනට සැමට
අදහස් වහස් රසයෙන් කලතා සුමට
මඳහස් නැගූ අවදිය සිහි වෙයි අපට

දහම් ගැට මල ද ඉංගිරිසියට නගා
දහම් මගට ඉනි වැට බැඳ අරුත් නගා
දහම් ආර දම් පාසල් දියුණ මගා
දහම් ඇදුරු වූ ඔබ එහි සුබස රගා

මුනිදස් කුමරතුගු සිසු පදවියෙන් දිලී
නැණිනුස් පැළැනේ මාහිමි ඇසුරෙ වෙළී
මෙත්රස් උදුළ මෙත් හිමි බැනණු වැ ගැලී
සඳදස් සිරිත එළි විය සුබසෙහි මැ ගිලී

තොමොසු විදුහලේ ගල්කිස්සේ පසිඳු
දෙතිසු වසරක් මැ ඇදුරිඳු වෙමින් ඉඳු
සමසුනෙහි මැ සිටි මහ පඬි අතරෙහිදු
නුමුසු හෙළ රුවන වෙත් වා ඔබ මතුදු

**තිරිකුණාමලේ ආනන්ද මහනාහිමි**

# ‘එරෝෆ්ලොට්‘ රඳවා ගැනීම

# පිස්කල්ට-නීතිඥයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා

## රජය අවධාරණය කරයි

**මහින්ද අලුත්ගෙදර**

රුසියානු ගුවන් යානයක් ශ්‍රී ලංකාවෙන් පිටවීම වැළැක්වීම සම්බන්ධයෙන් වූ සිදුවීමේ දී කටයුතු කළ පිස්කල්වරයාට සහ අදාළ නීතිඥවරයාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව රජය අවධාරණය කරයි.

අදාළ අධිකරණ නියෝගය එරෝෆ්ලොට් ගුවන් සමාගමට එරෙහිව පමණක් නිකුත්කර තිබිය දී අධිකරණයේ පිස්කල්වරයා හා නීතිඥවරයෙක් එම ගුවන් යානාව මෙහෙයුම් මැදිරියට ගොස් එහි නිලධාරියාට තර්ජනය කර තිබෙන බවට වාර්තා වන බවද අධිකරණ නියෝගය නොසළකා කටයුතු කරන්නේ නම් අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් චෝදනා කරන බවට එම නිලධාරියාට තර්ජනය කර තිබෙන බවද අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමැති ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා පවසයි.

කෙසේ වුවද මෙම ගැටළුව රටට කිසිඳු අගතියක් නොවන පරිදි රාජ්‍යතාන්ත්‍රික මට්ටමින් විසඳා ගැනීමට සාර්ථක ලෙස කටයුතු කර තිබෙන බව ශ්‍රී ලංකා රජය අවධාරණය කරයි.

මේ සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ රුසියානු තානාපතිවරයා සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ බව සඳහන් කළ අධිකරණ ඇමැතිවරයා ඔවුන්ට සිදුවූ අපහසුතාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ කනගාටුව පළකළ බවද පැවසීය.

ශ්‍රී ලංකා-රුසියා මිත්‍රත්වයට කිසිඳු හානියක් මෙමගින් අති නොවන ලෙස එකඟතාවකට පැමිණ තිබෙන බව පෙන්වාදුන් ඇමැතිවරයා ඉදිරියටත් අඛණ්ඩව රුසියාවේ සහාය දෙන බවට තානාපතිවරයා ප්‍රකාශ කළ බවද ඉදිරියේ දීද ‘ඒරෝෆ්ලොට්‘ ගුවන් යානා ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ රුසියානු සංචාරකයන් වැඩි වශයෙන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ බවද සඳහන් කළේය.

# බිලියන 695ක පරිපූරක ඇස්තමේන්තුව අද පාර්ලිමේන්තුවට

**ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර සහ සන්ධ්‍යා කරුණාරත්න**

අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යෑමට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් රුපියල් කෝටි හැට නව දහස් පන්සියයක (බිලියන 695ක) පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට අද (7) පෙරවරුවේ ඉදිරිපත් කිරීමට නියමිතය.

එම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීමෙන් පසු අගමැතිවරයා විසින් රටේ ආර්ථික තත්ත්වය පිළිබඳ විශේෂ ප්‍රකාශයක් කිරීමට නියමිත වේ.

එමෙන්ම රටේ ආර්ථික තත්ත්වය සම්බන්ධයෙන් අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විශේෂ ප්‍රකාශයක්ද අද (07) සිදු කිරීමට නියමිත අතර ඒ පිළිබඳ සභාව කල් කල් තබන අවස්ථාවේ විවාදය පස්වරු 5.30 දක්වා පැවැත්වෙනු ඇත.

# වගා සංග්‍රාමයට කොළඹ දිසාව සූදානම්

## දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න

**මහින්ද අලුත්ගෙදර සහ රක්ෂණ ශ්‍රියන්ත**

උද්ගත වී තිබෙන ආහාර අර්බුදයට කඩිනම් විසඳුම් දෙමින් රටේ නිෂ්පාදන හැකියාව ශීඝ්‍රයෙන් ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක "වගා සංග්‍රාමය" වැඩසටහන කොළඹ දිස්ත්‍රික්කයේ ද ක්‍රියාත්මක කිරීමට මේ වන විට සැලසුම් කර තිබෙන බව කොළඹ දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් යසරත්න මහතා ප්‍රකාශ කළේය.

නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින් මේ වන විට විවිධ වගා වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන අතර ඒ අනුව රටේ නිෂ්පාදනය තවදුරටත් ඉහළ නැංවීම වෙනුවෙන් වගා සංග්‍රාමය කොළඹ දිස්ත්‍රික් වැඩසටහන ඉදිරියේ දී ක්‍රියාත්මක කරන බවද ඒ මහතා පෙන්වා දුන්නේය.

අදාළ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා සිදුවන බවද ඒ අනුව ඉදිරි දිනවල කොළඹ දිස්ත්‍රික් වැඩසටහන ආරම්භ කිරීමට හැකිවන බවද ඒ මහතා සඳහන් කළේය. මේ අතර මහාචාර්ය මාගම්මන පඤ්ඤානන්ද හිමියෝ පෙන්වා දුන්නේ වගා සංග්‍රාමය වැඩසටහන ආරම්භ කිරීම වෙනුවෙන් සැලසුම් සකස් කර තිබෙන බවත් ඒ සම්බන්ධයෙන් මේ වනවිට සාකච්ඡා සිදුවෙමින් පවතින බවත්ය. වසවිසෙන් තොර පෝෂණයෙන් සපිරි නැවුම් එළවළු හා පලතුරු, පලාවර්ග, අලවර්ග ඇතුළු භෝග තම ගෙවත්තෙන්ම සපයා ගැනීම තුළින් නිරෝගී ස්වයංපෝෂිත පවුල් ඒකක සංකල්පය ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් රජය විසින් මෙම වගා සංග්‍රාමය වැඩසටහන ආරම්භ කර තිබෙන අතර වත්මන් ආර්ථික අභියෝග හමුවේ දේශීය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම ගෘහස්ථ මට්ටමින් ජනතාව දායක කර ගැනීමේ ජාතික ප්‍රතිපත්තියක් ලෙස ක්‍රියාවට නංවන මේ වැඩසටහන ඔස්සේ ගෙවතු වගාවේ නියුතු පවුල් ලක්ෂ 20කට වැඩි ප්‍රමාණයක් සංවර්ධනයට සැලසුම් කර ඇත.


# සංවේගයෙන් දැනුම් දීමයි !



## ශාන්ති රණසිංහ මහත්මිය

ලේක්හවුස් ආයතනයේ සේවය කල නැසීගිය ආර්.ඒ.එස්. රණසිංහ මහතාගේ ප්‍රිය බිරිඳ වූ ලේක්හවුස් ආයතනයේ දැන්වීම් අතිරේක අංශයට අනුයුක්තව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරිනියක ලෙස සේවය කරමින් සිට විශ්‍රාම ලැබූ ශාන්ති රණසිංහ මහත්මිය අවුරුදු 65ක් ආයු වළඳා අභාවප්‍රාප්ත වූවාය.

දේහය මේ වන විට මහජන ගෞරවය සඳහා පිළියන්දල බයිපාස් මාර්ගය ඉදිරිපිට පිහිටි "බොරලැස්ගමුව මල් ශාලාවේ" තැන්පත් කර ඇත.

අවසන් කටයුතු
2022 ජූනි මස 07 වැනි දින අඟහරුවාදා
සවස 3.00ට කැස්බෑව පොදු සුසාන භූමියේදී
සිදු කිරීමට නියමිතය...


01 වැනි පිටුවෙන්....

## නිෂ්පාදනය අඩු වී...

ඉහළ ගිය එළවළු අතර තක්කාලි කිලෝවක් රුපියල් 600ක් බෝංචි 550ක් වැටකොළු, වම්බටු, කරවිල ආදී එළවළු කිලෝවක් රුපියල් 300ක් තොග මිලකට අලෙවි වීම ආර්ථික මධ්‍යස්ථානයේ සුවිශේෂ වූ කාරණයක් විය.

ඉන්ධන නොමැතිවීම තෙල් පොහොර නොමැති වීම එළවළු වගාවෙන් ගොවීන් විශාල වශයෙන් ඈත්ව සිටීම යන කරුණු කාරණා රැසක් නිසාවෙන් ආර්ථික මධ්‍යස්ථානයට ලැබෙන එළවලු ප්‍රමාණය මේ ආකාරයෙන් දවසින් දවස අඩුවෙමින් පවතින බව වෙළෙන්දන් මෙන් ම ගොවියෝ ද පෙන්වා දෙති.

## සමාජ මාධ්‍ය...

මෙතෙක් අස්වනු හානියට වන්දි නොදුන් ආණ්ඩුව ජනතාවට වගා කරන්න යැයි කියන බව පවසන විපක්ෂ නායකවරයා දෙවසරක කාබනික මිත්‍යාවක යෙදී කෘෂිකර්මාන්තය විනාශ කළ අයම දැන් වගා කරන්න යැයි පැවසීම විහිළුවක් බවද කියා සිටියේය. ජනාධිපති මන්දිරයට, පාර්ලිමේන්තුවට, මැති ඇමැති නිවෙස්වලට කිසිවක් හිඟ නොවන බවත් පවසන විපක්ෂනායකවරයා, එහෙත් ජනතාවට එම ප්‍රශ්න ඇති බවද කීය. සමඟි ජනබලවේගය ආහාර සුරක්ෂිත බව වෙනුවෙන් වගා සංග්‍රාමයක් ආරම්භ කරන බව කී විපක්ෂ නායකවරයා ඒ වෙනුවෙන් සමාරම්භක කායීය ආරම්භ කරන බවද පැවසීය. දෙවසරක රාජපක්ෂ ශාපයේ ඛේදවාචකය නිර්මාණය වී ඇති බවත් අද ගැබිනි මව්වරුන්ට, දරුවන්ට බරපතළ පෝෂණ ගැටලුවක් නිර්මාණය වී ඇති බවද පෙන්වා දුන්නේය. විපක්ෂ නායකවරයා මේ බව පැවසුවේ සමඟි ජනබලවේගයේ ප්‍රධාන කාර්යාලයේ දී පෙරේදා (05) පැවැති කළුතර දිස්ත්‍රික් සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ගේ හමුවකදී ය.

## ජාතික ජන...

එම යෝජනා, ඉදිරියේදී 21 ව්‍යවස්ථාව පිළිබඳ සිදු වන පාර්ලිමේන්තු ක්‍රියාවලියේ දී ඉදිරිපත් කරන බව පැවසූ විජිත හේරත් මහතා ජාතික ජන බලවේගයේ නීතිඥ කණ්ඩායම සහ දේශපාලන කණ්ඩායම එක්ව ඒවා සකස් කර ඇති බවද සඳහන් කළේය.

## ක්‍රිකට් ප්‍රවේශපත්‍රවල...

මෙමගින් ලක්ෂ ගණනක මුදල් රජයට පරිත්‍යාග කිරීමට හැකිවන බව විශ්වස කෙරේ. ඔස්ට්‍රේලියා පිලේ ශ්‍රී ලංකා සංචාරය ක්‍රිකට් ක්‍රීඩාවට මෙන්ම ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ද විශාල වටිනාකමක් ලැබෙන බවද ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම්වරයා සඳහන් කළේය. දෙරට අතර ක්‍රිකට් තරගාවලියෙන් ශ්‍රී ලංකාවට ඇමෙරිකන් ඩොලර් මිලියන 2.5ක පමණ විදේශ විනිමය ලැබෙනු ඇතැයි ගණන් බලා තිබේ.

01 වැනි පිටුවෙන්....

## වක්වැල්ලේ බස්වලින්...

ගාල්ල වක්වැල්ල ප්‍රදේශයේ වාහන සඳහා සේවා සපයන ආයතනයක නතරකොට තිබූ පෞද්ගලික බස්රථ දෙකක ඩීසල් මූඩි කඩා ඩීසල් සොරකම් කරගෙන ගොස් තිබූ අතර නිවෙස්වල නවතා තිබූ වාහන සහ යතුරු පැදි කිහිපයකද ඩීසල්, පෙට්‍රල් සොරාගෙන ගොස් තිබූ බව වාහන හිමියෝ පැවසූහ. දින දෙක තුනක් පෝලිම්වල සිට බස්රථවලට සපයා ගන්නා ඩීසල් සොරකම්කරගෙන යාම නිසා තමන් දැඩි අසරණ තත්වයට පත්ව ඇති බවද පුද්ගලික බස්රථ හිමියෝ පවසති. ගාල්ල වක්වැල්ල ප්‍රදේශයේ පෞද්ගලික බස්රථ සඳහා සේවා සපයන ආයතනයක හිමිකරුවකු මෙන්ම බස්රථ හිමියකු වන ජස්ටින් කළුපහන මහතා මෙසේ කිවේය.

“තෙල් සොරකම් කිරීම නිසා පෞද්ගලික බස්රථ හිමියන් මේ වනවිට ගැටළු රැසකට ලක්වෙලා තියෙනවා. ඉතා අපහසුවෙන් තමයි තෙල් සපයාගෙන බස් කර්මාන්තය කරගෙන යන්නේ. නමුත් සොරුන්ගෙන් බස්රථවල තියෙන තෙල්ටික ආරක්ෂා කරගන්න විදියක් නැහැ. තෙල් සොරකම් කරගෙන යාමට පැමිණි එක් අයකුගේ යතුරුපැදිය පොලිසියට භාර දුන්නා. සී.සී.ටී.වී. කැමරාවල තොරතුරු තියෙනවා. මේ ගැන පොලිසියට දැනුම් දීලා තියෙනවා. බස්රථවලින් ලබා ගන්නා ආදායමෙන් තෙල්ගහන එක විතරයි කරන්න පුළුවන්. ලිසිං ගෙවන්න තියෙනවා. තෙල් ටිකත් හොරා අරගෙන ගියොත් කොහොමද මේ ව්‍යාපාරය කරගෙන යන්නේ”

## පෙරේදා රිය...

මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 33ක් වන ගලෙන්බිඳුණුවැව නාමල්පුර පදිංචිකරුවෙකි. පනාමුර පොලිස් වසමේ පනාමුර මිද්දෙණිය මාර්ගයේ ලොරි රථයක් මාර්ගය අයිනේ සිටි දරුවකුගේ ගැටී මාරක අනතුරක් සිදුව ඇති අතර දරුවා ඇඹිලිපිටිය රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් තිබේ. මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 14ක් වන පනාමුර මිද්දෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කඩවත පොලිස් වසමේ කිරිල්ලවල මහා විදුහල අසලදී යතුරුපැදියක් යතුරුපැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිවීමෙන් පෙරලී පහන් කණුවක ගැටී සිදුවූ අනතුරෙන් යතුරුපැදිකරු රාගම රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇත. මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 27ක් වන අනුරාධපුර ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කොබෙයිගනේ පොලිස් වසමේ කඩවලගෙදර හල්මිල්ලකොටුව ප්‍රදේශයේ යතුරුපැදියක් පදිකයකුගේ ගැටීමෙන් සිදුවූ අනතුරෙන් බරපතළ තුවාල ලැබූ පදිකයා කොබෙයිගනේ රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් තිබේ. මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 76ක් වන කොබෙයිගනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කටුපොත පොලිස් වසමේ රඹෑව මාර්ගයේ නෙළුම්කනුව හන්දියේදී ලොරි රථයක ඇතිවූ කාර්මික දෝශයක් හේතුවෙන් මාර්ගය අයිනේ නවතා තිබියදී යතුරුපැදියක් ලොරිරථයේ පිටුපස ගැටී සිදුවූ අනතුරෙන් යතුරුපැදිකරු මියගොස් තිබේ. මෙලෙස මියගොස් ඇත්තේ වයස අවුරුදු 24ක් වන මැටියගනේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

## රාජ්‍ය සේවා...

දිවයින පුරා පොලිස් ස්ථාන 182කට දේශපාලන බලපෑම් මත පොලිස් ස්ථානාධිපතිවරුන් පත් කළ බවට පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න මහතා කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් මෙන්ම එම සිදුවීම් දෙකටම අදාළව පොලිස්පතිවරයා සිය බලය ඉක්මවා කටයුතු කර ඇති බව රාජ්‍ය සේවා කොමිසමට නිරීක්ෂණය වී ඇත.

එම සිද්ධීන් දෙක සම්බන්ධයෙන් වාර්තා දෙකක් දින හතක් තුළ දෙන ලෙස කොමිසම පොලිස්පතිවරයාට දැනුම් දී තිබේ. ඒ අනුව පොලිස්පතිවරයා විසින් දී ඇති වාර්තා දෙක සම්බන්ධයෙන් ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ අවසන් තීරණයක් අද දිනයේදී ගැනීමට නියමිත බවද වැඩිදුරටත් වාර්තා වේ.

# මහජන නියෝජිතයන්ගේ පමණක් නොව ඡන්ද දායකයන්ගේද ගැටලුවක් පවතිනවා

## වෘත්තීයවේදීන්ගේ සමුළුවේදී අගමැති කියයි

**ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ**

මහජන නියෝජිතයන්ගේ පමණක් නොව ඔවුන් පත් කර ගන්නා ඡන්දදායකයන්ගේද ගැටලුවක් පවතින බව අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.

පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී අපට ඉදිරි කාලය සඳහා ඩොලර් බිලියන 7ක් අවශ්‍ය බවත් ඒ සඳහා අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යායුතු බවත් ප්‍රකාශ කළ නිසාවෙන් තමා පාර්ලිමේන්තුවෙන් ඉවතට විසි කිරීමට ඡන්දදායකයන් තීරණය කළ බවත් වික්‍රමසිංහ මහතා කීය.

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා මේ බව සඳහන් කළේ රකිමු ජයතු ලංකා සංවිධානය සහ නිර්මාණශීලී වෘත්තිකයන්ගේ සංවිධානය විසින් කොළඹ පදනම් ආයතනයේදි පසුගිය 03 දා ද්විත්ව අර්බුදය යන තේමාව යටතේ පවත්වනු ලැබූ වෘත්තියවේදීන්ගේ සමුළුවේදී සිදු කෙරුණු සංවාද මණ්ඩපයේදී ඒයට සහභාගි වී සිටි වෘත්තියවේදීන් ඉදිරිපත් කළ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

ඒහිදී ඉදිරිපත් වූ ප්‍රශ්න සහ ඒවාට අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ලබාදුන් පිළිතුරු මෙසේය.

ආදිත්‍ය බණ්ඩාර මහතා - (ඩිජිටල් අලෙවිකරණ ක්ෂේත්‍රය )

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල 15ක් තිබුණද සෑම වසරකම ඊට ඇතුළත් වීමට අවස්ථාව හිමිවන්නේ උසස් පෙළට පෙනී සිටින සිසුන් 350,000 අතරෙන් සිසුන් 30,000ක් පමණ පිරිසකට පමණයි. ඒ නිසාවෙන් දේශීය විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා අවස්ථාව හිමිවන සිසුන් පිරිස ඉතාමත් සුළුතරයකි. එමෙන්ම විද්‍යාර්ථීන් බහුතරයකට නවීන ලොවට අවශ්‍යවන මෘදු කුසලතා නොමැති වීමක්ද පෙන්නුම් කෙරේ. බහුතරයක් දෙනා පවතින තත්ත්වය වෙනස් කිරීමට කැමැත්තක් දක්වන කාලයක ඔබතුමා විසින් පවතින අධ්‍යාපන රටාව වෙනස් කිරීම සඳහා ගැනීමට අපේක්ෂා කරන පියවර මොනවාද?

**රනිල් වික්‍රමසිංහ මහතා -**

මා විසින් මේ පිළිබඳව අධ්‍යාපන ඇමැතිවරයා සමඟ සාකච්ඡාවක් සිදු කළා. ප්‍රාථමික සහ ද්විතික අධ්‍යාපන ක්‍රමයේ වෙනස්කම් රැසක් සිදුවිය යුතුයි. අප විසින් 21 වැනි ශතවර්ෂයේ අවශ්‍යතා සහ 04 වන කාර්මික විප්ලවයේ ඉස්මතු වුණු කරුණු කෙරෙහි වඩාත් සංවේදී විය යුතුයි. අප විසින් මීට පෙර ද්විතියික වෘත්තීය පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සිටියද එය නවතා දැමුණා. නැවතත් එය ක්‍රියාත්මක කිරීමට ඇමැතිවරයා සමඟ සාකච්ඡාවක් සිදු කළා. ඉන් අනතුරුව ගුරු පුහුණුවද වැඩි දියුණු කිරීමට කටයුතු කළ යුතුයි.

එමෙන්ම පන්තියක සිසුන් 35 දෙනකුට ඉගැන්වීමට තරම් ප්‍රමාණවත් ගුරුවරු ප්‍රමාණයක් සිටින බවට සහතික කර ගත යුතුයි. අපගේ රටේ විශාලතම පාසල් ඇතැම් විට විශ්ව විද්‍යාල වලටත් වඩා විශාලයි. උදාහරණ ලෙස රාජකීය විදුහල, ඩී-එස් සේනානායක විදුහල සහ ආනන්ද විදුහල දෙස බලන්න. ඇතැම් ගම්බද පාසල් වලද තත්ත්වය එසේමයි. ප්‍රමාණවත් තරම් ගුරුවරුන් පිරිසක් නොමැතිව පාසලක නිසි ප්‍රමිතියක් පවත්වා ගෙන යා හැකිද?

අපගේ බහුතර ශිෂ්‍ය පිරිසක් උසස් අධ්‍යාපනය ලැබීම සඳහා විදෙස්ගත වීමේ ප්‍රවණතාවයක් තිබෙනවා. ඊට හේතුව උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් විෂයයන් ප්‍රමාණයක් රටේ නොපැවතීමයි. පුළුල් විෂය පරාසයක් ඇති කළහොත් බහුතර ශිෂ්‍ය ප්‍රජාවක් මෙරට තුළ රඳවා ගත හැකියි.

එමෙන්ම උසස් අධ්‍යාපනය ලැබීම සඳහා විදේශීය ශිෂ්‍යයන්ද මෙරටට ගෙන්වා ගත හැකියි. ඉන් රටට විශාල විදෙස් ආයෝජන ප්‍රමාණයක් ලැබිය හැකියි. අපගේ ශිෂ්‍යයන්ටද එම විශ්ව විද්‍යාලවල රජය මඟින් පිරිනමන සහන ණය යටතේ අධ්‍යාපනය ලැබිය හැකියි. අප විසින් නැඟිය යුතු ප්‍රශ්නය වන්නේ පෞද්ගලික විශ්ව විද්‍යාල කෙරෙහි පවතින විරෝධයට ඇති පදනම කුමක්ද යන්නයි. ලොව අන් කිසිදු රටකද 100%ක්ම රජයේ විශ්ව විද්‍යාල නොපවතී. එහෙත් රාජ්‍ය නොවන විශ්ව විද්‍යාල පවතින අතර ඒ සඳහා ශිෂ්‍යයන්ට දීමනාවක් සපයයි. ඒ සඳහා ඔවුන්ව නිර්ණායකයකට අදාළව තෝරා ගනු ලබයි. අප විසින් නැඟිය යුතු ප්‍රශ්නය වන්නේ අපට පුළුල් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයක් අවශ්‍යද? නැද්ද? යන්නයි. එමෙන්ම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සිටිය යුත්තේ පාරේ සටන් වදිමින්ද? නැතහොත් සිය දේශන ශාලා තුළද යන්නද යන්නත් නැඟිය යුතු ප්‍රශ්නයකි.





**ප්‍රශ්නය -**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුද්ගලයන් කිහිප දෙනකු විසින් හසුරුවන බවක් පෙන්වයි. වර්තමානයේ රටේ පවතින ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම සඳහා දිගු කාලීන ද්විපාර්ශ්වික ආර්ථික සැලැස්මක් අවශ්‍ය බව පෙනී යන කරුණකි. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කිසිදා දිගු කාලීන සැලැස්මක් තිබී නොමැත. ආර්ථිකය කඩා වැටුණු අනෙකුත් රටවල් හා සැසඳීමේදී යළි ගොඩ නැඟීම සඳහා දශකයක් පමණ කාලයක් ගත වනු ඇතැයි සිතිය හැක. ගරු අගමැතිතුමනි, මේ අර්බුදය ඉතාමත් කෙටි කාලයකින් විසඳීමට ඔබතුමා සතු කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන සැලසුම් කවරේද?

**අගමැතිවරයා-**

මා විසින් අපේක්ෂා කරන්නේ ආර්ථික ස්ථාවරත්වය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළු විදෙස් ආධාර සහිතව මේ වසරේදීම ළඟා කර ගැනීමට හැකිවනු ඇති බවයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කරා මීට පෙර නොයාම නිසාවෙන් දැනටමත් අපි වන්දි ගෙවමින් සිටිනවා. මේ වසරේදී ස්ථාවරකරණය කළද එළඹෙන 2023 වසරේ ගෝලීයව දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය අවම අගයක පවතිනු ඇත.

එහෙත් 2024 සිට අපට ඉදිරියට යා හැකියි. මා විසින් අපේක්ෂා කරන්නේ 2025 වන විට සමතුලිත අය වැයක් හෝ ප්‍රාථමික ශේෂ අතිරික්තයක් කරා අපට යොමු විය හැකි වනු ඇති බවයි. ඒ සඳහා ව්‍යුහාත්මකව මනා විනයක් පවත්වා ගත යුතුයි. අපගේ ව්‍යාපාරද ඉතාමත් තරඟකාරී රටාවකට හුරු විය යුතුයි. 2025 සිට 2050 වන තෙක් ආර්ථික වර්ධනයක් ඇති කරන ප්‍රතිපත්තීන් අනුගමනය කළ යුතුයි. 2048 වන විට අප බ්‍රිතාන්‍යයෙන් නිදහස ලබා ශත වර්ෂයක් වනු ඇත. ඒ කාලය වන විට ශ්‍රී ලංකාව තිබිය යුත්තේ කොතැනද කියා මා ඔබෙන් ප්‍රශ්න කරනවා. එම තීරණය ඔබ සතුයි.

**ප්‍රශ්නය-**

දැනට පවතින මහජන මතය අනුව රජයට වැයවෙන විශාලතම වියදම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225ක් සහ ප්‍රාදේශීය සහ පළාත් සභාවල සාමාජිකයන් නඩත්තු කිරීමට යන වියදමයි. උදාහරණයක් ලෙස වසර පහක සේවයෙන් පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ජීවිත කාලයටම විශ්‍රාම වැටුප හිමිවේ. එමෙන්ම සිය දරුවන් ඇතුළු ඥාතීන්ටද සිය කාර්යාල තුළ රැකියා ලබාදිය හැකිය. මේ තත්ත්වය යටතේ ඔබතුමා විසින් පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කිරීමටත් පාර්ලිමේන්තුවේ ක්‍රියාපටිපාටිය කෙරෙහි ජනතා විශ්වාසය ගොඩනැඟීමටත් කටයුතු කරන්නේ කෙසේද?

**අගමැතිවරයා -**

අප විසින් මහජන ඡන්දයෙන් අපේක්ෂකයන් තෝරා පත් කරගන්නා ආයතන කෙරෙහි නැවත හැරී බැලිය යුතුයි. සමහර රටවල එම ආයතන ශ්‍රී ලංකාවට වඩා පුළුල් ඒවායි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ කතෝලික පල්ලි සඳහා වෙනම සභාවක් නැත, එනම් සෑම ග්‍රාම සේවක වසමක් සඳහාම සභාවක් ලෙස පිහිටුවන සභාවකි.

ඇතැම් රටවල් එවැනි ආයතන රැසක් පැවතිය යුතු බව විශ්වාස කරනවා. එහෙත් ඔබතුමා මේ ප්‍රශ්නය නඟන්නේ ඇයි? ඒ ඔබ විසින් ඡන්දයෙන් පත් කරන ලද නියෝජිතයන් කිසිවක් නොකරන බව විශ්වාස කරන නිසා සහ ඔවුන් සොරුන් බව විශ්වාස කරන නිසායි. එහෙත් ඔවුන්ව පත් කළේ කවුරුන් විසින්ද? මා විසින් ඔබෙන් නඟන පැනය එයයි.

ඔවුන්ව පත් කළේ කුමන හේතුවක් නිසාද? පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී මා අපට ඩොලර් බිලියන 7ක් අවශ්‍ය බවත් අප ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යායුතු බවත් ප්‍රකාශ කළ නිසාවෙන් මා පාර්ලිමේන්තුවෙන් ඉවතට විසි වුණා. ඉන් පෙනී යන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පමණක් නොව ඡන්ද දායකයන්ගේද ගැටලුවක් පවතින බවයි.



**මිනෝලි රණසිංහ මහත්මිය-**

**(මීහල්ල හෝල්ඩිංග්ස් හි ආයෝජක සබඳතා ප්‍රධානී)**

ශ්‍රී ලංකාව මත බර පටවන වත්මන් ගෝලීය සහ දේශීය ආහාර අර්බුදය කෙටි කාලීනව විසඳීමට ඔබ සැලසුම් කරන ආකාරය සහ අපේ ජාතියේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමට ඔබේ දිගුකාලීන සැලසුම් මොනවාද?

**අගමැතිවරයා -**

කෙටි කාලීනව අපට පොහොර සහ ඩීසල් සොයා ගැනීමට අවශ්‍යයි. අප සතුව ඒවා තිබේ නම්, ඔබට පෙරට ගොස් සාර්ථක වගා කන්නයක් ලබා ගත හැකිය. එය පළමු ප්‍රශ්නය. පොහොර නොමැතිව වගා කළ හැකි බෝග තිබේ. කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ආහාර සුරක්ෂිතතා කමිටු පිහිටුවීමට කටයුතු කරනවා. නමුත් එය සැලසුම් සහගත ක්‍රියාවලියක් විය යුතුය, බෙදා හැරිය නොහැකි අතිරික්ත ආහාර බෙදා හැරීම සැලසුම් කිරීමට දිස්ත්‍රික් කෘෂිකාර්මික නිලධාරීන් සහ අනෙකුත් සැපයුම් දාමය ලබා ගැනීමට සිදු වෙනවා. අපිට බස්නාහිර පළාතේ ප්‍රශ්නයක් තියෙනවා. පීඩනය අඩු කිරීම සඳහා හිස් බිම්වල සහ නිසැකවම ඔබේ ගෙවත්තේ සහ සමහර විට බැල්කනියේ වගාවන් රාශියක් සිදු කළ යුතුයි . අපට අතිරික්තයක් ඇති කළ හැකි නම්, අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා ඉතා සහනදායී මිලකට වෙනත් ආහාර ලබා දීමට අපට හැකි වේ.

හිටපු ඇමැතිවරුන් වන වජිර අබේවර්ධන, සාගල රත්නායක, අකිල විරාජ් කාරියවසම් මහත්වරුන් ඇතුළු වෘත්තියවේදීහු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

ඡායාරූප - හිරන්ත ගුණතිලක

## ලෝක පරිසර දිනයට සමගාමීව ගුවන් හමුදාවෙන් වගා සංග්‍රාම ව්‍යාපෘතියක්



**මහින්ද අලුත්ගෙදර**

කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා දායකත්වය ලබාදෙමින් ලෝක පරිසර දිනයට සමගාමීව වගා සංග්‍රාම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව පියවර ගෙන තිබේ.

ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ මහතාගේ උපදෙස් මත මේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් සියලුම ගුවන් හමුදා කඳවුරු ආවරණය වන පරිදි වගා සංග්‍රාරාම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙන බව ගුවන් හමුදා මාධ්‍ය අධ්‍යක්ෂ ගෲප් කැප්ටන් දුෂාන් විජේසිංහ මහතා පවසයි.

ශ්‍රී ලංකාවට ඉදිරියේ දී ඇතිවිය හැකි ආහාර අර්බුදයට යම් විසදුමක් ලබාදීමේ අරමුණින් මේ වගා සංග්රාම ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන අතර මෙහිදී කෙටි කාලයක් තුළ අස්වැන්නක් ලබා ගැනීමට හැකි බෝග වර්ගයන් වගාකිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් එවැනි බෝගයන් වගා කිරීම ආරම්භ කළ බවද ඒ මහතා ප්‍රකාශ කරයි.

මේ වගා ව්‍යාපෘතිය ගුවන් හමුදා විධායක කෘෂි ඒකකයේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබන අතර මේ වනවිටත් වගාවන් සිදුකරගෙන යනු ලබන ගුවන් හමුදා කඳවුරුවල ගොවිබිම් ප්‍රමාණය වැඩි කිරීමටත් සියලුම ගුවන් හමුදා කඳවුරු තුළ නව ගොවිබිම් ඇති කිරීමටත් පියවර ගෙන ඇත.

ඉදිරියේ දී මේ වගා ව්‍යාපෘතින් මඟින් ලබාගන්නා අස්වනු ප්‍රමාණයන් ගුවන් හමුදා සාමාජිකයන් හට මෙන්ම සිවිල් පුද්ගලයන් වෙත ද ඉතා සහනදායි මිල ගණන් යටතේ ලබාදීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව බලාපොරොත්තු වන අතර එම අස්වනු බෙදා හැරීම නිසි ක්‍රමවේදයක් යටතේ සිදුකිරීම සඳහා මේ වනවිටත් කටයුතු සංවිධාය කර ඇත.

## සිරකරු ශ්‍රමය ඵලදායිව යොදා ගැනීමේ යෝජනාවලිය අධිකරණ ඇමැතිට

**බුද්ධිකා ඉඹුලාන**

කෘෂිකාර්මික කටයුතු ඇතුළු අනෙකුත් කර්මාන්ත කටයුතු සඳහා සිරකරුවන්ගේ ශ්‍රමය ඵලදායී ලෙස යොදා ගැනීම සම්බන්ධව බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ යෝජනාවලිය බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා විසින් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමැති ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා වෙත පිළිගැන්වීම ඊයේ (06) අධිකරණ අමාත්‍යාංශයේදී සිදු කෙරිනි.



බන්ධනාගාරගත රැඳවියන් කෘෂිකාර්මික කටයුතු ඇතුළු අනෙකුත් කර්මාන්ත කටයුතු සඳහා ඵලදායී ලෙස යෙදවීම, ඉදිරියේදී ආහාර හිඟයක් ඇති වුවහොත් ඒ සඳහා මුහුණදීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවතින වගා නොකළ ඉඩම් වගා කටයුතු සඳහා යෙදවීම, දැනට සිදු කරනු ලබන වගා කටයුතු තවදුරටත් වැඩි දියුණු කිරීම, කෘෂි කර්මාන්ත කටයුතු සඳහා කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීම, කර්මාන්ත කටයුතු සඳහා සිරකරුවන් යෙදවීම පිළිබඳව මෙහිදී විශේෂයෙන් අවධානය යොමු විය.

මෙහිදී අදහස් පළ කරමින් අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා සඳහන් කළේ ඉදිරියේදී ඇතිවීමට නියමිත ආහාර හිඟයට මුහුණ දීම සඳහා කෙටි කාලීන භෝග වගා කිරීමට යොමු විය යුතු බවයි. වගා කටයුතු සඳහා යොමු වීමේ කඩිනම් හා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් අවශ්‍ය බවත්, ඒ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගන්නා ලෙසත්, බන්ධනාගාරගත සිරකරුවන්ගේ ශ්‍රමය ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කරන ලෙසත් ඇමැතිවරයා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා ප්‍රමුඛ නිලධාරින්ට මෙහිදී උපදෙස් ලබා දුන්නේය.

මේ වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින බන්ධනාගාර 18 ක කර්මාන්ත 20 කට අධික සංඛ්‍යාවක සිරකරුවන් නිරත වන අතර ඒ අතරින් බන්ධනාගාර 13 ක කෘෂි කර්මාන්ත කටයුතු සිදු කරනු ලබයි.මේ කරුණු සලකා බලමින් ඇමැතිවරයා උපදෙස් ලබා දුන්නේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එක්ව ඉදිරි දින කිහිපය තුළ කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කර බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් කෙටි කාලීන භෝග වගා කිරීම සඳහා යෙදවීමට පියවර ගන්නා ලෙසයි. බන්ධනාගාර රැඳවියන්ගේ ශ්‍රමය ඵලදායී ලෙස යොදා ගැනීමටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස ඇමැතිවරයා මෙහිදී නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වසන්තා පෙරේරා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් මේජර් ජනරාල් දර්ශන හෙට්ටි ආරච්චි, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අනුර විජේතුංග යන මහත්ම මහත්මීන් ඇතුළු අධිකරණ අමාත්‍යාංශයේ හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීහු මේ අවස්ථාව සඳහා එක්ව සිටියහ.







## ඔස්ට්‍රේලියාවට එරෙහි පළමු විස්සයි20 ගැටුම අදයි

# වැස්සේ නැත් නම් ගින්දර සටනක්

**ප්‍රින්ස් ගුණසේකර**

සංචාරක ඔස්ට්‍රේලියා පිල හා ශ්‍රී ලංකාව අතර ක්‍රිකට් තරගමාලාව ආරම්භ කරමින් පළමු විස්සයි 20 තරගය කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේදී අද පස්වරු 7ට ආරම්භ වෙයි. මේ දිනවල ඇද හැලෙන වර්ෂාවෙන් බාධාවක් නොවී නියමිත වේලාවට තරගය ආරම්භ කිරීමට වාසනාව ලැබුණ හොත් මේ තරගය වඩාත්ම උණුසුම් මුහුණුවරක් ගනු නිසැකය. මන්ද යත් තරග තුනකින් සමන්විත විස්සයි 20 තරගාවලියේ ආරම්භක ජයග්‍රහණය සාර්ථක තරගාවලියක නිමාව උදෙසා කණ්ඩායම් දෙකටම අතිශය වැදගත් වන බැවිනි.

වත්මන් විස්සයි 20 ලෝක ශූර ඔස්ට්‍රේලියා පිල වසර 6කට පසුව ආකෘති තුනේම සම්පූර්ණ තරගාවලියකට පැමිණි පළමු අවස්ථාව මෙය බැවින් ශ්‍රී ලංකා ප්‍රේක්ෂකයෝ ද තරගාවලිය නැරඹීම උදෙසා විශාල උනන්දුවකින් පසු වෙති. අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලයේ විස්සයි 20 ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාව 9 වැනි ස්ථානයේ පසුවන අතර, ඕස්ට්‍රේලියාව මේ වන විට 5 වැනි තැන සිටී.

ඔස්ට්‍රේලියාව හා ශ්‍රී ලංකාව විස්සයි 20 තරග බිමේදී මුල් වරට හමු වන්නේ වසර 2007දී දකුණු අප්‍රිකාවේ දී පැවති පළමු ලෝක කුසලාන තරගාවලියේ දී වන අතර, එම තරගාවලියේ දී ශ්‍රී ලංකාව කඩුලු 10කින් පරාජය කිරීමට ඔස්ට්‍රේලියාව සමත් වේ. එතැන් සිට මේ දක්වා දෙරට අතර විස්සයි විස්ස තරග 22ක් පවත්වා ඇති අතර, ඉන් තරග 12ක ජයග්‍රහණ හිමි වන්නේ සංචාරකයන්ට වන අතර, තරග 9ක ජයග්‍රහණ ශ්‍රී ලංකාව සතු කර ගත්තේය. මේ වසරේ ශ්‍රී ලංකා පිල ඔස්ට්‍රේලියාවේ කළ සංචාරයේදී මෙල්බර්න්හිදී පැවැති තරගය ලකුණු සම වූ අතර, පසුව සුපිරි ඕවරයේදී ඔස්ට්‍රේලියාවට ජය හිමි විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ දී පැවති විස්සයි20 ලෝක කුසලාන තරගාවලියේ ජයග්‍රාහකයන් බවට පත් වූ කැන්ගරුවෝ අනතුරුව සහභාගී වූ තරග ලැයිස්තුවේදී ශ්‍රී ලංකාවට එරෙහිව 4-1ක සහ පාකිස්තානයට එරෙහිව 1-0ක ජයග්‍රහණයක් ලබා අපරාජිතව සිටිති. ශ්‍රී ලංකාව මේ විස්සයි20 තරගාවලියට අවතීර්ණ වන්නේ ඩුබායි ලෝක කුසලානයෙන් පසුව ඔස්ට්‍රේලියාව සමඟ තරගාවලියේ 4-1ක සහ ඉන්දියාව සමඟ 3-0ක පරාජයක් සමගින් වුවද කිසිදු මානසික බිඳ වැටීමක් නැති බව නායක දසුන් ශානක ඊයේ පැවැති මාධ්‍ය හමුවකදී පැවැසීය.

"ප්‍රබල ඉන්දීය ප්‍රීමියර් ලීග් තරගාවලියට ක්‍රීඩා කළ කිහිප දෙනකුම අපේ කණ්ඩායමේ ඉන්නවා. ඔවුන්ට විස්සයි20 අන්තර්ජාතික අත්දැකීම් ඇති එම තරගාවලිය හොඳින් නිමා කළ අය. අපට මේ තරගාවලියේ හොඳ අවස්ථාවක් තියෙනවා ඉදිරියට යන්න. විස්සයි20 ක්‍රීඩා පිටියේ හොඳම පිතිකරුවන් අප සතුව සිටිනවා. ඒ වගේම සෑම අංශයකින්ම දස්කම් දක්වන ක්‍රීඩකයන් සිටිනවා. පන්දු යවන්නන්ගේ අංශයත් හොඳ ශක්තිමත් තත්ත්වයක තිබෙනවා. අපේ සියලු ක්‍රීඩකයන් අනවශ්‍ය පීඩනයකින් තොරව සැහැල්ලුවෙන් ක්‍රීඩා කරනවා" දසුන් ශානක පැවැසීය.

විස්සයි20 පිටියේ ප්‍රමුඛයා මෙන්ම දැවැන්ත ප්‍රහාරකයා ලෙස හැඳින්වෙන නායක දසුන් ශානක මේ තරගාවලියේ දී තවත් ලකුණු 53ක් ගත හොත් මෙරට විස්සයි20 පිටියේ ලකුණු 1,000ක් වාර්තා කළ 8 වැනි පිතිකරුවා බවට පත්වනු ඇත.

ශ්‍රී ලංකාවෙන් බිහි වූ සාර්ථකම විස්සයි 20 ක්‍රීඩකයා ලෙසින් විචාරකයන්ගේ ඇගයීමට ලක්ව ඉන්දීය ප්‍රීමියර් ලීග් තරගාවලියේදී ඉන්දීය රුපියල් කෝටි 10.75කට අලෙවි වූ 24 වියැති වනිඳු හසරංග මෙතෙක් විස්සයි 20 අන්තර්ජාතික තරග 35කට ක්‍රීඩා කොට ඉනිම් 33කදී කඩුලු 57ක් බිඳ හෙළා සිටී. ඔහු ඉන්දීය ප්‍රීමියර් ලීග් තරගාවලියේ දී තරග 16ක දී කඩුලු 26ක් ලබා ගනිමින් එම තරගාවලියේ පන්දු යවන්නන් අතුරින් දෙවැනි තැන දිනා තවමත් ගත වූයේ සතියක පමණ කාලයකි. වනිඳු අවසන් වරට සහභාගී වූ අන්තර්ජාතික විස්සයි20 තරග 5කදී කඩුලු 13ක් ලබා ගනිමින් දක්ෂතා දැක්වීම ශ්‍රී ලංකා බලාපොරොත්තු ඉහළ දැමීමකි. භානුක රාජපක්ෂ, කුසල් මෙන්ඩිස්, ධනුෂ්ක ගුණතිලක, චරිත් අසලංක හා පැතුම් නිශ්ශංක ශ්‍රී ලංකා ඉදිරිපෙළ ශක්තිමත් කරන මුල් පුරුක් බවට පත්ව සිටිති.

ශ්‍රී ලංකා සංචිතයට නම් කළ නවක ක්‍රීඩකයන් වන නුවනිඳු ප්‍රනාන්දු එංගලන්ත සංචාරයේදී ශ්‍රී ලංකා සංවර්ධන සංචිතයට ක්‍රීඩා කළ අතර, මහීෂ් තීක්ෂණ අයිපීඑල් තරගාවලියේදී චෙන්නායි සුපර් කිංග්ස් කණ්ඩායමට ක්‍රීඩා කිරීම ප්‍රධානතම පුවතක් බවට පත් විය. නුවනිඳු සමග තීක්ෂණ ඔස්ට්‍රේලියා පිතිකරුවන්ට හිසරදයක් වීම වැළැක්විය නොහැකිය.

පිතිකරණයේ දී හිත් පිත් නොමැති ශක්තිමත් අසරුවකු බඳු ඇරොන් ෆින්ච් ලැබෙන පළමු අවස්ථාවේදීම දවා ගැනීම සෑම ප්‍රතිවාදියකු විසින්ම කළ යුතුය යන සිද්ධාන්තයක් ලෝක ක්‍රිකට් පිටියේ පවතී. ඔහු එතරම්ම භයානක පිතිකරුවෙකි. ෆින්ච් ශතක දෙකක් සහ අර්ධ ශතක 16ක් සමග විස්සයි20 පිටියේ තරග 89කදී ලකුණු 2741ක් රැස් කරගෙන සිටී. 35 වියැති වමත් ආරම්භක පිතිකරු ඩේවිඩ් වෝනර් මෙතෙක් තරග 88කට ක්‍රීඩා කරමින් ලකුණු 2554ක් රැස් කරගෙන සිටින අතර, ඉන්දීය ප්‍රිමියර් ලීග් තරගාවලියේ ක්‍රීඩා කළ අවසන් ඉනිම් 10දී අර්ධ ශතක 4ක් සමග ලකුණු 364ක් රැස් කර ඇත. ග්ලේන් මැක්ස්වෙල් ද පිත්තෙන් දස්කම් දක්වමින් සිටින ප්‍රබල පිතිකරුවකු වන අතර, මිචෙල් ස්ටාක්, මිචෙල් ස්වෙප්සන් හා මාකස් ස්ටොයිනිස් වැනි පන්දු යවන්නෝ ද කඩුලු අතර සිටිති.

**ශ්‍රී ලංකා විස්සයි20 සංචිතය:** දසුන් ශානක (නායක), පැතුම් නිස්සංක, ධනුෂ්ක ගුණතිලක, කුසල් මෙන්ඩිස්, චරිත් අසලංක, භානුක රාජපක්ෂ, නුවනිඳු ප්‍රනාන්දු, ළහිරු මධුශංක, වනිඳු හසරංග, චාමික කරුණාරත්න, දුෂ්මන්ත චමීර, කසුන් රාජිත, නුවන් තුෂාර, මතීෂ පතිරණ, රමේෂ් මෙන්ඩිස්, මහීෂ් තීක්ෂණ, ප්‍රවීන් ජයවික්‍රම, ලක්ෂාන් සඳකැන්.

**ඔස්ට්‍රේලියා විස්සයි20 සංචිතය:** ඇරොන් ෆින්ච් (නායක), ෂෝන් ඇබට්, ඇෂ්ටන් අගාර්, ජොස් හෙසල්වුඩ්, ජොෂ් ඉංග්ලිෂ්, මිචෙල් මාෂ්, ග්ලේන් මැක්ස්වෙල්, ජායි රිචර්ඩ්සන්, කේන් රිචර්ඩ්සන්, ස්ටීව් ස්මිත්, මිචෙල් ස්ටාර්ක්, මාර්කස් ස්ටොයිනස්, මිචෙල් ස්වෙප්සන්, මැතිව් වේඩ්, ඩේවිඩ් වෝනර්.

## ක්‍රිකට් තරගයට කාලගුණ අනාවැකියක්

**ප්‍රින්ස් ගුණසේකර**

**සංචාරක ඔස්ට්‍රේලියා ක්‍රිකට් පිල හා ශ්‍රී ලංකාව අතර පළමු විස්සයි 20 තරගය පැවැත්වෙන කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණය අවට ප්‍රදේශයට අද පස්වරුවේ ධාරානිපාත වර්ෂාවක් පිළිබඳ වාර්තාවක් නැති බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනාවැකි අංශයේ අධ්‍යක්ෂිකා ශිරෝමනී ජයවර්ධන මහත්මිය පවසයි. 'දිනමිණ' කළ විමසීමකදී ඇය පැවසුවේ සවස 6 පමණ වනවිට මිනිත්තු 10ක පමණ සුලු වර්ෂාවක් පතිතවීමට ඉඩ ඇති අතර, ක්‍රමයෙන් රාත්‍රිය එළැඹෙද්දී වර්ෂාවෙන් ඇති තර්ජනය පහව යනු ඇති බවය.**

**කෙසේ වුවද 8 වැනිදා (හෙට) කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණය අවට ප්‍රදේශයට වර්ෂාවෙන් කිසිදු බලපෑමක් නැති බවද ඇය සඳහන් කළාය.**

## ටිකට් 14,000ක් 'ඔන්ලයින්' ක්‍රමයට අලෙවි වෙලා



ටෙස්ට් කණ්ඩායමේ නායක දිමුත් කරුණාරත්න හා එක්දින, විස්සයි 20 නායක දසුන් ශානක ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම් මොහාන් ද සිල්වා, ප්‍රධාන විධායක ඈෂ්ලි ද සිල්වා මහත්වරු ක්‍රිකට් අනුග්‍රාහක ඩරාස් ආයතනයේ වෙළඳ ප්‍රධානී හේෂාන් පෙරේරා, මෝස් රෙදිපිළි වෙළඳ ප්‍රධානී කිත්මිනි ද සිල්වා හා ඩයලොග් ජ්‍යෙෂ්ඨ කළමනාකරු හර්ෂ සමරනායක මහත්ම මහත්මීහු සමග.

*ඡායාරූපය: සුදත් මලවීර*

**ප්‍රින්ස් ගුණසේකර**

සංචාරක ඔස්ට්‍රේලියා ක්‍රිකට් පිල හා ශ්‍රී ලංකාව අතර විස්සයි 20 තරගයේ ප්‍රවේශපත්‍ර 14000ක් 'ඔන් ලයින්' ක්‍රමයට අලෙවි වූ බව ශ්‍රී ලංකා ක්‍රිකට් ලේකම් මොහාන් ද සිල්වා මහතා පැවැසීය. කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේ සම්පූර්ණ ප්‍රේක්ෂක ධාරිතාව 35000ක් වන අතර, එයින් විශාල ප්‍රමාණයක් නවීණ තාක්ෂණය ඔස්සේ අලෙවි වීම නව ප්‍රවණතාවක් ලෙස සැලකේ.

"ඔන්ලයින් ක්‍රමයට ටිකට් මිලදී ගත් ප්‍රේක්ෂකයන්ට තවත් පහසු ක්‍රමයකට ප්‍රවේශ පත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කරනවා. ඔන්ලයින් ක්‍රමයට මුදල් ගෙවූ අය ටිකට් එක ගන්න කොළඹ ක්‍රිකට් මූලස්ථානය අසලට පැමිණීමෙන් සිදු වන අපහසුතාව වලක්වාලන ක්‍රමවේදයක් ගැන අප සාකච්ඡා කරමින් සිටිනවා" ලේකම්වරයා පැවැසීය.

කෙසේ වුවද මේ සංචාරයට පැමිණි ඔස්ට්‍රේලියා ක්‍රිකට් ක්‍රීඩකයන්ට රට වෙනුවෙන් ස්තූතිය පුද කරන බව ඒ මහතා පැවැසීය. "ඔස්ට්‍රේලියා රජය ශ්‍රී ලංකාවට හොඳ සහයෝගයක් දුන්නා. මේ වගේ අභියෝගාත්මක අවස්ථාවක ඔවුන්ගේ සහයෝගය අති විශිෂ්ඨයි. මේක ජනතාවට මානසික සහනයක් දීමේ හොඳම අවස්ථාවක්. දක්ෂ කණ්ඩායම් දෙකක හැකියාවන් අද සිට උරගා බලන්න පුළුවන්" මොහාන් ද සිල්වා මහතා පැවැසීය.

## සෙරන්ඩිබ් වෙතින් සාන්ත මේරීට ප්‍රබල ප්‍රහාරයක්

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය සංවිධාන කරන අන්තර් ක්‍රීඩා සමාජ ප්‍රමුඛතම චැම්පියන් ලීග් පාපන්දු ශූරතාවලියේදී මාවනැල්ල සෙරන්ඩිබ් ක්‍රීඩා සමාජය වෙතින් යාපනය සාන්ත මේරි ක්‍රීඩා සමාජයට ගෝල් 4-0ක ප්‍රබල ප්‍රහාරයක් එල්ල වෙයි. ඉන් ගෝල් තුනක්ම සෙරන්ඩිබ් ක්‍රීඩා සමාජයට ක්‍රීඩා කරන ඝානා ජාතික ඇසන්ට් එවාන්ස් වාර්තා කිරීම කැපී පෙනිණි.

කුරුණෑගල මාලිගාපිටිය ක්‍රීඩාංගණයේදී පෙරේදා පැවැති මේ තරගයේ පළමු භාගයේදී ගෝල් 2-0කින් ඉදිරියෙන් සිටීමට සෙරන්ඩිබ් ක්‍රීඩා සමාජය සමත් වූ අතර, වාර්තා වූ පළමු ගෝලය සාන්ත මේරි ක්‍රීඩා සමාජයේ ඇන්තනිපිල්ලෙයි ක්ලින්ටාස්ගේ අත්වැරදීමකින් වාර්තා වූ 'ඕන් ගෝලයක්' විය. තරගයේ 45, 64 හා 90 වැනි මිනිත්තුවලදී ඝානා ජාතික ඇසන්ට් එවාන්ස් ගෝල් වාර්තා කරමින් චැම්පියන් ලීග් පාපන්දු ශූරතාවලියේ සහභාගී වූ පළමු තරගයෙන්ම සෙරන්ඩිබ් ක්‍රීඩා සමාජයට පහසු ජයග්‍රහණයක් අත් කර දුන්නේය. දෙපිලම හොඳ තරගයක් දුන් අතර, අනවශ්‍ය නීති විරෝධී ප්‍රහාර නොමැති වීමෙන් එක් කහ කාඩ්පත් අවවාදයකට තරගය සීමා විය. තරග විනිසුරු ලෙස කුෂාන් ඉන්දික මහතා එක්වූ අතර, තරග කොමසාරිස් ලෙස ෂබීර් රහීම් මහතා ක්‍රියා කළේය.

සුගතදාස ක්‍රීඩාංගණයේ පැවැති සෝන්ඩර්ස් හා අනුරාධපුර සොලිඩ් අතර තරගය ජය පරාජයෙන් තොරව නිමාවට පත් විය. තරගයේ පළමු භාගයේ 16 වැනි මිනිත්තුවේදී සෝන්ඩර්ස් ක්‍රීඩා සමාජයේ ජ්‍යෙෂ්ඨතම ක්‍රීඩක ක්‍රිෂාන්ත අබේසේකර ගෝලයක් වාර්තා කළ අතර, එයට පිළිතුරු ලෙස සොලිඩ් පිලේ සමිත් මධුරංග 55 වැනි මිනිත්තුවේදී ගෝලයක් වාර්තා කළේය. සෝන්ඩර්ස් ක්‍රීඩකයන් දෙදනකුට හා සොලිඩ් ක්‍රීඩකයකුට කහ කාඩ්පත් අවවාදයක් ලැබිණි. මෙහි තරග විනිසුරු ලෙස ළහිරු මධුසංක මහතා එක් වූ අතර, තරග කොමසාරිස් ලෙස එම්. ෆායිස් මහතා කටයුතු කළේය.



ගෝල් 3ක් වාර්තා කළ ඝානා ජාතික ඇසන්ට් එවාන්ස්ට මොහොමඩ් ඉසෙදීන්ගෙන් සුබ පැතුම්.

## ප්‍රංස ටෙනිස් කිරුළ නඩාල්ට

ස්පාඤ්ඤයේ සුපිරි ටෙනිස් ක්‍රීඩක රෆායල් නඩාල් ප්‍රංස විවෘත ටෙනිස් ඉතිහාසයේ වාර්තාගත 14 වැනි කුසලානය දිනා ගැනීමට සමත් විය. පෙරේදා පැරිස් නුවර රෝලන්ඩ් ගැරොස් පිටියේ පැවැති අවසන් මහා තරගයේදී ලකුණු 6-3ක්, 6-3ක් සහ 6-0ක් ලෙස නෝර්වේ ජාතික කැස්පර් රූඩ් පරාජය කරමින් සිය ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් ශූරතා සංඛ්‍යාව 22 දක්වා ඉහළ දමා ගැනීමට ද ඔහු සමත් විය.

මේ වසරේ මුල් භාගයේ පැවති ඔස්ට්‍රේලියා විවෘත ටෙනිස් කුසලානයත් දිනා සිටින නඩාල් පිට පිට ග්‍රෑන්ඩ් ස්ලෑම් කුසලාන දෙකක් දිනා ගත්තේ දෙවැනි වතාවටය. ඊට පෙර ඔහු 2010 වසරේදී පිට පිට ග්‍රෑන්ඩ් ස්ලෑම් කුසලාන ත්‍රිත්වයක් දිනාගැනීමට සමත් වූයේ ප්‍රංස විවෘත ටෙනිස් කුසලානයට, විම්බල්ඩන් කුසලානයට සහ අමෙරිකා විවෘත ටෙනිස් කුසලානයට හිමිකම් කියමිනි.

ලෝක ටෙනිස් පිටියේ වැඩිම ග්‍රෑන්ඩ් ස්ලෑම් කුසලාන සංඛ්‍යාවක් දිනා ගැනීමේ වාර්තාව තව දුරටත් අලුත් කළ නඩාල් මේ දස්කම පෑවේ සිය 36 වැනි උපන්දිනයට දින දෙකකට පසුවය. ඒ අනුව ප්‍රංස ටෙනිස් කුසලානයක් දිනූ වයස්ගතම ක්‍රීඩකයා ලෙසත් ඔහු වාර්තා පොතට එක් විය. ඊට පෙර එම වාර්තාවට හිමිකම් කියනු ලැබුවේ ස්පාඤ්ඤයේම ඇන්ඩ්‍රිස් ජිමෙනෝ විසිනි. ඔහු 1972 වසරේදී ප්‍රංස ටෙනිස් කුසලානය දිනා ගන්නා විට 34 හැවිරිදි වියෙහි පසු විය.



## මෙතෝදිස්ත උසස් විදුහලට ක්‍රිකට් ශූරතාව

**නිරෝෂාන් ප්‍රියංකර**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය සංවිධාන කළ අන්තර් පාසල් අවුරුදු 19න් පහළ ක්‍රිකට් තරගාවලියේ තෙවැනි කොටසේ ටියර් 'ඒ' කාණ්ඩයේ ශූරතාව දිනා ගැනීමට මොරටුව පුවක්අරඹ මෙතෝදිස්ත උසස් විදුහල සමත් විය. මෙතෝදිස්ත විදුහල අපරාජිතයන් ලෙස මේ ශූරතාවට හිමිකම් කීම විශේෂත්වයකි.

මින්නේරිය ජෙනරාල් ලයනල් බලගල්ල ක්‍රීඩාංගණයේ (ගනර්ස් පිටියේ) පැවති තරගයෙන් මෙතෝදිස්ත පිල හමුවේ පසුගිය වසරේ අනුශූරයන් වූ යාපනය මැදි විදුහල කඩුලු 6කින් පරාජයට පත් විය.

මේ තරගයේ කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් යාපනය මැදි විදුහල් කණ්ඩායම ලකුණු 250කට සීමා කළ මෙතෝදිස්ත ක්‍රීඩකයෝ ඕවර 47.3කදී කඩුලු 4ක් පමණක් අහිමි කර ගනිමින් ජයග්‍රාහී ඉලක්කය පසු කර ගියහ.



කවින්

මෙතෝදිස්ත පිලට සාර්ථක ආරම්භයක් දුන් කවින් ප්‍රනාන්දු අගනා ලකුණු 141ක් රැස් කළේ පන්දු 123කිනි. ඔහුගේ ඉනිම හතරේ පහර 14කින් සහ හයේ පහර 6කින් වර්ණවත් විය.

යාපනය පිල වෙනුවෙන් ජයතීස්වරන් විතුසන් පන්දු 131කදී හතරේ පහර 9ක් සමග ලකුණු 86ක් රැස් කළ අතර, පන්දු යැවීමේදී සිහින ප්‍රනාන්දු ලකුණු 48කට කඩුලු 3ක් දවා ගත්තේය.

තරගාවලියේ ජය සංකේත ප්‍රදානය සඳහා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂිකා ලිලන්ති පෙරේරා, මෙතෝදිස්ත විදුහල්පතිනි දයානි අමරසූරිය, ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමයේ අවුරුදු 19න් පහළ තරගාවලියේ ලේකම් නිශාන්ත කුමාර සහ යාපනය මැදි විදුහල් ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම් ඥානවරෝදයන් මහත්ම මහත්මීනි ඇතුළු පිරිසක් එක් වූහ.

**යාපනය මැදි විදුහල** - 250 (ඕවර 49.1) ජයතීස්වරන් විතුසන් 86, මතීස්වරන් සංජයන් 31 (සිහින ප්‍රනාන්දු 48/3)

**මෙතෝදිස්ත උසස් විදුහල** - 251/3 (ඕවර 47.3) කවින් ප්‍රනාන්දු 141, තිසර ජයංග 43.



අනුල ද සිල්වා

## පහන අවිහිංසාව මැද බලු කතා

බල්ලා බොහෝ විට නිවෙස්වල සුරතලයට ඇති කරන සත්ත්වයෙකි. තම තමන්ගේ ආරක්ෂාව උදෙසා ද බල්ලන් ඇති කරන අය සිටිති. "බල්ලන්ගෙන් ප්‍රවේසම් වෙනු" යන බෝඩ් ලෑල්ල එයට නිදසුන්ය. බොහෝ විට ඒ ඇති හැකි නිවෙස්ය.

මීට වසරකට පමණ පෙර දිනක් එවැනි බෝඩ් ලෑල්ලක් ඇති නිවසක් ඉදිරියෙන් මා ගමන් කළේ බිය සැකෙන් තොරවය. තත්පරයක් ගත වූයේ නැත. බල්ලා පැමිණ මගේ දෙපා සපා කන්නට පටන්ගෙන තිබුණි. ඇස් වටය අසල දෙපාවල දහ දොළොස් පලකින් ලේ බේරෙද්දි මම බල්ලාගෙන් බේරී නිවසට පැමිණියෙමි. බල්ලා කිසියම් හේතුවකට නිවසින් පිට යවා තිබුණා විය හැක. මම කකුල්වල ලේ සෝදාහැර ළඟ සිටින වෛද්‍යවරයකු හමුවට ගොස් පිටගැස්මට දෙන එන්නත ලබා ගතිමි.

පසුව මගේ පුතා පැමිණ බල්ලා අයිති නිවසට ගොස් උගේ හැඳුනුම් පොත ඉල්ලද්දි නිවැසියන් එය ලබාදී ඇත්තේ දැඩි අකමැත්තකිනි. එහි ඇති සටහන් අනුව බල්ලාට වසර දෙකකින් එන්නත් ලබා දී නොතිබුණි. ඒ නිසා පිස්සු බලු එන්නත මා ලබා ගත යුතු විය. මා රෝහලට ගිය විට හෙදියන් මට බැණ වැදුණේ බල්ලා අපේ යයි සිතමිනි. බල්ලා අනුන්ගේ බව දැන ගත් ඔවිහු පසුව කාරුණිකව මට එන්නත ලබා දුන්හ. තුවාල සුව නොවීම නිසා මට රෝහල් ගතවන්නට ද සිදු විය. එන්නත් පෝලිමේ සිටි බොහෝ දෙනෙක් ඉබාගාතේ යන බල්ලන් සපා කෑ අයය.

දඩාවතේ යන බල්ලන්ට හැඳුනුම් පොතක් නැත. මා සපා කෑ බල්ලාම සපා කෑ තවත් කාන්තාවක් පොලිස් නිලධාරියකු සමඟ පැමිණ බල්ලා අයිති පුද්ගලයාගෙන් රුපියල් තිස් දහසක මුදලක් ලබා ගෙන තිබුණි. ඒ සඳහා ඈ මට ද බලකර සිටිය ද මම එය මග හැරියෙමි. ඒ එසේ වෙතත් දඩාවතේ යන බල්ලන්ගෙන් මොන වන්දියක් ද?

අවිහිංසාවාදය ගරු කරන මට මේ බල්ලන් එපාවීමට හේතු වූ එක් සිද්ධියක් පමණි. තවත් හේතු බොහෝය. බලු මයිල් සුසුම් නාලයේ හා පෙණහැලිවල තැන්පත්වීමෙන් ඇදුම රෝගීන් බවට පත් වූ අය බොහෝය. අපිරිසිදු බව නිසා බලු මැක්කන් නිවෙස්වලට ඇතුළුව ඇඟපත ලේ උරා බොන අවස්ථා ද එමටය.

ඒ අතර පුහුණු කරන ලද පොලිස් බල්ලන් ද සිටිති. උන් රටට වැඩදායකය. ආරක්ෂාව හැරුණු විට බල්ලන්ගෙන් ලද හැකි ප්‍රයෝජනය එපමණකි.

කෙසේ වෙතත් අපේ නිවෙස් වටා බල්ලන් විසි තිස් ගණනක් දඩාවතේ ඇවිදිති. කොළඹ නගරය ගැන සිතුවොත් දඩාවතේ යන බල්ලන් සිය ගණනකට වැඩි යයි කිව හැක. බල්ලන් විසින් සපාකෑම හැරුණු විට බල්ලන්ට බියවීම නිසා මිනිසුන් පාරේ යන වාහනවල හැපෙන්නට ගිය අවස්ථා එමටය. අද නගර සභා අවිහිංසාව ගැන තර්ක කරමින් මේ ගැන නිහඬය.

යුග කිහිපයකට පෙර දඩාවතේ යන බල්ලන් අල්ලා කොටුකර ගැනීම සඳහා බලු රියක් පැමිණියේය. එයට කොටු වූ බල්ලන්ට කුමක් සිදුවී දැයි අපි නොදත්තෙමු. එයින් සිදු වූයේ මිනිසුන්ට යහපතකි. බලු එන්නත් සඳහා යන මුදල් ප්‍රමාණය ද යම් හෙයකින් අඩු වන්නට ඇත.

මෙයට දශකයකට පමණ පෙර පශු වෛද්‍යවරියන් පැමිණ බල්ලන් යකඩ දැලක පටලවා තබාගෙන උන්ට එන්නතක් විද කරේ රතු පටියක් බැන්ද බව අපට මතකය. එවිට බල්ලා මෙන්ම මිනිසා ද ආරක්ෂිතය. බෙල්ලෙ බැඳි රතු පටිය නිසා බල්ලන්ට බිය වන්නට කරුණක් නොවීය. එහෙත් ඒ සද් ක්‍රියාව වසර කිහිපයකට සීමා විය. නගර සභා බලධාරීන්ට ඒ තත්ත්වය යළි ඇති කළ නොහැකි ද?


අද වනවිට පිස්සු බලු රෝගය සමාජයෙන් ඈත්ව ගොස් ඇති බවක් පෙනේ. ඒ එන්නතේ ඇති බල මහිමයෙනි. බල්ලකු සපා කෑවිට එන්නත ගැනීම අනිවාර්ය කර තිබීම යහපතකි. පිස්සු බලු රෝගය වැලඳුන විට මිනිසා බල්ලකුගේ තත්ත්වයට පත්වන අන්දම මා දැක තිබේ. කටින් සෙම පෙරමින් බල්ලකු මෙන් කෑගසමින් දුවන මිනිසා කොතරම් අසරණ ද? බල්ලකු මෙන් දම්වැලකින් ගැට ගසා උන් ගැහැනියක් බල්ලා මිය ගොස් සතියකින් බලු වෙස් ගෙන මිය ගිය අන්දම ද මට මතකය.

කෙසේ වුව ද මෙය සමාජ ව්‍යසනයකි. පිස්සු බලු එන්නත සඳහා යන වියදම වසරකට කෝටි ගණනකි. සපා කෑ බල්ලකු පිස්සු බල්ලකු වුවත් නැතත් මිනිසා එන්නත ලබා ගත යුතුය.

බල්ලා පිස්සු බල්ලකු බව දැන ගත හැක්කේ ඌ මිය යාමෙන් පසුවය. දඩාවතේ යන බල්ලා මිය ගියා ද නැද්දැයි සොයා ගත නොහැක. ඒ වනතුරු රෝගියාට බලා සිටිය නොහැක. එන්නත ගත යුතුය.

කෙසේ වුවද සත්ව අවිහිංසාවට අපි ගරු කරමු. එහෙත් සුරතලයට ඇති කළත් නැතත් බල්ලන් තුළ අවිහිංසාවක් ඇත්තේ නැත. දඩාවතේ යන බල්ලන් අද එහා මෙහා ගමන් කරන්නේ මුළු මහත් සමාජයම උන්ගේ යයි සිතන අන්දමිනි. කෙසේ වෙතත් මිනිස් ජීවිත බලු පරපුරට වඩා වටනේය. ඒ වටිනාකම ගැන සිතා අවිහිංසාවාදය පසෙකින් තබා එක්කෝ බලු වෑන් රිය ක්‍රියාත්මක කළ යුතුය. එසේ නොවේ නම් බලු එන්නත ලබා දීමට පශු වෛද්‍යවරු උනන්දු කළ යුතුය.

# කොලොම්පුරේ සයිවර් කඩ සහ භෝජන ශාලා




සුනිල් සරත් පෙරේරා

කොළඹ සහ ඒ අවට ප්‍රදේශවල නානාවිධ භෝජන සපයන බොජුන්හල් එදවස පවත්වා ගෙන ගියේය. යාපනයේ ද්‍රවිඩ හින්දුන් විසින් පවත්වා ගෙන ගිය ඉතා අඩු මිලට බොජුන් සපයන ආපනශාලා පාසල් වියේ දී අපේ කුසට අහර සැපයූ ස්ථානය. මේවා **'සයිව'** හෝටල නමින් හැඳින් වුණි. සයිව හෝටලයේ අහර දෙනු ලැබුවේ රඹ පත්වලය. තොසේ, උළුඳු වඩේ සහ මසාල වඩේ මෙහිදී සත ගණනක ඉතා සුළු මුදලකට මිලදී ගත හැකි විය.

බම්බලපිටියේ වජිර පාර අසල ගාලු පාරේ පිහිටි **සරස්වතී සයිව හෝටලය** එදා සිට අද දක්වා පතල රසවත් තෝසේ වඩේවලට සුපතල තැනකි. අහර ගැනීමෙන් පසු අත සෝදා ගැනීම භෝජකය විසින්ම කරගත යුතුය.

නාරද දිසාසේකර මෙන්ම අප පාසල් මිතුරු කැල සැදෑ සමයේ තෝසේ සාපාට්ටුව සරස්වතියේදී රසකර වැලඳු අය වෙමු. වරෙක සේවකයා බෙදූ හොද්දට අමතරව සම්බල සහ හොදි වැඩියෙන් ලබා ගැනීමට රිසි වූ මම ඔහු ඇමතුවේ **"කෝංඤං"** යන දෙමළ වදනිනි. එයින් අරුතවත් වූයේ **'ටිකක් යන්නයි'**. නොදන්නා දෙමළට යෑමෙන් මට වූයේ මහත් ඇබැද්දයකි. **"විච්චං"** යන්න වෙනුවට කොංඤ්ඤං යන්න යෙදීම මා මුහුණ පෑ අකරතැබ්බයකි.

**"සම්බෝල ටික ටික**
**සම්බ්‍රානි ටික ටික**
**තෝසේ ටික ටික"** යනුවෙන් ඇරඹෙන සිංදුවක් ද එකල ජන වහරේ පැවතුණි.

බම්බලපිටියේ සරස්වතී භෝජන ශාලාව පවත්වා ගෙන යන ඉපැරණි ගොඩනැගිල්ල අයිතිව තිබුණේ දකුණු කොළඹ මහජන මන්ත්‍රී **බර්නාඩ් සොයිසා** මහතාගේ පියා වූ **ස්ටීවන් සොයිසා මහතා**ට අයත් ගොඩනැගිල්ලකය. බර්නාඩ් සොයිසා මහතාගේ මහගෙදර වූයේ මෙයයි.

බම්බලපිටියේ සරස්වතී සයිව හෝටලය මෙන්ම සුපතල තවත් සයිව හෝටලයක් ඒ අසල විය. එය ග්‍රීන්ලන්ඩ් පාරේ පිහිටි **ග්‍රීන්ලන්ඩ් හෝටලයයි.** රසවත් චපාති වේලක් රස බැලීමට වූ විට අපි එහි ගියෙමු. ඇතැම් නිවාඩු දිනවල මුහුදු වෙරළ දිගේ ඇවිද ග්‍රීන්ලන්ඩ් සයිව හෝටලයට තාත්තා සමඟ ගිය නංගිලා දෙදෙනා සහ මම අම්මාට ද චපාති හා උළුඳු වඩේ පාර්සලයක් ගෙන ඒමට අමතක කළේ නැත.

**"ශෛව"** යන්න ශිව දෙවියන්ට සංස්කෘත භාෂාවෙන් යෙදුණ නමකි. එය දෙමළ වහරට යෙදුණේ **'ශෛවර්'** යනුවෙනි. මේ අනුව ශිව භක්තිකයන්ගේ කඩ (ශිව දෙවි අනුගාමිකයන්ගේ නිර්මාංශ භෝජන සපයන කඩ ශෛවර් හෙවත් සයිවර් කඩ ලෙස හැඳින්විණ.)

යාපනේ ද්‍රවිඩයන් විසින් පවත්වා ගෙන ගිය සයිවර් කඩ (සයිවර් හෝටල්) කොළඹ හා ඒ අවට සෑම නගරයකම පාහේ එදවස දක්නට ලැබිණි. **පාමංකඩ, තිඹිරිගස්යාය, වැල්ලවත්ත, මරදාන, බොරැල්ල, වැල්ලවත්ත** රෙදිමෝල අසල සයිව කඩ එදවස දක්නට ලැබිණි.

සයිවර් කඩවල නමට ඈඳා හොටෙල්, කැෆේ මෙන්ම භවන් යන්න ද යොදා තිබිණි. ආනන්ද භවන් බොරැල්ලේ පිහිටි ජනප්‍රිය සයිවර් කඩයකි. **ආනන්ද භවන්** සයිවර් කඩය තේමා කොට ලියන ලද ජනප්‍රිය සිංදුවක් එදවස අසන්නට ලැබිණි. මෙය වැදගත් සමාජ විද්‍යාත්මක තොරතුරු කියා පාන්නකි.

ජනප්‍රිය හින්දි සිංදුවක තනුවට අනුව ලියා තිබූ මහ බෝධි මුලේ ගී තනුවට අනුව ගැයුණු මෙම ගීතය මයිකල් පීරිස් හා දීපාල් පෙරේරා ගායනා කර ඇත.

**"ආනන්ද භවන්**
**එකට වැදී තෝසේ ගිලිනවා**
**එළියට ඇවිදින්**
**යාපනෙ දෙමළුන්ට බණිනවා**
**කෙසෙල් කොළේ - තෝසේ තුනයි**
**දාලා ගෙනෙන්නේ**
**ඉට්ලි මසල වඩේ - සාම්බාරු දෙන්නේ**
**කරාමය ළඟට ගිහින් - අත සෝදන්නේ**
**හෙළයා, හෙළයා, හෙළයා**

**එව කාලා තලයා කියලා බණිනවා**
**ජාති වාදෙ ගින්නයි මේ එන්නේ ඇවිළී**
**වෛර ක්‍රෝධ මතුවී - මිනිසත්කම් යටවී**
**තෝසේ කාපු බව යන්නේ මතකෙන්**
**ජනයා ආනන්ද භවන් ගිනි තිබ්බා ගිලිහී**
**ජාති ආලෙන් මත්වී"**

පාසල් වියේ අප (ආරියදාස ඇතුළු) මිතුරු කැළ සරස්වතී සයිව හෝටලයෙන් තොසේ කා වජිර පාර දිගේ ඇවිද ගියේ තිඹිරිගස්යායේ **සුනීතා හෝටලය** වෙතය. අප මිත්‍ර **නාරද දිසාසේකර** මෙන්ම ගායක **රෝහිත විජේසූරිය** ද බොහෝ විට මේ ගමනට එකතුවිය. රන්මුතු දූව **'චිත්‍රපටයේ ගලන ගඟකි'** ගීතය ගයා මේ දිනවල අතිශයින් ජනප්‍රියව සිටි නාරද දිසාසේකර දැක ගැනීමට විශාඛා විද්‍යාලය අසල බෝඩිම්වල සිසුවියන් පාරට දිව ආ අවස්ථා එමටය.

තිඹිරිගස්යායේ සුනීතා හෝටලයේ තේ කෝප්පය ඉතා රසවත් වූයේ එයට යොදාගත් තඹ බොයිලේරුව නිසාය. විසල් තඹ බොයිලේරුව හෝටලය ඉදිරිපස තබා තිබිණි. පොල්කටු අඟුරෙන් එය නිරන්තරයෙන් රත් වෙයි. බොයිලේරුවේ සිදුරකින් කිරි ජෝගුව ඇතුළුකර තිබිණි. එහි ලූ කිරි අවශ්‍යය පමණට රත් වෙයි. දිග පිත්තල ජෝගුවක කිරි තේ එක මිශ්‍ර වෙයි. යාරයක් පමණ ඉහළට ඉස්සෙන කිරි තේ මිශ්‍රණය කෝප්පයට හෝ වීදුරුවට පෙන පිඩු නගා වැක්කෙරෙන අයුරු බලා සිටීම රසවත් දෙයකි. මේ එදවස ජනප්‍රිය ගීතයකි.

**"තේ පැන් දින දින වැඩි වැඩියෙන්**
**බීමෙන් සිරුරට සැප වැඩිවේ"**

ආනන්ද භවන් හෝටලය මෙන්ම කොටුවේ පැරණි ඉස්තාලය අසල පිහිටි ජැෆ්නා (Jaffna) **හෝටලය** ද එදවස ජනප්‍රියය.

කොළඹ තර්ස්ටන් විද්‍යාලය ඉදිරිපිට පවත්නා **රහීමියා හෝටලය**, වින්සන් පෙරේරා ඇමැතිවරයා පුරුද්දක් වශයෙන් ගිය බොජුන් හලකි. ආප්පයක් හා උළුඳු වඩයක් කා තේ කෝප්පයක් බීම එතුමාගේ සිරිතක් විය. එතුමාගේ මෙම සැදෑ සවාරියට, ලේකම්වරයා වූ කේ.ඒ.ඇස්. ගුණසේකර මහතා සහ මා ද සහභාගීකර ගැනුණි. රටතොට තොරතුරු මෙන්ම අමාත්‍යාංශයේ කටයුතු ද නිස්කලංකව සාකච්ඡා කෙරුණේ වාහනයේ සිට තේ බොන අතරදීය.

සයිව කඩ කොයි රටේදීත් අපට හමුවෙයි. දිල්ලි නුවර කොනට වටරවුමේ පිහිටා තිබූ සයිවර් කඩේ උණු උණු උළුඳු වඩේ රස තවමත් දිවගට දැනේනා සේය. එමෙන්ම ඉතාම රසවත් සයිවර් රස බොජුන් සපයන සයිවර් හෝටලයක් දිල්ලි නුවර ඩිෆේන්ස් කොලනියේ පිහිටා ඇත. **සාගර හෝටලය** නමින් හැඳින්වෙන මෙයට යෑමට දිල්ලි ගිය හැම වේලාවේම මා අමතක කළේ නැත. කොයි දිල්ලියට ගියත් සයිවර් භෝජනය රස බැලීමට පුළුවන.

> **සයිවර් කඩ කොයි රටේදීත් අපට හමුවෙයි. දිල්ලි නුවර කොනට වටරවුමේ පිහිටා තිබූ සයිවර් කඩේ උණු උණු උළුඳු වඩේ රස තවමත් දිවගට දැනෙන්නා සේය. එමෙන්ම ඉතාම රසවත් සයිවර් රස බොජුන් සපයන සයිවර් හෝටලයක් දිල්ලි නුවර ඩිෆේන්ස් කොලනියේ පිහිටා ඇත. කොයි දිල්ලියට ගියත් සයිවර් භෝජනය රස බැලීමට පුළුවන.**

ඕස්ට්‍රේලියාවේ බොහෝ නගරවල සයිවර් හෝටල් දක්නට ඇත. **මෙල්බර්න් නුවර** හින්දු දේවාලයට ඇදී එන ජනයා ඒ අසල පිහිටි සයිවර් හෝටයෙන් ඉට්ලි හා උණු උණු උළුඳු වඩේ රස බැලීමට අමතක නොකරති. මෙය ශ්‍රී ලාංකික සිංහල හා ද්‍රවිඩ ජනයා නිතර හමුවන ස්ථානයකි.

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර පදිංචි මා මිත්‍ර **ආචාර්ය පියසෝම මේදිස්** මහතා මා කැඳවා ගෙන ගියේ සිඩ්නි නුවර කුවේකර්ස් හිල් (Quakers Hill) ප්‍රදේශයේ පිහිටි **මාහාරාජා** නමැති සයිවර් රස භෝජන පිරි අවන්හලකටය. මෙහි වෙන්ට්වර්ත් හිල් ප්‍රදේශයේ පිහිටි උදය තොසේ කඩේ ද අමතක නොවන ස්ථානයකි.

රූපවාහිනිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීමට විකාශ සංවර්ධනය පිළිබඳ ආසියානු ආයතනයේ (ABU -1991) මැලේසියාවට ගිය අවස්ථාවේ ක්වාලාලම්පූර් නගරයේ (චයිනා ටවුන්) සිට ඉට්ලි සහ උළුඳු වඩේ රස බැලීමට සෑම සැදෑවකම නගරයේ ඈත කෙළවරක පිහිටි තොසේ කඩ සොයා ඇවිද ගියේ එයින් ලැබුණු රස වින්දනය පතාය. එහි තොසේ කඩ කිහිපයක් තිබේ. කොහේ ගියත් තෝසේ මසාල වඩේ ලාභදායී මෙන්ම ගුණදායී ආහාරයක් විය.

අප කුඩා කාලයේ ජීවත් වූ පාමංකඩ ප්‍ර දේශයේ රාත්‍රී කාලයේ **'තෝසේ'** මසල වඩේ යනුවෙන් හඬ නඟන දෙමළ ආච්චිලාගේ හඬ ඉදහිට තවමත් හීනෙන් ඇසෙන්නකි. සුදෝ සුදු රෙද්දකින් ඔතා හිස මත තබා ගෙන් ගෙට ආ සයිවර් වෙළෙන්දියගේ සම්බෝලය හා සම්බ්‍රානි හොද්ද තවමත් මතකයට නැගේ.

කොළඹ කොල්ලුපිටියේ **ඉන්දු සිලෝන් සයිවර් කඩය** දනන් තුඩ තුඩ පවතින නාමයකි. එදවස මා හමුවීමට ජාතික ඉතිරි කිරීමේ බැංකුවට පැමිණි බොහෝ මිත්‍ර ගණයා මෙහි කැඳවා යෑම මගේ සිරිතක් විය. දිනෙක මා වෙත පැමිණි **මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර** මහතා සමඟ බැංකු කටයුත්තක් නිමවා ඉන්දු සිලෝන් සයිවර් සාපට්ටුවේ රස බැලීමට ආරාධනා ලැබුවේය. සරච්චන්ද්‍ර මහතා උණු උණු උළුඳු වඩේ මෙන්ම ඉන්දු සිලෝන් කිරි කෝපිවල රස බැලීමට කැමැත්තක් දැක්වීය.

සයිවර් රසය මෙන්ම සාහිත්‍ය රසයද එතුමා සමඟ මෙහිදී විඳ ගැනීමට ලැබුණි. 'කොමියුනිකේෂන්' යන ඉංග්‍රිසි වදනට සුදුසු වචනය ලෙස 'විඥාපනය' යන්න සරච්චන්ද්‍ර මහතා භාවිත කළ වචනයයි. මාස් මීඩියා යන්න ඒ අනුව බහු විඥාපනය ලෙස දැක්වීය.

ඉන්දු සිලෝන් සාකච්ඡාවේදී සරච්චන්ද්‍ර මහතා ඉතා සැහැල්ලුවෙන් විහිළුවට මෙන් මට කියා සිටියේ ඔබත් අර විමල්ගේ ජන සන්නිවේදනය වචනය උඩ දානවා නේද යන්නයි. මාස් කොමියුනිකේෂන් ඉංග්‍රීසි වදන සඳහා මහාචාර්ය විමල් දිසානායක හඳුන්වා දුන්නේ ජන සන්නිවේදනය යන්නයි. 'විඥාපනය' නාම පදයයි.

විඥාපනය (යම් කිසි විදිහකින් කරුණු ඉදිරිපත් කිරීමයි) විඥාපනය කරන්නා විඥා - පක ලෙස මේ අනුව හැඳින්විය යුතුය.

විද්‍යාලංකාර සරසවියේ සිසුහු විඥාපක මහාචාර්යවරයකු ගැනද උසුළු විසුළු කළහ. විඥාපනය මෙන්ම සන්නිවේදනයද නිවැරදි වහර ලෙස සැලකිය හැකි වුවද මේ වන විට ඔහු ප්‍රචාරයට පත්ව ඇත්තේ ජන සන්නිවේදනයය.

ඉන්දු සිලෝන් සාකච්ඡාවේදී තෝසේ - උළුඳු වඩේ රසට වඩා අපූරු රසයක් සරච්චන්ද්‍ර මහතා සමඟ කළ කතා බහෙන් මට උකහා ගත හැකි විය. සරච්චන්ද්‍ර මහතා ඉතා සියුම් උපහාස රසයක් කතා බහේදී මතු කළේය. මෙම උපහාස කතා සරච්චන්ද්‍ර මහතා ඇසුරු කළ බොහෝ දෙනාට තවමත් මතකය. ඇඟට පතට නොදැනී එතුමෝ උපහාස කතා කීමට සමත් වූහ.

අප තරුණ වියේදී මිතුරු කැල සමඟ රසවින්ද සරස්වතියේ සයිවර් භෝජන රසය මෙන්ම සුනීතා හෝටලයේ තඹ බොයිලේරුවේ පැසී එළකිරි සමඟ තඹ කෝප්පය යාරයක් පමණ ඉහළ නැග පෙණ පිඩු මතුකළ කිරි තේ එකේ රසයද අදටත් දිගට දැනෙන්නා සේය.




සරස්වතී ලොජ් හෝටලය පවත්වාගෙන යන බර්නාඩ් සොයිසා මහතා උපන් නිවෙස

## අලුවා

ශාන්ති දිසානායක

සිහිල් සුවැති වෙසක් සුළං වෙනුවට විටින් විට ඇද හැලෙන වැස්ස, අවිනිශ්චිත බවම උරුම කරගත් අපට තවත් හිරිහැර කරයි. එහෙත් දැනටමත් තෙතබරියම් මහ පොළොව කන් කෙඳිරි නොගා මේ අකල් වැසි උසුලයි.

අහස පොළොව සේම සියල්ල විඳ දරා ගන්නට මිනිසා සමත් නොවේ. සුබ දුක්ඛ දෝමනස්සයන් හේතුකොට ගෙන ප්‍රතික්‍රියා දැක්වීමට හෙතෙම පුරුදුව සිටියි. එකී භාවයන් එක් එක් ආකාරයට මුදා හැරෙයි. එහිදී ඒ ඒ පුද්ගලයාගේ අධ්‍යාපනය මෙන්ම තරාතිරම හා පවුල් පරිසරය මෙන්ම අයත්වන පන්තිය ද බලපායි. එහෙත් අතිශයින් සංකීර්ණ සත්ත්වයෙකු වන මිනිසා ඇතැම් අනපේක්ෂිත සිදුවීම් අරබයා දක්වන ප්‍රතිචාරයන් පුරෝකතනය පහසු නැත.

"අම්මා රමේෂ් අලුවා ගෙනැල්ලා"

බඩපිස්සා දැනුම් දුන් බැවින් මගේ සිතිවිලි සමුදාය සී සී කඩ විසිර ගියේය.

"හානේ... රමේෂ් පුතාගෙ අම්මා අලුවා හදල ද?"

සිංහල අලුත් අවුරුද්දට පමණක් නොව වෙසක්, පොසොන්, ඇසළ හෝ පොහෝ දිනයන්හීදී ද කැවිල්ලක් තනා පන්සලට පූජාකොට ඉතිරිය අසල්වැසියන් සමඟ බෙදා හදා ගන්නට ගංගොඩේ ඇත්තන් පුරුදුව සිටිති. අලුත් අම්මලා කේක්,බිස්කට් සොයා කඩ පිලට ගිය ද වැඩිහිටි පරපුර කැවිලි තනන්නට ද එයින් සංග්‍රහ කරන්නට ද දක්වන්නේ මහත් ඇල්මකි.

"කැවුමක්, අලුවා කෑල්ලක් , වැලිතලපයක් ගෙදර හදනවා වගේ නෑ අප්පා...

ඔය කේක් ඉස්කෝත්තු උස්සන් යන්ඩ පුළුවන්ද තැනකට යද්දි...?" යි අසන කිරිඅම්මලා අම්මලාගේ මතකය සොම්නස් සහගතය.

"හාල් ගිනි ගණන්නෙ පුතේ දැං... කැවිලි හදන එක ලේසි නෑ..." යි මම විමතිය පළ කළෙමි. කෘෂිකාර්මික රටක් වුව ද අද වන විට කෘෂි රසායන හා පොහොර නොමැතිකමෙන් අගතියට පත් ගොවියාට ගොවිතැන සිහිනයක් මිරිඟුවක් හා වේදනාවක් බවට පත්ව තිබේ. ගොවි දුක වනාහී මුළු මහත් රටක ජන දුකයි. කුස දවන ගින්නක වගයි.

"හාල් පිටි නෙමෙයි නැන්දා.... මයියොක්කා පිටි වලිං අම්මා අලුවා හැදුවෙ"

පිදුරු ගොඩකට ගිනි පුපුරක් කළ විලාසයෙන් මගේ උනන්දුව දැල්විණ.

"හැබෑට? හරි අපූරුයිනෙ..."

"මයියොක්කා හීනියට පෙති කපලා අව්වෙ වේලා ගෙන මෝලෙන් කෙටුවා. හාල් පිටි එක්ක කලවම් කරලා අලුවා හැදුවා..."

ආහාර අර්බුදය අත ළඟයි. මන්තරයක් මතුරන්නාක් වාගේ කොතෙකුත් මැතිරීමෙන් පලක් වේද? ආදේශක හා විකල්ප ආහාර වෙත අප නොපමාව යා යුතුව තිබේ. ඒ සඳහා තවතවත් වඩා සම්පත් අප වෙත නැද්ද? ගංගොඩේ ගස් යට ඉදී වැටෙන කොස් ගෙඩිය අපේ ආහාරයට පමණක් නොව අපනයනයට ද කදිමය. එහෙත් ප්‍රාදේශීය සභා, පළාත් සභා, පාර්ලිමේන්තු යනාදී වශයෙන් අප තෝරා පත් කර යවන මහජන නියෝජිතයන් මාර්ග සංවර්ධනයට විනා එවන් ව්‍යාපෘති සඳහා කිසි කලෙකත් උනන්දු නොවූහ.

"රොටී හදනකොට මයියොක්කා පිටිවලට පාන් පිටි ටිකක් කලවම් කරගන්නවා. ඉඳිආප්ප,පිට්ටු එහෙමත් හදනවා අපේ අම්මා මයියොක්කා පිටි වලින්..."

රමේෂ් විස්තර කළේය. මා පුන පුනා ඇසූ ප්‍රශ්න සියල්ලට උත්තර ලැබිණ. සැබැවින්ම නුදුරේ එළැඹෙන ආහාර අර්බුදයට මඤ්ඤොක්කා මෙන්ම කොස් ද ඵලදායි හා සාධනීය පිළිතුරක් නොවේද? කවදත් රක්තහීනතාවයෙන් පෙළෙන අපේ වනිතාවට මෙන්ම පෝෂණ ඌනතාවයන්ගෙන් වර්ධනය හීන වන අපේ දරුවාටද මෙවන් අත්හදා බැලීම් යෝග්‍ය නොවේද?

රංජනී ස්වර්ණලතා නැගණියගේ මඤ්ඤොක්කා අලුවා රස විඳින අතරතුර මම මගේ මුළු හදවතින්ම ඇයට ස්තුති වන්ත වීමි.



කසිමියර්ස් ඕල්ලොස්

# වාරණ සීමා පැන ගිය
# කසිමියර්ස්ගේ පන්හිඳ

උඩුපෙළ යටිපෙළ

කපිල කුමාර කාලිංග

පෝලන්තයේ ගම්බද පෙදෙසක වෙසෙන යුවළක් උදෑසන ආහාරය ගනිමින් සිටියහ. මැදිවිය පසු කර සිටි ඔවුනගෙන් සැමියා පාසල් බැංකු ලිපිකරුවෙකි. බිරිඳ ගුරුවරියකි.

කෑම කාමරයේ ජනේලයෙන් පිටත ගේට්ටුව අසල කිසියම් 'අමුතු දෙයක්' දකින බිරිඳ කුහුලින් යුතුව එය සැමියාට පවසයි.

එහි සිටින්නේ ඔටුවෙකි.

ඌ සර්කස් කණ්ඩායමක සිටි, පසුව අතහැරදැමුණු සතෙකි. ඒ 'අසරණයා හදා වඩා ගැනීමට ගුරුවරයා තීරණය කරයි. එහෙත් සුරතල් සතෙකු ලෙස ඔටුවකු නිවසේ තබා ගැනීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ.

මුලදී ගම් වැසියනටත් කුඩා ළමුනටත් ඔටුවා විනෝදයටත් සතුටටත් කාරණයක් වෙයි. ලිපිකරුවා ද යන යන තැන ඔටුවා ද කැඳවාගෙන යයි. එහෙත් ක්‍රම ක්‍රමයෙන්, ගම් වාසීනට ඔටුවා නොරුස්සන්නට වෙයි. කුඩා ළමුනට ද ඌ වෙත ළංවීම තහනම් කෙරෙයි.

එක් දිනක අඹු සැමි යුවළට දක්නට ලැබෙන්නේ ගේට්ටුවෙන් පිටත රැස්ව සිටින අසල්වැසියන් පිරිසකි. ඔවුන්ගෙන් කෙනෙකු අත පුවරුවක 'පිටවෙනු' යනුවෙන් ලියා ඇත. කළ යුත්තේ කුමක් ද? ඔටුවා සමඟ ගමෙන් පිටව යාම ද? නො එසේ නම් ඔටුවා පිටමං කිරීම ද?

මේ අතර නගර සභාවෙන් ද ලිපියක් ලැබෙයි. ඔටුවා නගරයේ වීදි අපිරිසුදු කරයි. උගෙන් නගරයට විෂබීජ පැතිරීමට ද ඉඩ ඇත. ඔටුවා නගර සභාවේ ලියාපදිංචි කර බද්දක් ද ගෙවිය යුතුය. සමාජයට ප්‍රයෝජනයක් නැති සතෙකු ඇති කරන්නේ කුමට ද යන ගැටලුවට මුහුණ පෑමට භාරකාර යුවළට සිදු වෙයි.

'ඔටුවා' නමැති මෙය, පෝලන්ත ජාතික ලේඛකයෙකු වන **කසිමියර්ස් ඕර්ලොස්**ගේ කෙටි කතාවකි.

'බ්ලු, වයිට්,රෙඩ්' සිනමා ත්‍රිත්වයෙන් ලෝක ප්‍රකට වූ **ක්‍රිස්ටෝෆ් කිසලොව්ස්කි** 'ඔටුවා' ඇසුරින් තිර රචනයක් කළේය. එහෙත් එකල පෝලන්තයේ කොමියුනිස්ට් පාලනය යටතෙහි වූ සංස්කෘතික හා කලා වාරණ නීති යටතේ එය නිපදවීමට ඔහුට නොහැකි විය. එම පිටපත සඟවා තබාගත් කිසලොව්ස්කිගේ මිතුරියක ඔහුගේ මරණයෙන් පසුව එය ඔහුගේ බිරිඳට බාර දුන්නාය.

පසුව පෝලන්තයේ සුප්‍රකට නළුවෙකු හා අධ්‍යක්ෂවරයෙකු වන **ජර්සි ස්ටූහර්** (Jerzy Stuhr) විසින් එය 'Big Animal' මැයින් සිනමාවට නැඟීය. කළු-සුදු වර්ණ චිත්‍රපටයක් වූ එහි කැමරා අධ්‍යක්ෂණය කළේ පොලාන්ස්කිගේ 'ද පියානිස්ට්' ද රූප ගත කළ **පැවල් එල්ඩර්මන්**ය.

අනෙකුත් සමාජවාදී රටවලට සාපේක්ෂකව පෝලන්තයේ කලා හා සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ නිදහස් වාතාවරණයක් පැවතිය ද පසුව එය වෙනස් විය. වාරණ මණ්ඩලය සිත්පිත් නැති සේ රතු පෑන හා කතුර භාවිත කළේය. 1973දී පළවූ කසිමියර්ස්ගේ පළමු නවකතාව 'The Marvelous Den' ද තහනමට ලක් කෙරුණි. පසුව එය පැරීසියේදී ප්‍රකාශයට පත් වුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කසිමියර්ස්ගේ කිසිඳු ග්‍රන්ථයකට පෝලන්තයේ ඉඩ නොලැබුණු අතර, ඒ තහනම 1989 දක්වා බල පැවැත්වුණි. එහෙත්, ලිවීම අත් නොහළ ඔහුගේ කෘතීන් විදේශයන්හි පළ වූ අතර, පෝලන්තය තුළ ද 'රහසි පිටපත්' පැතිරුණි.

මට මුලින්ම කසිමියර්ස් ඕල්ලොස් හඳුනා ගැනීමට ලැබුණේ 1971 ජුනි මස 'නවලෝකය' සඟරාව තුළිනි. 'පෝලියා' පර්ස්පෙකිම්ට්ස්' සඟරාවේ පළවූ කසිමියර්ස්ගේ "මේපල් අතු" (Maple Branches) නමැති කෙටි කතාව මහින්ද රැළපනාව විසින් සිංහලට පරිවර්තනය කරන ලදුව එහි පළව තිබුණි. (උඩකැන්දවල සිරි සරණංකර හිමි විසින් අරඹන ලද 'නවලෝකය' සඟරාවේ පසුකාලීන සංස්කාරක මණ්ඩලය සමන්විත වූයේ කේ.පී. සිල්වා, ගුණසේන විතාන හා ජයතිලක ද සිල්වා ගෙනි. 70 දශකයේ එහි පිටපතක මිල ශත 60ක් විය.)

'මේපල් අතු' කියැවීමෙන් ලද ආස්වාදයේ පෙලඹවීමෙන් මම ගුවන් විදුලි නාට්‍යයක් ද රචනා කළෙමි. ගුවන් විදුලියේ අධ්‍යාපන සේවය මඟින් විකාශනය කෙරුණු එම නාට්‍ය පිටපත 2010 දී පළ වූ **'මාන කොකා'** නමැති ගුවන් විදුලි නාට්‍ය කෘතියට ද එක් කළෙමි. (ගොඩගේ ප්‍රකාශනයකි)

නවකතාකරුවෙකු වශයෙන් තහනමට ලක් වන්නට පෙර, කසිමියර්ස් ඕල්ලොස්, කෙටිකතාකරුවෙකු වශයෙන් ජනප්‍රියව සිටි අතර, 1961දී පළවූ ඔහුගේ 'Between the Riverbanks' (ගංඉවුරු අතර) බොහෝ පැසසුම් ලැබීය. 'මේපල් අතු' අයත් වූයේ ඔහුගේ 'Dark Trees' (1970) කෙටිකතා එකතුවටය.

කුණාටු රාත්‍රියක නිදන කාමරයෙහි සිටින තරුණ විවාහක යුවළක් වටා මෙම කතාව රචනා වී ඇත. වේගවත් සුළඟෙහි හඬින් බියපත්ව සිටින බිරිය තම සැමියා ද අවදි කරවයි.

**'මොකටද මේ මහ රෑ මාව නැඟිට්ටෙව්වේ. දැන් ඉතින් කීයටවත් මට නින්ද යන එකක් නෑ.'** සැමියා පවසයි.

**'මේ සුළඟ මාව බය කරනවා. ඔයාගේ අත් මා වටා යවන්න.'**

එහෙත් සැමියා උදාසීන ලෙස සිටී.

**'දැන් ඔයා මාව වැලඳ ගන්න හිතුනම විතරයි. අපි දැන් එකට හිටපු කාලෙ වැඩියි වගේ.'**

ඇය සොවින් කියයි.

ඉන්පසු ඇය සැමියාගෙන් ඉල්ලා සිටින්නේ පිටතට ගොස් සරසර හඬ නඟන මේපල් අතු කීපයක් කඩාගෙන එන ලෙසය. එය ඔහුගේ ආදරය පරීක්ෂා කිරීමකි. ඇය සාහිත්‍යය ප්‍රිය කරන නිර්මාණාත්මක හැඟීම් ඇති තරුණියක බවට ද ඉඟියක් කතාව තුළ ඇත.

බිරියගේ ඇවිටිල්ලෙන් මිදීම සඳහා ඔහු අඳුරේම පිටත උද්‍යානය වෙත ගොස් බිමවැටී ඇති මේපල් අත්තකින් කැබලි කීපයක් රැගෙන එයි.

**'උසම ගහකට නැඟලා කඩාගත්තේ. වැටුණ නං එහෙම මාව මැරෙනවා.'**

ඔහු බිරියට පවසයි.

**'ඔයා මට ආදරේ තරම දැන් මට තේරෙනවා.'** ඇය පවසයි.

පිටත වූ සීතලෙන් ගල් ගැසී සිටින සැමියා වහ වහා තම පාවහන් ගලවා දමන්නට වෙයි. බිරිඳ මේපල් අතු සොලවමින් ඉන් නැගෙන 'සරසර' නද විඳී

සැමියා ඇයට සරදමක් කිරීමට සිතයි.

**'ඔයා හිතන්නේ මම එළියට ගියේ ඔයාට මේපල් අතු ගේන්න කියලම ද... මට වෙන උවමනාවකුත් තිබුණා.'**

සැමියා ඉන් අදහස් කරන්නේ තමාට මුත්‍රා කිරීමට ද අවශ්‍යව තිබූ බවකි.

එහෙත් බිරිඳට ඔහු කී දෙය නෑසෙයි. මේපල් අතු ද අතැතිව ඇය නින්දට ගොසිනි. ප්‍රේමය පිළිබඳ සියුම් අනුභූතියක් රැගත් 'මේපල් අතු' කෙටි කතාවකටත් වඩා ළංවනුයේ ගැදි කවකටය.

යථාර්ථවාදී ශෛලිය ප්‍රිය කළ, කසිමියර්ස්ගේ මුල් කාලීන කෙටිකතා ගම්බද ජීවිතය පසුබිම් කරගත් අතීතකාමී තේමාවන්ගෙන් යුතු විය. ඔහුගේ ඇතැම් කෙටිකතා උපහාසාත්මකය. විකාරරූපීය. (Satire and grotesque) පසුකාලීන නිර්මාණ තුළ පෝලන්තයේ පිරිහුණු සමාජ-දේශපාලන තත්ත්වයන් පිළිබිඹු වන්නට විය. ඔහු ලියූ 'Drunk Tank' නවකතාවෙන් දැක්වෙන්නේ දෙවැනි ලෝක මහා සංග්‍රාමයෙන් පසුව රුසියානු ආධිපත්‍යය පෝලන්තය තුළ පැතිරුණු ආකාරයයි.

දක්ෂ ගුවන්විදුලි නාට්‍යකරුවෙකු ද වූ කසිමියර්ස්, පෝලන්ත ගුවන් විදුලියේ නාට්‍ය අංශයෙහි සංස්කාරකවරයෙකු වශයෙන් ද කටයුතු කළේය. එහෙත්, 'වාරණ දඬුවමට' ලක් කිරීමෙන් පසු ඔහුට එම රැකියාව ද අහිමි විය.

කසිමියර්ස්ගේ කෙටිකතා එකතුවක ඉංග්‍රීසි පරිවර්තනයක් 1981දී 'The Gobi Dessert' මැයින් ලන්ඩනයේදී පළ කෙරුණි. එයට ඇතුළත් 'Barberd wire fox' (කටුකම්බියෙන් බැඳි නරියා) කසිමියර්ස්ගේ තියුණු සමාජ උපහාසය මනාව දනවන කෙටි කතාවකි.

ගමේ පාසලට අලුත පැමිණි මිලනොවික්ස් නමැති ගුරුවරයා උදෑසන පාරේ යමින් සිටියදී පාසල් ළමුන් පිරිසක් කෑකෝ ගසමින් සිටිනු දක්නට ලැබෙයි. ඔහු ද එතැනට යයි.

**'අර බලන්ඩ සර් නරියෙක්'**

ළමයෙක් කෑ ගසයි.

පාලම අසලට දිස්වන ගොවිපළේ එක් සීමාවක ඇපල් ගස් අතර, වයර් පටකින් බැඳ සිටින නරියෙකි. උගේ බඳ වටා කටු කම්බියකි. එහි බැඳි ටින් බෙලෙක්කයකි. නරියා ඒ මේ අත දුවන්නට උත්සාහ ගත් විට බෙලෙක්කයෙන් හඬක් නැගෙයි. උගේ කනක් ඉරී එල්ලෙයි. ගෙලෙහි ලේ කැටිති මිදී ඇත.

නරියා පත්ව ඇති දුක්ඛිත තත්ත්වය ගැන කම්පා වන ගුරුවරයා ගොවිපළ හිමියා හමුවී ඌ මුදා ගැනීමට උත්සාහ කරයි.

**'සර් දන්නෙ නෑ ඕකා මගෙ කුකුල්ලු කී දෙනෙක් කෑවද කියලා.'**

ගොවිපළ හිමියාගෙන් කිසිඳු බුරුලක් නැත. ඉන්පසු ගුරුවරයා ගම්මුලාදෑනි තැන හමුවීමට යයි. එදින හමුදාවේ සිටින ඔහුගේ බෑණා පැමිණි සාදයකි. කිසිවෙකුටත් නරියා ගැන ඇසීමට උවමනාවක් නැත.

ගුරුවරයා පල්ලියේ පියතුමා හමුවීමට යයි. එතුමා ද නරියා ගැන උනන්දුවක් නොදක්වයි.

**'අපේ ආගමේ හැටියටත් මේක පාපයක් නේද"** ගුරුවරයා විමසයි.

**'ඔහේ එනවද මට ආගම ගැන කියල දෙන්න"** පියතුමා නුරුස්නා ලෙස කියයි.

එදින රාත්‍රියේ ගුරුවරයා අඬුවක් ද ගෙන රහසින්ම ගොවිපළ වෙත යන්නේ වයර් හා කම්බි කපා දමා නරියා බේරා ගනු පිණිසය. එහෙත් දැඩි අන්ධකාරයත්, අධික ශීතලත් ඔහුට බාධා කරයි. අඬුව ද අගලකට වැටුණොත් ඔහුට ආපසු ඒමට සිදු වෙයි.

පසු දින පාන්දරම ඔහු ගොවිපළ හිමියා හමුවීමට යයි. පෙරදින රැයේ අධික ලෙස බීමත් වූ ඔහු තවමත් නිදිය.

ගොවිපළ හිමියාගේ බිරිඳ අමතන ගුරුවරයා මෙසේ කියයි.

**'ඒ සතාට ඔහොම වද දෙනවට වඩා හොඳයි නේද මරල දාන එක...'**

මොහොතක් කල්පනා කරන ගොවි බිරිඳ ගෙතුළට ගොස් එන්නේ මන්නා පිහියක් ද රැගෙනය. **'සර්ගේ කතාව ඇත්ත. අපේ මිනහ දැන්ම නැඟිටින එකක් නෑ.. සර්ම ගිහින් නරියා මරල දාන්න.'** මන්නය අතට ගත් ගුරුවරයා දෙගිඩියාවෙන් යුතුව බලා සිටී. ඊළඟ මොහොතේ ඔහුට දක්නට ලැබෙන්නේ, හී විටේ වැටී, මිය ගොස් සිටින නරියාය.


නූතන ජන කතාවක් බඳු මෙම කෙටි කතාව අවශ්‍ය තැනදී ක්‍රියාත්මක නොවන නීතියත්, දේව ධර්මයත් යන දෙකම උපහාසයට ලක් කරයි.



**ක්‍රිස්ටෝෆ් කිසලොව්ස්කිගේ තිර රචනය ඇසුරින් කළ 'Big Animal' චිත්‍රපටයේ දර්ශනයක්**

සුනිලා විජේසිංහ

## අමුණුගොඩ ජයවර්ධන සිත්තරාණෝ



මේ පින්බර පොසොන් මාසයයි. ශ්‍රී ලාංකික අප පොසොන් සමයේදී ප්‍රතිපත්ති පූජාව හැරුණු විට ආමිස පූජාව ද මහත් සේ අගය කොට සලකන්නෙමු.

සාමාන්‍යයෙන් බෞද්ධ , අබෞද්ධ අපි සැවොම වෙසක් සමයේදී ඥාති හිත මිත්‍රාදීන් ද කැටුව තොරණ සහ අම්බස්තල ඇතුළු තවත් නොයෙකුත් සැරසිලි නරඹා සතුටුවෙමු. ඉන්පසු දන්සැලකින් බඩ කට පිරෙන්නට කා, බී පාන්දර යාමයේ ආපසු නිවසට පැමිණෙන්නේ හිත උතුරා යන සන්තෘෂ්ටියෙනි.

පොසොන් තොරණ පිළිබඳව කතා බහ කරන විට කොළඹ නගරයේ ඉදිවූ අපට අමතක කළ නොහැකි සුවිශේෂී තොරණ කිහිපයකි.

ලක්ෂ සංඛ්‍යාත ගණන් ජනතාව එදවස මහත් භක්තියෙන් මෙන්ම අමන්දානන්දයෙන් යුක්තව එම තොරණ වන්දනාවෙහි යෙදුණේ අද මෙන් නොව ඉතා සැහැල්ලුවෙනි .

ඒ අතර එකල අතිශය ජනප්‍රිය වූ තොටළඟ තොරණ, අයි. ඩී. එච් හන්දියේ තොරණ , පිටකොටුවේ තොරණ ඇතුළු තවත් තොරණ කිහිපයකම සිතුවම් ඇඳුණේ අමුණුගොඩ ජයවර්ධන නම් වූ අපූරු චිත්‍ර ශිල්පියාගේ විස්මිත වූ තෙළිතුඩෙනි. ඔහු එලෙස සිතුවම් කළ වෙසක්, පොසොන් තොරණ සංඛ්‍යාව දහස ඉක්මවා ඇත. පන්සිය පනස් ජාතකයෙහි එන වැඩි ගණනක් ජාතක කතා ඔහුගේ සුරතින් ඉතා අනර්ඝ ලෙස සිතුවමට නැගුණා සැක නැත.

මේ පින්බර පොසොන් මාසයේදී එම අසහාය කලා ශිල්පියා පිළිබඳව කුඩා හෝ සටහනක් තැබීම ඔහු වෙනුවෙන් කෙරෙන කළගුණ සැලකීමක් වනු ඇත.

කේ. ජී. ඩී. ස්ටීවන් ජයවර්ධන නොහොත් අමුණුගොඩ ජයවර්ධන සිතුවම් කලාවෙහි ලා මහත් වාසනාවන්තයෙකු වූයේය. ඔහු ක්ෂේත්‍රයෙහි අත්පොත් තබා ඇත්තේ

දියත පතළ සිත්තරෙකු වූ ඇම්. සාර්ලිස් මාස්ටර් යටතේ වීම එයට එක් හේතුවකි. හේ 14 වසරක් පුරා ඔහුගෙන් ශිල්ප උගෙන ඇත්තේය. අනතුරුව මරදානේ ශීතා ශිල්ප ශාලිකාවෙන් ඉංග්‍රීසි අධ්‍යාපනය ද, දෙහිවල කාව්‍ය විද්‍යාලයෙන් කවිනැණ ද ,

ඇලෙක්සැන්ඩර් කලායතනයෙන් අජන්තා සිතුවම් කලාව ද මැනවින් හැදෑරූ තරුණ ජයවර්ධන වඩාත්ම ජනතාව අතරට පිවිසියේ සිත්තරෙකු හැටියට ය.

පණීභාරතයන් සමග කලායතනයක් අරඹමින් කලක් ගුරු භූමිකාවෙහි ද රැඳී සිටි හේ අපූරු ගෝල බාලයින් රැසක් බිහි කොට ඇත්තේය.

1950 දශකයේ පටන් දශක හයකට වැඩි කාලයක් ඔහු තම තෙළිතුඩ කැපකළේ පොදුජනතාවගේ චෛතසික සහ මානසික සංවර්ධනය උදෙසාම ය. රටේ , ජාතියේ නැණ ගුණ වැඩුම සඳහාම ය.

තායිලන්තයෙහිදී ද දෙවතාවක් තොරණ සිතුවම් කොට ඇති හේ 1984 වසරේදී බැංකොක් නුවර ඉදි කළ දැවැන්ත තොරණෙහි උස අඩි 65 ක් විය. එහි දැල්වුණු විදුලි බුබුළු සංඛ්‍යාව 30,000 කි.

ඒ හැරුණු විට තායිලන්ත රජයෙහි පරවේණී රාජ පරම්පරා නවයක රූ සටහන් සිතුවමට නගන්නට තරම් ඔහු භාග්‍යවන්ත වූයේය .එකී සේවාවන් වෙනුවෙන් ජයවර්ධන මහතා තායිලන්ත රජයෙන්ද නොයෙකුත් ගරු සම්මාන ලබා ඇත.

ලක් දෙරණේ බොහෝ පසිඳු යතිවරයින්, ප්‍රභූවරුන් සහ කලාකරුවන් ද ඔහුගේ තෙළිතුඩට හසුවන්නට තරම් වාසනාවන්තයෝ වූහ.

රටෙහි නන් දෙස වූ බෞද්ධ විහාර මන්දිර සහ තවත් වැදගත් ස්ථාන බොහොමයක් ඔහුගේ සොඳුරු සහ ජීවමාන සිතුවම් කලාවෙන් ඔප ගැන්වී ඇත. ඒ අතර පිටකොටුවේ බෝධිරාජ විහාරය සහ මහනුවර ආදාහන මළුව ද වේ .

කොළඹ නිදහස් චතුරශ්‍රයේ ඇති ප්‍රතාපවත්, ගාම්භීර සිංහ රූ කිහිපය මේ මොහොතේ ඔබට සිහිපත් කරගත හැකිනම්; ඒ අනගි නිර්මාණ කුසලතාවයද අමුණුගොඩ ජයවර්ධනයන්ගේය.

මීමන ප්‍රේමතිලකයන්ගේ ළෙන්ගතු ආරාධනයෙන් ලේක්හවුසියේ සිළුමිණ සහ සරසවිය පුවත්පත් සඳහා අමුණුගොඩ ජයවර්ධනයන් වසර කිහිපයක් තිස්සේ චිත්‍ර හා චිත්‍රකතා ඇන්දේය.

කිසිදා මිලක් වෙනුවෙන් අලෙවි නොවූ මෙම අදීන සිත්තර ශිල්පියා සමාජ සේවකයෙකු ලෙසද රටට මහත් අගනා සේවයක් කළ පුද්ගලයෙකි. කිසිදා මත්පැන් බිඳක් තොල නොගෑ විශිෂ්ට කලාකරුවෙකි

ඉතා මිහිරි හා අමිහිරි මතකයන් සම්භාරයක් සිත තුළ තෙරපා තබාගනිමින් මෙම කෘතහස්ත චිත්‍ර හා මූර්ති ශිල්පියා, කවියා, නක්ෂත්‍රවේදියා සහ සමාජ සේවකයා අද ගිලන් ව සයනගත වී හිඳී. ඒ ඔහුගේ උපන්ගම වන ගම්පහ, මීගහවත්ත ,දෙල්ගොඩ නිවසේය.

සිය තෘප්තිමත් අනූ හය වසරක අතීත මතක සිහිපත් කරන කල ඔහුගේ වත මත තවමත් ප්‍රීතිමත් හසරැල්ලක ප්‍රභා රේඛා සටහන් වේ.

සියලු ශ්‍රී ලාංකේය ජනතාව වෙනුවෙන් මේ පුණ්‍යවන්ත වෙසක් සමයේදී මම ඔහුට නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමි.

# දුනු ගී

ඩී. එම්. එස්. ආරියරත්න

සිසු සිසුවියන් පිරිසක් බසයකින් බැස, දුන්නක් ඔසවා ගෙන ගමන් ගත්හ. එම දුන්න දරුවකුට දරා සිටීමට නොහැකි තරම් ප්‍රමාණයෙන් විශාලය. දුනු දණ්ඩ වර්ණවත් රෙදි පටි ඔතා සරසන ලද්දකි. දුනු ලණුව දිගේ මැදින් සිදුරු කරන ලද ටොනික් මූඩි රැසක් අමුණා තිබුණි. දුන්න අතින් ගත් ළමුන් දෙදෙන පිරිවරා ගෙන සෙසු ළමෝ ගමන් ගත්හ. ඔවුන් භාරව යන වැඩිහිටියකු දක්නට ලැබිණි. දුන්නක් අතැති කෙනකු ළඟ අනිවාර්යයෙන් ඊතල මිටියක් ද තිබිය යුතු නිසා මම ඒ ගැන විපරම් කළෙමි. නමුත් ඊතල වෙනුවට ඔවුන් එකිනෙකා අත තිබුණේ විවිධ වාදන භාණ්ඩය. සර්පිනාවක්, උඩැක්කියක්, ලී කෙළි නැටුමේ දී භාවිත කරන ප්‍රමාණයේ කුඩා ලී දඬු කැබලි දෙකක් ඒ අතර විය.

නගරයට දුර කුඩා පාසලක සිට පැමිණෙන මෙම දරු දැරියෝ සංගීත තරඟයකට සහභාගි වෙන්නට ලොකු පාසලක් වෙත යමින් සිටියහ. එම පිරිස කැටුව යන ලද්දේ ඔවුන්ගේ සංගීත ගුරුතුමිය විසිනි. දුන්නක් සමඟ සංගීත භාණ්ඩවලට ඇති සම්බන්ධය සොයා ගනු රිසින් මම සෙමෙන් ඔවුන් පසු පස ගමන් කළෙමි.

අදාළ පාසල වෙත ගිය පිරිස තම වාරය පැමිණි විට තරඟයට සූදානම් වූහ. තමන් දුන්න එහි ලණුව උඩින් පිහිටන සේත්, නොසෙල්වෙන සේත් සවිකර ගත්හ. අනතුරුව ඔවුහු දුන්න අසලින්, ඊට පිටුපසින් අසුන් ගත්හ. තරඟය ආරම්භ වූයෙන් ගායනය ඇරඹුණි. ගායක පිරිස අතර ප්‍රධාන දෙදෙනකු ඉස්මතු වූහ. ඔවුහු ඉපැරණි දේව කථාවක් ගායනයෙන් ඉදිරිපත් කළහ.

ඇතැම් විට ගායනය ඒ ප්‍රධානීන් දෙදෙනාගේ කථෝපකථනයකි. එක් ප්‍රධානියකු ගීයෙන් කියන කතාවට අනෙක් ප්‍රධානියා විටෙක හූ මිටි තබයි. විටෙක කතාව අනුමත කරයි. තවත් විටෙක තමා ද අදහසක් ඉදිරිපත් කරයි. කතාබහ ද සිදුවනුයේ රිද්මය රැක ගනිමිනි. හූ මිටියෙන් උද්දාමයට පත් වන ප්‍රධාන ගායිකාව ගීය ගයයි. ඒ අතරම තමා අතැති කෙටි ලී දඬු දෙකෙන් දුනු ලණුවට තාලානුගතව තට්ටු කරයි.

එවිට ටොනික් මූඩි සෙලවෙමින් නාද නිකුත් වෙයි. අනෙක් වාදන භාණ්ඩ අතැත්තෝ ද තම තම භාණ්ඩ වයමින් මධුර සංධ්වනියක් නිමවති. කෙනෙක් දුන්න බැඳි කළයට ද තට්ටු කරමින් සංගීතය නිපදවති. සවන් පිනවූ ගී නද අවසානයේ මෙම අපූර්ව කලා මාධ්‍යය පිළිබඳ වැඩිපුර දැන ගනු රිසින් මම ගුරුතුමියගෙන් විස්තර විමසුවෙමි.

දුන්නක් උපයෝගි කර ගනිමින් ගී ගායනයේ යෙදීම **විල්ලු පාට්ටු** (දුනු ගී) හෝ (දුනු සංගීතය) යනුවෙන් හැඳින්වේ. **විල්** යනු දෙමළ භාෂාවෙන් දුන්න හැඳින්වෙන වචනයයි.

**පාට්ටු හෝ පාඩල්** යනු ගීතයයි. ඉසෙ යනු සංගීතයයි. දුනු ගී කලාවෙහි ආරම්භය කවර කලෙක සිදු වුණිදැයි නිශ්චිතව පැවසිය නොහැකිය. දඩයම් යුගයේදී මිනිසාට බෙහෙවින් උපකාරි වූයේ දුන්නයි. එබැවින් දුන්න සමඟ ඔහුගේ දැඩි බැඳීමක් පැවතුණි. එවකට භාවිතයෙහි පැවති මැටි කළය ද උපයෝගි කරගෙන දඩයක්කරුවන් විසින් මෙම ගී කලාවට මුල පුරා ඇති බව පෙනේ. **දකුණු ඉන්දියාවේ තමිල්නාඩුව, කේරළය සහ ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර** පළාත්වල දුනු ගී බෙහෙවින් ජනප්‍රිය කලාවකි.

දඩයම් යුගයේ දී දඩයමට උදව්වූ දුන්න ම නවීන අවි ආයුධ නිර්මාණය වීමට පෙර යුද සෙබළුන්ගේ ප්‍රධාන අවියක් ද විය. තමන් අත නිරන්තරයෙන් ගැවසුණු එම දුන්න විනෝදාස්වාද උපකරණයක් ලෙස ද භාවිත කරන්නට ඔවුන් පෙළඹෙන්නට ඇත. කාලයත් සමඟ පරිණාමය වූ එම විනෝදාස්වාද මාර්ගය වැඩි දියුණු වී වර්තමානයේ පුරාණෝක්ති කතා මෙන්ම සමාජ ප්‍රතිසංස්කරණ අදහස් ප්‍රකාශ කිරීම සඳහා ද වූ කලා මාධ්‍යයක් ලෙස භාවිත වෙයි.

දුනු ගී කලාවෙහි ආරම්භය සිදු වූ ආකාරය පිළිබඳ ජන වහරේ කථාවක් තිබේ. පාණ්ඩ්‍ය රාජධානියේ රජු දිනක් දුනු ඊතල රැගෙන දඩයමේ ගියේය. ඔහු ඇතුළු පිරිස විසින් බොහෝ සතුන් දඩයම් කරන ලදි. මුළු දවස පුරා තමන් දඩයම් කරන ලද සතුන් ප්‍රමාණය දුටු රජු දුකට පත් වුණේය. ඔහු තම පුරෝහිතයා අමතා මෙසේ කීවේය:

**"අපි කොච්චර සත්තු ගොඩකගෙ ජීවිත විනාශ කළා ද? අපට සතුටුයි, ඒත් මේ සත්තු මරණයට පත්වෙද්දි මොන තරම් වේදනාවක් දැනෙන්න ඇත් ද? අම්මා මැරිච්ච මුව පැටවු අඬන හැටි දැක්ක ද? මගෙ මේ හිතේ දුක නැති කර ගන්න මොකක් හරි පිළියමක් නැද්ද, පුරෝහිත?"**

**"තියෙනවා රජතුමනි,"** පුරෝහිත කීවේය.

**"ඒ මොකක් ද?"**

**"අපි දෙවියන් වහන්සේට කන්නලව්වක් කරලා පවු සමා කර ගනිමු."**

පුරෝහිතගේ යෝජනාව අනුව වහාම දේව කන්නලව්වක් පවත්වන්නට කටයුතු සූදානම් කෙරුණි. ඔවුන්ට ඒ සඳහා සංගීත භාණ්ඩ අවශ්‍ය වුණි. ඔවුන් අත සංගීත භාණ්ඩ කිසිවක් නොතිබුණි. රජු තම දුන්න බිම තබා සංගීතය ඉපැදවීමට ඊතලයෙන් තට්ටු කළේය. දුන්න නොසෙල්වී රඳවා ගැනීම සඳහා ඔහු එය මැටි කළයට තබා ගැට ගැසුවේය. අනතුරුව තට්ටු කරද්දී ඩුම් ඩුම් හඬින් සංගීත නාදය ඉපදුණි. රජු දේව කන්නලව් ගායනය ඇරඹීය. ඊට හූමිටි තබන්නැයි පුරෝහිත දඩයම් කණ්ඩායමේ අනෙක් සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටියේය. මෙම හූ මිටි තැබීමේ පුරුද්ද වර්තමානයේත් දුනු ගී කලාවෙහි අංගයක් ලෙස පවතී. වර්තමානයෙහි කළය අත්‍යවශ්‍ය අංගයක් ලෙස නොසැලකේ.

**පුත්තලම උඩප්පුවේ සෝමාස්කන්දර්, යාපනයේ සින්නමණි හෙවත් කේ. එන්. ගණපතිපිල්ලෙයි, යාපනය නාච්චිමාර් කෝවිල අසල රාජන්, වී. කේ. ආරුමුගම්, ලටිස් වීරමණි** යන මහත්වරු ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ දුනු ගී කලාකරුවෝය. මොවුන්ගෙන් බොහෝ දෙනකු අද වන විට ජීවතුන් අතර නැත.

වර්තමානයේ දුනු ගී කලාව පරිහානියට පත් වෙමින් පවතින බව පෙනෙන්නට තිබේ. ජීවත් වීමට සරිලන තරම් ආදායමක් තමන් නිරත කලා මාධ්‍යය තුළින් උපයා ගැනීමේ අපහසුව එයට ප්‍රධාන හේතුවක් ලෙස දුනු ගී කලාකරුවෝ පෙන්වා දෙති.





# සුවසැරිය ගිලන්රථ සේවාවට ඉන්දියාවෙන් ටොන් 3.3ක අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම්



**මහින්ද අලුත්ගෙදර**

මෙරට ක්‍රියාත්මක සුවසැරිය ගිලන්රථ සේවාවට ටොන් 3.3ක අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් තොගයක් පරිත්‍යාග කිරීමට ඉන්දියාව පියවර ගෙන තිබේ.

ඉන්දියානු රජය විසින් 1990 සුවසැරිය ගිලන්රථ සේවාවට පරිත්‍යාග කරන ලද අත්‍යවශ්‍ය වෛද්‍ය සැපයුම් තොගය ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් සුවසැරිය පදනමේ සභාපති දුමින්ද රත්නායක මහතා වෙත නිල වශයෙන් භාර දීම කොළඹදී සිදු විය. පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා සහ සුවසැරිය පදනමේ ප්‍රධාන විධායක නිලධාරී සොහාන් ද සිල්වා මහත්වරු ද මේ අවස්ථාවට සහභාගී වූහ.

විදේශ කටයුතු ඇමැති ආචාර්ය එස්. ජයිශංකර් මහතා පසුගිය මාර්තු මස කොළඹ සුවසැරිය මූලස්ථානයට ගිය අවස්ථාවේදී එහි නිලධාරීන් විසින් සුවසැරිය පදනම විසින් නුදුරේදීම මුහුණ දෙන වෛද්‍ය සැපයුම් හිඟය පිළිබඳව ඒ මහතා දැනුම්වත් කළ බව ද, මේ හදිසි අවස්ථාවට ප්‍රතිචාර දක්වමින් වෛද්‍ය සැපයුම් ශ්‍රී ලංකාවට කඩිනමින් භාරදීමට ඉන්දියානු නාවික හමුදාවේ සාරියල් නෞකාව විශේෂයෙන්ම යොදවන ලද බව ද ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය පවසයි.


සුවසැරිය පදනමට අමතරව හම්බන්තොට මහ රෝහලට, පේරාදෙණිය ශික්ෂණ රෝහලට සහ යාපනය ශික්ෂණ රෝහලට අවශ්‍ය වෛද්‍ය සැපයුම් ද මේ නෞකාව විසින් රැගෙනවිත් තිබේ.

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ව්‍යාප්ත 1990 සුවසැරිය හදිසි ගිලන්රථ සේවාව ජනතා කේන්ද්‍රීය සහ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාව පදනම් කර ගත් ඉන්දීය සංවර්ධන සහයෝගීතාව සඳහා නිදසුනක් බව පෙන්වා දෙන එම මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියානු රජයේ අමෙරිකානු ඩොලර් මිලියන 22ක පමණ ප්‍රදානයක් යටතේ මේ ගිලන්රථ සේවාව ආරම්භ කර ඇතැයි කියා සිටී.

මේ සේවාව මෙරට ජනතාවට අතිශය වැදගත් සේවාවක් බව මේ වන විට සනාථවී ඇති අතර, එය වටිනා ජීවිත බේරා ගැනීමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

ඉන්දීය රජය සහ ජනතාව විසින් පසුගිය මාස දෙකේදී මෙරටට පරිත්‍යාග කරන ලද ටොන් 25ක ඖෂධ සහ වෛද්‍ය සැපයුම්වල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 370කට ආසන්නය. මේ වෛද්‍යාධාර දී ඇත්තේ සහල්, කිරි පිටි, භූමිතෙල් වැනි මානුෂීය ආධාර සහ අමෙරිකානු ඩොලර් බිලියන 3.5ක පමණ ආර්ථික සහයෝගයට අමතරව වීම විශේෂත්වයකි.

# ඉරාන විප්ලවයේ නියමු ඉමාම් කොමෙයිනිතුමා



සමස්ත ලෝකයේම ස්වාධීනත්වය, ලෝකයේ ඒකාධිපති වියරු ආධිපත්‍ය අවසන් කිරීම ලෝකයේ පීඩිත ජාතීන්ව ගිල දමන්නන්, ජාතීන් විසින් ස්වයං නිර්ණ අයිතිය ගැනීම සහ රාජ්‍යයන් පිබිදීම, ලෝකයේ සෑම තැනකම සාමය සහ සර්ව සාධාරණත්වය පිහිටුවීම, පරාජය කළ නොහැකි සහ ශක්තිමත් සමාජ සංදර්භයක් පිහිටුවීම, මුස්ලිම්වරුන් සඳහා ඉස්ලාමීය අනන්‍යතාව වර්ධනය කිරීම, මුස්ලිම් සමාජවල විද්‍යාත්මක පසුගාමීත්වයෙන් මිදීම සහ මුස්ලිම්වරුන්ගේ ගැටලුවලට අවධානය යොමු කිරීම මින් ප්‍රධාන වේ.

මනුෂ්‍යත්වය සහ සර්ව සාධාරණත්වය ආගමක් කොට ගත් ඉරාන විප්ලවයේ නියමු ඉමාම් කොමෙයිනිතුමා ජාතියේ පිනට පහළ වූ අපේ කාලයේ සැබෑ වීරයෙකි.

එක්සත්කම පෙරටු කොට ගත් ඉමාම් කොමෙයිනිගේ විප්ලවීය දැක්ම අදටත් හෙටටත් එක සේ වැදගත් වනවා සේම එතුමාගේ ගුණ මෙනෙහි කිරීම මේ ලිපියේ අරමුණයි.

ලෝකයේ අනන්තවත් විප්ලව සිදුව ඇත. දේශපාලනික, සමාජමය, ආර්ථිකමය සහ සංස්කෘතිකමය හේතු පදනම් කොටගෙන බිහි වූ සමහර විප්ලව අවසන් වූයේ ලේ ගංගා මැදිනි. මෙසේ එක් එක් අරමුණු වෙනුවෙන් සිදු කළ විප්ලව අතර, ඉරාන ඉස්ලාමීය විප්ලවය මෙතෙක් ඉතිහාසයේ සිදු වූ වඩාත් මානුෂීය අරගලය වේ.

යහපත් මනුෂ්‍යයන් පිරිසක් සමස්ත ජාතිය සහ රටවැසියන් වෙනුවෙන් ඉදිරි පරම්පරා ගණනාවක ඉරණම සුබදායි ලෙස විසඳූ ඒකමතික සම්මුතිය ඉරාන විප්ලවයට තවත් නිර්වචනයකි. එහි නියමු ඉමාම් කොමෙයිනි නම් අසහාය වීර චරිතය ප්‍රචණ්ඩත්වයෙන් සහ අවස්ථාවාදී දේශපාලන වාසිවලින් තොරව ස්වකීය ජනයාගේ අයිතීන් වෙනුවෙන්ම නැඟී සිට අවසානය තෙක් සටන් කළ වීර නියමුවාය.

කෙසේ වෙතත් 1963 හි ඉමාම්තුමාගේ ඉස්ලාමීය ව්‍යාපාරයේ ආරම්භයේ සිට 1979 හි ඉරානයේ ඉස්ලාමීය විප්ලවය සිදු වීම ඉස්ලාමීය එක්සත් චින්තනයේ වැදගත් සන්ධිස්ථානයක් විය. රට අභ්‍යන්තරයේ සාමූහික බව සහ තවත් පැත්තකින් මුස්ලිම් රටවල එකමුතුකම වඩවාලීම විප්ලවයේ මූලික තේමාවක් විය.

තවද මේ එකමුතුකම සඳහා වූ කැඳවීමේ පෙර නිමිත්ත වූයේ ඉමාම් කොමෙයිනිමය. පූජනීය මානයක් තිබුණු එකමුතුකම පිළිබඳ ඉමාම් කොමෙයිනිගේ චින්තනය විශේෂ පරමාදර්ශයක් වූ අතර, 'එක්සත්කම සඳහා ඉමාම් කොමෙයිනිතුමාගේ චේතනාවන් මොනවාද සහ එතුමා හඹා යෑමට උත්සාහ කළ අරමුණු මොනවාද යන්න එක්සත්බව අදහන සියලු දෙනා දැන සිටිය යුතුය.

ලෝකයේ යුක්තිය පතුරුවා හැර ලෝකයේ පීඩිතයන්ගේ පක්ෂය ගොඩනැඟිය යුතුය. 'ලෝකයේ පිහිටුවා ගත යුතු පක්ෂයක්, ගෝලීය පක්ෂයක් වේ නම් එය පීඩිතයන්ගේ පක්ෂයයි. ගෝලීය මුස්ලිම්වරුන් ප්‍රමාණවත් දේශපාලන පරිනතභාවයකට පැමිණ ඔවුන්ගේම සංස්කෘතියට ආපසු පැමිණ ආත්ම විශ්වාසය ඇති කර ස්වයංපෝෂිත වීමට උත්සාහ කරනු ඇත. කිසි විටෙකත් බටහිරට බිය නොවන්න.' ඒ ඉමාම්ගේ තේමා පාඨයයි.

ඉමාම්තුමා සාමය සහ සන්සුන්භාවය ළඟා කර ගැනීමට සමඟිය අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකූ අතර, ඉස්ලාමීය ජනරජයට අවශ්‍ය වන්නේ සියලුම ජනරජයන් සහ අනෙකුත් අය සමඟ සාමයෙන් සහ සන්සුන්ව ජීවත් වීම එතුමා අවධාරණය කළහ.

සමානාත්මතාවයේ පදනම මත ලෝකයේ සියලුම රාජ්‍යයන් සමඟ මිත්‍රශීලී වීමට අපි එකිනෙකා සමඟ හොඳ සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් සහ ගෞරවයක් ඇති කර ගැනීමට අවශ්‍යයි.

එබැවින් මානව වර්ගයාගේ ප්‍රතිසංස්කරණය සඳහා ඉමාම් කොමෙයිනි තම ආගමික වගකීම් අනුව ලෝකයේ පීඩිතයන් සහ ලෝකයේ මුස්ලිම්වරුන් අතර සහයෝගීතාව ඇති කිරීම අවශ්‍ය යැයි සැලකූ බව පැවැසිය හැකිය. සමාජ සාධාරණත්වය පුළුල් කිරීම, මුළු ලෝකයේම සාමය සහ සාමය ස්ථාපිත කිරීම, ස්වයං විශ්වාසය සහ ආධිපත්‍ය නිෂේධනය කිරීම එතුමාගේ තවත් තේමාවන්ය.

කුද්ස් දිනය ඉස්ලාමයේ සහ උතුම් නබිතුමාගේ දිනය ලෙස සලකන අතර, එය අප සියලු බලයෙන් සන්නද්ධ විය යුතු දිනයකි. මුස්ලිම්වරුන්ට තමන් සිටින හුදෙකලා තත්ත්වය අත්හැරීමට හා නැඟී සිටීමට සිදු වේ.

ඉමාම් කුද්ස් නිදහස් කිරීම සියලුම මුස්ලිම්වරුන්ගේ යුතුකමක් ලෙස සැලකුවේය.

ඉමාම් කොමෙයිනි ඉස්ලාමීය සමඟියට සහ ලෝකයේ සියලුම පීඩිතයන්ට අවශ්‍ය සහ පදනම ලෙස ස්වාධීනත්වය, නිදහස සහ යුක්තිය සැලකුවේය. සාරාංශයක් ලෙස ඔහු විශ්වාසයේ වෙනස එකමුතුකම සාක්ෂාත් කර ගැනීමට බාධාවක් ලෙස විශ්වාස කළේය. ඉස්ලාමයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී සහ එහි ස්වෛරීභාවය සෑම මානයකින්ම සාක්ෂාත් කර ගැනීමේදී ඔහු එකමුතුකම එකම මාර්ගය ලෙස සැලකුවේය. ඉස්ලාමීය එකමුතුකමේ පරමාදර්ශය වඩා හරවත් කිරීමට පලස්තීන ප්‍රශ්නය සහ කුද්ස් විමුක්තිය වෙනුවෙන් පෙනී සිටියහ.

සියල්ලන්ටම අනිවාර්යය වන එක් වැදගත් කරුණක් වන්නේ ඉස්ලාමය ආරක්ෂා කිරීම සහ ඉස්ලාමීය ජනරජයේ ආරක්ෂාවයි. එය එකමුතුකම මත රඳා පවතින අතර, සමඟිය පිළිබඳ ප්‍රශ්නය ඉස්ලාමීය දේශයේ ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය කාරණයකි. අනෙක් අතට අසමඟිය අයහපත් කටයුත්තක් වන බැවින් එය වැළැක්විය යුත්තේ යහපත් දේ පැනවීම සහ අයහපත් දේ තහනම් කිරීම දිව්‍යමය බැඳීම්ය. දෙවියන්ගේ අණට කීකරු වීමේදී හොඳ දේ අණ කළ යුතු අතර, නරක දේ පාලනය කරමිනි.

අවසාන වශයෙන් ඉමාම් විසින් අදහස් කරන ලද ඉස්ලාමීය එකමුතුකම විශාල ජයග්‍රහණ මතු කර ඇති අතර, එය අනාගතයේදී මිහිරි ඵල දරයි. ඒ අතර මුස්ලිම්වරුන්ගේ සහ අනෙකුත් පීඩිත ජාතීන්ගේ ඉරාන විමුක්ති ව්‍යාපාරවල ඉස්ලාමීය විප්ලවය ද වේ. ගෝලීය එකමුතුව සහ මුස්ලිම්වරුන්ගේ උත්තරීතරභාවය සහ වංශවත් බව මින් එළිදැක්වේ. මේ අනුව ඉමාම්ගේ එකමුතු ආදර්ශ පාඨය ජයග්‍රහණයේ හේතුව සහ ඉස්ලාමීය සහජීවනයේ පැවැත්මේ යතුරයි.

**සටහන - ෆාතිමා ෂිෆානි**

# ආහාර අර්බුදයට මුහුණ දීමට සියලුම යුද හමුදා කඳවුරුවල වගා වැඩසටහනක්

## ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා



**අසේල කුරුළුවංශ**

ආහාර අර්බුදයට සාර්ථකව මුහුණ දීමට දිවයිනේ සියලුම යුද හමුදා කඳවුරු කේන්ද්‍ර කර ගනිමින් වගා වැඩසටහනක් ආරම්භ කර ඇතැයි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි.

යුද හමුදාපති ධුරයට සමුදුන් ශවේන්ද්‍ර සිල්වා මහතා පෙරේදා (05) මහනුවරට පැමිණ දළදා සමිඳුන් වැඳ පුදා ආශීර්වාද ගත් අතර, අනතුරුව මල්වතු අස්ගිරි උභය මහා විහාරීය මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දෙනමත් අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාත් බැහැදැක ආශීර්වාද ගෙන මෙලෙස අදහස් දැක්වීය.

"මේ වගා සංග්‍රාමයෙන් යුද හමුදාවේ ආහාර අවශ්‍යතාව මෙන්ම රටේ ආහාර අවශ්‍යතාවට ද උපරිම දායකත්වයක් දිය හැකියි. යම් ආහාර අර්බුදයක් පැන නගින්නේ නම් ඒ සඳහා සක්‍රීය අයුරින් දායකවීමට ශ්‍රී ලංකා යුද හමුදාව සිය උපරිම කාර්යභාරය ඉටු කරනවා.

ඉකුත් වසර දෙකේදී යුද හමුදාවේ ලක්ෂයක පමණ පිරිසකට උසස්වීම්දී තිබෙනවා. නිවාස නොමැති සෙබළුන්ට හමුදාවේ පූර්ණ ශ්‍රම දායකත්වය යටතේ නිවාස ඉදිකර දීමේ වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙනවා."

ත්‍රස්තවාදය නිමා කිරීමට මෙන්ම කොවිඩ් වසංගත තත්ත්වය පාලනය කිරීමට ශවේන්ද්‍ර සිල්වා මහතා කළ දායකත්වය අමතක කළ නොහැකි යැයි මෙහිදී මල්වතු පාර්ශ්වයේ මහා නායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල සහ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක වරකාගොඩ ඥාණරතන මහ නාහිමිවරු පැවැසූහ.

නෙල්ලිගල අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානාධිපති වතුරකුඹුරේ ධම්මරතන හිමියෝ ද මේ අවස්ථාවට සහභාගි වූහ.

# 21වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මහා කළු යකෙක් නොවේ

## එක්සත් ලක් වනිතා පෙරමුණේ සභාපතිනි ශාන්තිනී කෝන්ගහගේ

**ශිරෝමි අබයසිංහ**

විසි එක් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මහා කළු යකෙක් නොවන බව එක්සත් ලක් වනිතා පෙරමුණේ සභාපතිනි ශාන්තිනී කෝන්ගහගේ මහත්මිය පැවැසුවාය.

ඇය මේ බව පැවැසුවේ දඹදෙණිය ආසනයේ එක්සත් ලක් වනිතා පෙරමුණ පිහිටුවීමේ ආරම්භක වැඩසටහන අමතමිනි. පක්ෂයේ උප නායක අකිල විරාජ් කාරියවසම් මහතාගේ ප්‍රධානත්වයෙන් මේ වැඩසටහන පැවැත්විණි.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ ඇය මෙසේ ද කීවාය.

"අපේ රටේ කවදාවත් නොදුටු, නොසිතූ ලෙස එක දවසකින් එකම මොහොතක බරපතළ තත්ත්වයක් ඇති වුණා. එයට මුහුණ දුන් අය අද අප සමඟ සිටිනවා. අපට ඒ තත්ත්වයට නැවත මුහුණ දෙන්න අවශ්‍ය නෑ.

පළාත් සභා මැතිවරණ කල් දැමීම ගැන පාර්ලිමේන්තුවේ කිසි කෙනෙක් කතා කළේ නෑ. අද එහි සියලු දේ පාලනය වන්නේ ජනාධිපතිවරයාගේ නියෝජිතයා වන ආණ්ඩුකාරයා විසින්. 69 ලක්ෂයක් ඡන්දයදී පත් කර ගත් ජනාධිපතිවරයාගේ ආණ්ඩුව අද කඩා වැටී තිබෙනවා. මෙයට මූලික හේතුව ජනතාවගේ බඩට පහර දීම. කන්න නැති වෙන කොට, තෙල් ගෑස් නැති වෙන කොට මිනිසුන්ගේ ප්‍රශ්නය මහ පාරට ආවා. ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන එන්න සිදු වී තිබෙන්නේ මිනිස්සු මහ පාරට ආව නිසයි. මෙය රටේ පරමාධිපත්‍ය දරන ජනතාවගේ අවශ්‍යතාවට ගෙන ආ ආණ්ඩු ක්‍රම සංශෝධනයක්. ඒ නිසා මෙය මහා කළු යකෙක් ලෙස පෙන්වීම වැරදියි.

රට බරපතළ ආර්ථික අර්බුදයකට ලක් වන බව රනිල් වික්‍රමසිංහ මහතා 2020 සිටම පැවැසුවා. ඒ නිසා අන්තර්ජාතික මූල්‍ය අරමුදලට යන ලෙස ඔහු පාලකයන්ට කිව්වා. කොරෝනා වසංගත අවස්ථාවේදී ජපානය ඇතුළු ලෝක නායකයන්ට කතා කර අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ගන්නා ලෙස පැවැසුවා. ඔවුන් ඒ කිසිවක් ගණන් ගත්තේ නෑ. අපි නම් යන්නේ නෑ කියලා සමහර ඇමැතිවරුන් පුරසාරම් දෙඩුවා. ඒත් අද මොනවද වෙලා තිබෙන්නේ.

රට පාලනය කිරීමට ලෝක නායකයන් සමඟ ගනුදෙනු කරන්න පළපුරුද්ද ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතාට. ඔහු භාර ගත්තේ රටේ දරුවන්ගේ අනාගතය. අපේ රට මෙසේ පහළ තැනකට වැටේවි යැයි අප කවදාවත් හිතුවේ නෑ. ඒ ගැන රාජපක්ෂ පවුලට කිසිම සමාවක් නෑ. රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් වුණේ ඒ පවුල රකින්න නෙවෙයි. දුක් විඳින ජනතාවගේ පවුල් රකින්න. ඒ බව කියන්න බය වෙන්න එපා."

# සන්නිවේදන සහ මාධ්‍ය කලා අධ්‍යයන ආයතනයෙන් ලොව පිළිගත් සහතිකයක්

සන්නිවේදන හා මාධ්‍ය කලා අධ්‍යයන ආයතනයෙන් (DI-ICMAS) සන්නිවේදන සහ මාධ්‍ය පාඨමාලා හදාරන්නන්ට පිළිගත් අධ්‍යාපන සහතිකයක් සමඟ ලොව පිළිගත් NVQ 3,4 සහ 5 මට්ටමේ සහතිකයක් රජයෙන් දීමට සැලසුම් කර තිබේ.

සන්නිවේදන හා මාධ්‍ය කලා ආයතනය රජයේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකි. එසේම එම ආයතනය මාධ්‍යවේදීන්ට, නිවේදකයන්ට, ඡායාරූප ශිල්පීන්ට, ප්‍රචාරක නිලධාරීන්ට, ප්‍රවෘත්ති හා මාධ්‍ය නිලධාරීන්ට, නිවේදකයන්ට, සංස්කරණ ශිල්පීන්ට, වීඩියෝ කැමරා ශිල්පීන්ට NVQ 4 සහ 5 මට්ටමේ වෘත්තීය පුහුණුව දීමට සහතික කරන ලද පෞද්ගලික ක්ෂේත්‍රයේ පළමු ආයතනයයි.

සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන සහතික පත්‍ර පාඨමාලාව NVQ 4 මාස 06කි. සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව NVQ 5 මාස 12කි. පාඨමාලා ගාස්තු මාස තුනෙන් තුනට ගෙවිය හැකි අතර, එකවර ගෙවීමේදී සියයට 25ක වට්ටමක් දෙන බව එම ආයතනය පවසයි. නො 308, තෙවන මහල, ජනජය සිටි, නාවල පාර, රාජගිරියේ මේ ආයතනය පිහිටා තිබේ.

# ජාතික පොසොන් උත්සවයට සියල්ල සූදානම්

## අනුරාධපුර දිසාපති

**නිමල් විජේසිංහ - අනුරාධපුර අතිරේක දිස්ත්‍රික් සමූහ**

රජයේ මුදල් අවම ලෙස වැය කර පෞද්ගලික අංශයේ සහ පරිත්‍යාගශීලි දානපතීන්ගේ ධන පරිත්‍යාගයෙන් අනුරාධපුර මිහින්තලේ සහ තන්තිරිමලේ පුදබිම් කේන්ද්‍ර කර ගනිමින් 2330 වන ජාතික පොසොන් උත්සවය පැවැත්වීමට තීරණය කර ඇති බව 2022 පොසොන් උත්සව කමිටු සභාපති, අනුරාධපුර දිසාපති ජනක ජයසුන්දර මහතා 'දිනමිණ'ට ප්‍රකාශ කළේය.

2330 වැනි වරට පැවැත්වෙන රාජ්‍ය පොසොන් උත්සවය නිමිත්තෙන් මේ මස 11 වැනිදා සිට 17 වැනිදා දක්වා කාලය පොසොන් සතිය ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කර තිබේ. මෙවර පොසොන් උත්සව තේමාව වන්නේ 'වයිරය පිටු දකිමු' යන්නයි.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ අනුරාධපුර දිසාපතිවරයා මෙසේ කීය.

"කොවිඩ් වසංගතය නිසා පසුගිය වසර දෙකේ අනුරාධපුරය කේන්ද්‍ර කර ගත් ජාතික පොසොන් උත්සවය නිසි ආකාරයෙන් පැවැත්වීමට නොහැකි වුණා. රටේ පවත්නා අර්බුදකාරී තත්ත්වය යටතේ මෙවර මහා පරිමාණයෙන් පොසොන් උත්සව සංවිධාන කිරීම දුෂ්කරයි. පොසොන් උළෙල සාර්ථක කර ගැනීමට ඉහළ මට්ටමෙන් සහාය දුන් බොහෝ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට සුපුරුදු පරිදි මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාර උත්සව කටයුතු සඳහා දීමට නොහැකියි. විශේෂයෙන් රාජ්‍ය පොසොන් උත්සවය මුල්කර ගනිමින් අනුරාධපුර පුදබිමේ වාර්ෂිකව පැවැත්වෙන සම්ප්‍රදායික චාරිත්‍රානුකූල පොසොන් සති පිරිත් පිංකම මෙවර කොතරම් බාධක මධ්‍යයේ වුවත් අනිවාර්යයෙන්ම පුරාණ චාරිත්‍රානුකූලව පැවැත්විය යුතු බවට මහා සංඝරත්නය අවධාරණය කර තිබෙනවා. ඒ නිසා 10 වැනිදා සවස 03ට තිසා වැවෙන් ගන්නා පැන් මහ පෙරහරෙන් ඉසුරුමුණිය රාජමහා විහාරස්ථානයේ සිට මහ මෙවුනාවේ පිහිටුවා ඇති සුවිශේෂී පිරිත් මණ්ඩපයට ගෙනැවිත් පේ කිරීම සඳහා තැන්පත් කරනවා. පිරිත් පිංකම අවසානයේදී 17 වැනිදා නගරය වටා පිරිත් පැන් ඉසීමත්, 18 වැනිදා පිරිත් නූල් බෙදා දීමත් සමඟ මහ සංඝගත දක්ෂිණාවෙන් පසු 2022 රාජ්‍ය පොසොන් උත්සවය අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලු සුරාසැල් සහ මස් වෙළෙඳසල් මේ මස 11 සිට 17 දක්වා මුළුමනින්ම වසා තැබීමට උපදෙස්දී තිබෙනවා."

**රුවන්මැලි මහා චෛත්‍යාරාමාධිපති පල්ලේගම හේමරතන නාහිමි**

"මෙවර ජාතික පොසොන් උළෙලට තේමාවවී ඇති වයිරය පිටු දැකීම යන්නට අනුගත වෙමින් පටු දේශපාලන සහ සමාජයීය ප්‍රශ්නවලට අවයිරීව තැන්පත් මනසින් යුතුව නිහතමානීව විසඳාගැනීමට පාලකයන් මෙන්ම පාලිතයන් අදිටන් කර ගත යුතුයි."

උතුරු මැද ප්‍රධාන අධිකරණ සංඝනායක, අනුරාධපුර ලංකාරාමාධිකාරි රළපනාවේ ධම්මජෝති නාහිමි ද, මිහින්තලා රාජමහා විහාරාධිපති වලවාහැංගුණවැවේ ධම්මරතන නාහිමි ද, තන්තිරිමලේ විහාරාධිපති උතුරු නැගෙනහිර දෙපළාතේ උප ප්‍රධාන සංඝනායක තන්තිරිමලේ චන්ද්‍රරතන නාහිමි ද මෙහිදි අදහස් දැක්වූහ.

# තරුණ අරගලකරුවන් රටේ පවතින අර්බුදය හඳුනාගෙන තිබෙනවා

## දූෂණ විරෝධී කමිටුවේ හිටපු ලේකම් ලැසිල් ද සිල්වා

**සුභාෂිණී සේනානායක**

තරුණ අරගලකරුවන් ගෝඨා, මහින්ද ගෝ හෝම් ලෙස අරගල කරමින් ඉල්ලා සිටින්නේ රටේ පවතින අර්බුදය හඳුනාගැනීම හේතුවෙන් යැයි දූෂණ විරෝධී කමිටුවේ හිටපු ලේකම් ලැසිල් ද සිල්වා මහතා පවසයි.

ඒ මහතා මේ බව කියා සිටියේ ශ්‍රී ලංකා මනුසත් පක්ෂයේ පැවති මාධ්‍ය හමුවකට එක් වෙමිනි.

එම පක්ෂයේ නායිකා ආචාර්ය චන්ද්‍රිමා විජේගුණරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් මේ සාකච්ඡාව පැවැත්විණි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

"හොරකම් නැවැත්වීම, රජයේ වියදම් කපා හැරීම ඇතුළු පොරොන්දු ගණනාවක් දිය යුතු නිසා මේ අර්බුදය පැමිණීමට පෙර ආණ්ඩුව IMF ගියේ නෑ. අපේ රටට මේ තත්ත්වය ඇති වුණේ රටේ සම්පත් විනාශ කරමින් කටයුතු කිරීම නිසයි. පාලකයන් පාර්ලිමේන්තු කාර්යභාරය නිසියාකාරව සිදු කළේ නෑ. 2109 සිට අපේ රටේ ආදායම් කඩා වැටීමක් IMF වාර්තාවකින් පෙන්වාදී තිබෙනවා. බෞද්ධයන් කියන නායකයන් ජනතාව ඝාතනය වන තැනකට කටයුතු කර තිබෙනවා. අවාසනාවන්ත ලෙස මේ තත්ත්වය ඇති කළේ පැවති ආණ්ඩුව. බංගලිදේශය, ඉන්දියාව වැනි රටවල් වැටුණු අවස්ථාවේ එම රටවල් සංවර්ධනය කරා ගෙන ගියේ එහි පාලකයන් ගෙන ගිය වැඩපිළිවෙළ නිසයි. අපේ පාර්ලිමේන්තුවේ සිටින්නේ බහුතරයක් ව්‍යාපාරිකයන්. පාර්ලිමේන්තුවේ තත්ත්වය වෙනස් කළ යුතුයි. පාර්ලිමේන්තු සඳහා දක්ෂයන් පත් විය යුතුයි."

# ලංසු සඳහා ආරාධනයයි

## පළාත් පාලන දෙපාර්තමේන්තුව, නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය

## සුහුරු (Smart) රූපවාහිනි යන්ත්‍රයක් (Android TV) සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

1. ත්‍රිකුණාමලය, නැගෙනහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් සුහුරු (Smart) රූපවාහිනි යන්ත්‍රයක් සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
2. පහත සඳහන් පැකේජය ගෙනැවිත් භාරදියුතු කාලසීමාව, ගිවිසුම අත්සන් කළ දිනයේ සිට දින 21 කි.
3. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මඟින් ලංසු මෙහෙයවනු ලැබේ.

   මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වැඩිදුර තොරතුරු දුරකථන අංක : 026-2224034, ෆැක්ස් අංක : 026-2222075 ඔස්සේ ත්‍රිකුණාමලය, නැගෙනහිර පළාතේ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී වෙතින් ලබාගත හැකි අතර, රාජකාරි දිනයන් හි පෙ.ව. 09.00 හා ප.ව. 03.00 අතර කාර්යාල වේලාව තුළදී පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.
4. 2022 ජූනි 08 වෙනි දින සිට 2022 ජූනි 24 වෙනි දින දක්වා රාජකාරි දිනයන් හි පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර කාර්යාල වේලාව තුළදී ත්‍රිකුණාමලය, වරෝදයනගර්, නැගෙනහිර පළාතේ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත ආපසු ගෙවනු නොලබන රු. 1,000.00 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව පහත සඳහන් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය.
5. මුද්‍රා තබන ලද ලංසු, 2022 ජූනි 24 වෙනි දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදී පහත සඳහන් ලිපිනය වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ත්‍රිකුණාමලය, වරෝදයනගර්, නැගෙනහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ.
6. සියලුම ලංසු සමග පහත වගුවේ සඳහන් ආකාරයේ ලංසු ඇපකරයක් අමුණා එව්ය යුතුය.
7. ලංසු භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 77 ක් (හැත්තෑ හතක්) 2022-09-09 වෙනි දින දක්වා ලංසු වලංගු විය යුතුය.
8. පූර්ව ලංසු රැස්වීමක් 2022 ජූනි 20 වෙනි දින ප.ව. 3.00 ට ත්‍රිකුණාමය, නැගෙනහිර පළාතේ. පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් කාර්යාලයේදී පැවැත්වෙන අතර, මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් තමන්ගේ වියදමින් මෙම රැස්වීමට සහභාගි විය හැකිය.

| කොන්ත්‍රාත් අංකය | සේවා විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන) | ගෙනැවිත් භාරදිය යුතු කාලසීමාව | අවශ්‍ය ලංසු ඇපකරය | |
|---|---|---|---|---|---|
| | | | | ලංසු ඇපකරයේ වටිනාකම | වලංගු කාලය |
| EP/14/ACC/FG/G/01-2022 | සුහුරු (Smart) රූපවාහිනි යන්ත්‍රයක් (Android TV) සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය | මිලියන 6 යි | දින 21 යි | 60,000.00 | 2022-10-07 |

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් පාලන දෙපාර්තමේන්තුව,**
**නැගෙනහිර පළාත, ත්‍රිකුණාමලය.**
2022-06-07




## මහා නගර සභාව - කුරුණෑගල

## ප්‍රසම්පාදන දැන්වීම

කුරුණෑගල මහ නගර සභාවේ පහත සඳහන් කර්මාන්ත සඳහා ජාතික විවෘත තරඟකාරී මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | කර්මාන්තය | බදුදෙන කාලසීමාව වසර | මාසික අවම ලංසු මුදල බදු රහිත | එක් කඩ කාමරයක වර්ග අඩි ප්‍රමාණය | පෝරම ගාස්තු + වැට් 12% | ටෙන්ඩර් අප තැන්පත්/ ලංසු සුරක්ෂණය |
|---|---|---|---|---|---|---|
| 01 | ව්‍යාපාර සාප්පු සංකීර්ණයේ A කොටස බදු දීම | 05 | 366,025.00 | 6,800 | 3,360.00 | 10,000.00 |
| 02 | මහජන පොළ අංක 666 ඌරු මස් කඩය බදු දීම | 05 | 6,000.00 | 61.6 | 3,360.00 | 10,000.00 |
| 03 | මහජන පොළ අංක 664 මාලු කඩය බදු දීම | 05 | 21,709.00 | 92.4 | 3,360.00 | 10,000.00 |
| 04 | මහජන පොළ විවිධ සේවා සමුපකාර සමිති ආපන ශාලාව අංක 447 | 05 | 16,500.00 | 369.6 | 3,360.00 | 10,000.00 |
| 05 | මහජන පොළ ආපන ශාලාව අංක 448 | 05 | 72,257.00 | 442.86 | 3,360.00 | 10,000.00 |
| 06 | මල්කඩුවාව සාප්පු සංකීර්ණයේ අංක 4 කඩ කාමරය බදු දීම | 05 | 4,840.00 | 233.27 | 3,360.00 | 10,000.00 |
| 07 | නව සාප්පු සංකීර්ණයේ කඩ කාමර අංක 38 බදු දීම | 01 | 10,000.00 | 179.38 | 3,360.00 | 10,000.00 |
| 08 | MC PLAZA C 1 | දීර්ඝ කාලීන | වර්ග අඩියක් සඳහා අවම මූලික ගාස්තු රු.40,000.00 | 154.42 | 3,360.00 | 10,000.00 |
| 09 | MC PLAZA C 2 | දීර්ඝ කාලීන | වර්ග අඩියක් සඳහා අවම මූලික ගාස්තු රු.40,000.00 | 179.97 | 3,360.00 | 10,000.00 |

ඉහත කඩ කාමර බදු දීම සඳහා විවෘත තරඟකාරී මිල ගණන් කැඳවීමට කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තීරණය කර ඇත. ඉහත සඳහන් ලංසු කැඳවීම සඳහා වන ලංසු ලියවිලි **2022.06.08** සිට **2022.06.29** දින **ප.ව. 02.00** දක්වා කාර්යාල වේලාවන් තුළ දී කුරුණෑගල මහා නගර සභාවේ ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකිය. **2022.06.30** දින **ප.ව. 02.00** ට මහා නගර සභා කමිටු රැස්වීම් ශාලාවේ දී ටෙන්ඩරය විවෘත කරන අතර, ලංසුකරු නියෝජිතයෙකුට ඒ සඳහා සහභාගී විය හැකිය. අනෙකුත් විස්තර ටෙන්ඩර් ලියවිලි සමඟ ලබාගැනීමට හැකිය.

**වැඩි විස්තර සඳහා**
දුරකථන - 037 - 4941868/ 037- 4941869
ඊ මේල් - **ginumviyadam@gmail.com**

**නාගරික කොමසාරිස්,**
**මහා නගර සභාව,**
**කුරුණෑගල.**



## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පන්නිපිටිය, දෙපානම අංක 103 දරන ස්ථානයෙහි පදිංචි පොන්නම්පෙරුම ආරච්චිගේ ප්‍රීතිකා වන මා විසින් පන්නිපිටිය, දෙපානම අංක 103 දරන ස්ථානයේ පදිංචි පොන්නම්පෙරුම ආරච්චිගේ කැලුම් යන අය වෙත, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නාදිල් ධූශාන්ත මලාගොඩ විසින් 2007.09.04 වන දින සහතික කරන ලද අංක 6459 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලය, අද දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනලද බවත්, එම ඇටෝර්නි බලය යටතේ මින් ඉදිරියට ක්‍රියාත්මක කරනු ලබන්නාවූ මොනයම් ක්‍රියාවකට හෝ කටයුත්තකට හෝ මගේ කිසිදු වගකීමක් හෝ බැඳීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ එහි මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

**2022.06.01** **පොන්නම්පෙරුම ආරච්චිගේ ප්‍රීතිකා**




**මගේ අංකය : ඩීඑස්බී/එල්එන්ඩී/03/එල්අයි/38**
**ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,**
**බෙලිඅත්ත.**
**2022 ජූනි මස 02 දින**

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි අත්පත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ දැන්වීම

පහත උපලේඛනයේ විස්තර කරන ඉඩම රජයට පවරා ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා වර්ෂ 2022 මැයි මස 17 වැනි දින අංක 2280/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ III වන කොටස බලන්න.

### උපලේඛනය

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | : | හම්බන්තොට |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | බෙලිඅත්ත |
| ගම | : | අම්බල |
| පිහිටීම | : | හම්බන්තොට දිස්ත්‍රික්කයේ අංක 368 කුඩාහීල්ල උතුර ග්‍රාම නිලධාරී වසමේ අම්බලගම |
| සැලැස්මේ අංකය | : | අ.ග.පි. 300–19/17 |
| කැබලි අංකය | : | 617 |
| ප්‍රමාණය | : | හෙක්ටයාර් 0.0136 |

**ප්‍රාදේශීය ලේකම්,**
**බෙලිඅත්ත.**

## ජාත්‍යන්තර තරගකාරී මිල ගණන් කැඳවීම

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (පිරිපහදු කාර්යාංශය)**

### ප්‍රසිද්ධ ටෙන්ඩර් - 4426T

### මෝටරයකින් ක්‍රියාත්මක වන කරාමයක් සමග අමතර කොටස් (MOTOR OPERATED VALVE WITH SPARES) සැපයීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, පිරිපහදු කාර්යාංශය, සපුගස්කන්ද, කැලණිය, ශ්‍රී ලංකාව හි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි සභාපති විසින් නිෂ්පාදකයන්ගෙන් හෝ විදේශයන්හි සිටින ඔවුන්ගේ බලය ලත් අපනයනකරුවන්ගෙන් හෝ ඔවුන් බලය පවරන ලද දේශීය නියෝජිතයන්ගෙන් හෝ මිල ගණන් කැඳවීමේ පත්‍රයේ සඳහන් පිරිවිතර හා කොන්දේසිවලට අනුකූල වූ ඉහත සඳහන් ද සැපයීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

කිසියම් ලංසු තබන්නෙකු, මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම්, අයදුම්පත් සඳහා ආපසු නොගෙවන රු. 1,000.00 ක මුදලක් 2022 ජූනි 27 දින 1500 වන පැය දක්වා කාර්යාල දිනවලදී අංක 609, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09, ස්ථානයෙහි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ප්‍රධාන කාර්යාලයහි 05 වන මහලෙහි මුදල් අයකැමිට හෝ පිරිපහදු කාර්යාංශය, සපුගස්කන්ද කැලණියහි මුදල් අයකැමිට ලිපියක් ඉදිරිපත් කිරීමෙන් මුදලින් කළ යුතු අතර, සියලු ගෙවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 004100110208633 දරන මහජන බැංකුවේ ගිණුම හරහා ටෙන්ඩර් අංකය සහ ලංසුකරුගේ නම කෙටියෙන් සඳහන් කරමින් මුදලින් කළ හැකිය.

මිල ගණන් කැඳවීමේ පත්‍රයේ කොන්දේසි සහ පිරිවිතර www.ceypetco.gov.lk සහ www.dgmarket.com යන වෙබ් අඩවියන්හි අන්තර්ගත වේ.

තවද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් අයගෙන්ද ලබාගත හැකිය.

මිල ගණන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2022 ජූනි 29 දින 1430 පැය දක්වා භාරගන්නා අතර, එම මොහොතේම පිරිපහදු පුහුණු ශ්‍රවණාගාරයේදී විවෘත කරනු ලැබේ.

**කළමනාකාර (ද්‍රව්‍ය)**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,**
**පිරිපහදු කාර්යාංශය,**
**සපුගස්කන්ද, කැලණිය.**
**දු. ක. 011 2 400 110**
**වි.තැ. ref.materials@ceypetco.gov.lk**

CSIAP THE WORLD BANK

## ලංසු සඳහා ආරාධනයයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

### ජාතික තරගකාරී ලංසුකරණය

### දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP)

**ව්‍යාපෘති අංකය : P163742**

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙතින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියෙහි පිරිවැය සඳහා වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 125 සමාන ණය මුදලක් ලැබී ඇති අතර, ඉන් කොටසක් පහත වගුවේ සඳහන් කොන්ත්‍රාත් යටතේ වන සුදුසුකම්ලත් ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂිතය.

02. ඒ අනුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) වෙනුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (නැගෙනහිර පළාත) සභාපති විසින් සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් පහත වගුවේ සඳහන් ඉදිකිරීම් කාර්ය ඉටුකිරීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | (සීඩා) CIDA ලියාපදිංචිය | ආපසු නොගෙවන ගාස්තු (ශ්‍රී.ලං. රු.) | ලංසු සුරක්ෂණ වටිනාකම (ශ්‍රී.ලං.රු.) සහ වලංගුභාවය දිනය | කොන්ත්‍රාත් කාලය (දින) |
|---|---|---|---|---|---|---|
| 01 | LK-MOA-277073-CW-RFB/EP/DPDO/Rehb.T(5)/2022/001 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කඩවත වැව ප්‍රතිසංස්කරණය කිරීම | C 4 හෝ ඊට වැඩි (වාරිමාර්ග සහ ජලාපවහන ඇළ මාර්ග) | 9,000.00 | රු. 450,000.00 2022 නොවැම්බර් 24 | 180 |
| 02 | LK-MOA-277067-CW-RFB/EP/DPDO/Rehb.T(14)/2022/004 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සින්න උඩ වැව, කුඩා කඳමලව වැව, නාවත්කුලම් වැව සහ හැලඹ වැව ප්‍රතිසංස්කරණය කිරීම | C 4 හෝ ඊට වැඩි (වාරිමාර්ග සහ ජලාපවහන ඇළ මාර්ග) | 9,000.00 | රු. 715,000.00 2022 නොවැම්බර් 24 | 180 |
| 03 | LK-MOA-276935-CW-RFB/EP/DPDO/Rehb.T(46)/2022/009 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුඩාපතික්කඩ්ඩියාව වැව ප්‍රතිසංස්කරණය කිරීම | C 4 හෝ ඊට වැඩි (වාරිමාර්ග සහ ජලාපවහන ඇළ මාර්ග) | 9,000.00 | රු. 350,000.00 2022 නොවැම්බර් 24 | 180 |
| 04 | LK-MOA-276951-CW-RFB/EP/DPDO/Rehb.T(104)/2022/015 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කායන් වැව, කරංගහ වැව සහ බෙල්ලිකඩවෙල වැව ප්‍රතිසංස්කරණය කිරීම | C 4 හෝ ඊට වැඩි (වාරිමාර්ග සහ ජලාපවහන ඇළ මාර්ග) | 9,000.00 | රු. 715,000.00 2022 නොවැම්බර් 24 | 180 |
| 05 | LK-MOA-277062-CW-RFB/EP/DPDO/Rehb.T(119)/2022/018 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුඩාදිවුල්වැව, දිවුල්වැව සහ පලුගස්වැව ප්‍රතිසංස්කරණය කිරීම | C 4 හෝ ඊට වැඩි (වාරිමාර්ග සහ ජලාපවහන ඇළ මාර්ග) | 9,000.00 | රු. 650,000.00 2022 නොවැම්බර් 24 | 180 |

03. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, ත්‍රිකුණාමලය, උප්පුවේලි, ලව්ලේන්හි (නැගෙනහිර පළාතේ) නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියෙහි නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (දුරකථනය – 026-2054999, ෆැක්ස් : 026–2054999) වෙතින් ලබාගත හැකි අතර, එම ස්ථානයේදීම රාජකාරී දිනවල, 9.00 පැය හා 15.00 පැය අතර කාලය තුළ, අදාළ ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැක.

05. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරුවා අපලේඛනගතවූ අයෙකු නොවිය යුතු අතර, ලංසු ලේඛනයන්හි සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය. තවද, සාර්ථක ලංසුකරුවා සතුව ඉහත වගුවේ සඳහන් වාරිමාර්ග හා ජලාපවහන ඇළමාර්ග විශේෂඥතාවයේ, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (සීඩා) වලංගු ලියාපදිංචි ශ්‍රේණියක් තිබිය යුතුය. ලංසුකරුවන්හට, එකකට වඩා කොන්ත්‍රාත් ගණනක් සඳහා ලංසු ඉදිරිපත් කළ හැකි නමුත් තෝරාගැනීම, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය හා අනෙකුත් ධාරිතා සීමාවන් ප්‍රකාරව සිදු කරනු ඇත.

06. ආපසු ගෙවනු නොලබන ගාස්තු (ඉහත වගුවේ සඳහන් පරිදි වූ වටිනාකමට) මුදලින් ගෙවීමෙන් හා ඉහත අයිතම 4 හි සඳහන් ලිපිනයේ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත මුල් ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, රාජකාරී දිනවල 2022 ජූනි මස 07 වන දින සිට 2022 ජූනි මස 28 වන දින දක්වා 09.00 පැය හා 14.00 පැය අතර කාලය තුළ සුදුසුකම්ලත් ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

07. මේ සම්බන්ධව පෙර – ලංසු හමුවක් හා ඉන් පසුව වැඩබිම් චාරිකාවක් ඉහත අයිතම 4 සඳහන් ස්ථානයේදී 2022 ජූනි මස 20 වන දින 9.30 පැයට සිදු කරනු ලැබේ. අපේක්ෂිත ලංසුකරුවන්හට අදාළ නිලධාරීන්ගේ සහාය ඇතිව තම පුද්ගලික වියදමින් අදාළ වැඩ බිම් පරීක්ෂා කොට බලන ලෙස ඉල්ලීමක් කෙරේ.

08. ලංසු සමග කොන්දේසි විරහිත ලංසු ලේඛනයන්හි නිර්දිෂ්ඨ ආකෘතියෙන් යුත් ඉහත වගුවේ සඳහන් වටිනාකමට හා දිනයට අනුව වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය. ඉහතින් සඳහන් පරිදි වූ වලංගු ලංසු ඇපකරයක් නොමැතිව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතිචාර නොදැක්වූ ඒවා බවට සලකා කිසිදු විමසීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. ලංසු ලේඛනයන්හි සියලුම පිටු ලංසුකරු විසින් අත්සන් කොට නිල මුද්‍රාව තබා තිබිය යුතුය.

10. ලංසු, මුල් පිටපත හා අනුපිටපත ලෙස පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. එම පිටපත් දෙක වෙන් වශයෙන් කවර දෙකක බහා ඒවායේ එසේ "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස සටහන් කොට, එම කවර දෙක යළි මුද්‍රා තැබූ තනි කවරයක බහා එහි වම් ඉහළ කෙළවරේ කාර්ය විස්තරය හා කොන්ත්‍රාත් අංකය සඳහන් කළ යුතුය.

11. සම්පූර්ණ කළ ලංසු, මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, (නැගෙනහිර පළාත), දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය (නැගෙනහිර පළාත), ලව් ලේන්, උප්පුවේලි, ත්‍රිකුණාමලය යන ලිපිනයට 2022 ජූනි 30 දින 14.00 පැයට (ප.ව. 2.00) පෙර ලැබීමට සැලැස්විය යුතුය.

12. ලංසු භාර ගැනීම 2022.06.30 වන දින 14.00 පැයට (ප.ව. 2.00) අවසන් කරනු ලැබේ. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

**Dr. ආර්.එම්. ආරියදාස**
**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව (නැගෙනහිර පළාත),**
**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,**
**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය (නැගෙනහිර පළාත),**
**ලව් ලේන්, උප්පුවේලි, ත්‍රිකුණාමලය.**
**දිනය - 2022.06.07**

**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය**

## නේවාසික පහසුකම් සැලසීම සඳහා නිවාස බද්දට ගැනීම

01. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර වශයෙන් භාවිත කිරීමට සුදුසු නිවාස බදු පදනම මත ලබාගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මේ සඳහා උනන්දුවක් දක්වන නිවාස හිමිකරුවන්ට නිරවුල් අයතියක් ඇති නිවාස සඳහා පහත සඳහන් තොරතුරු ඇතුලත් ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය. බදු කාලසීමාව වසර 02 කි. රජයේ තක්සේරු මිලට යටත්ව බදු ගැනීම සිදුකරනු ලැබේ.
   i. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සිට කි. මී. 05 ක් ඇතුළත පිහිටි සිසුන් 30 – 40 කට පමණ නේවාසික පහසුකම් සැලසිය හැකි නිවාස විය යුතුය.
   ii. ප්‍රමාණවත් ජල, විදුලි හා සනීපාරක්ෂක පහසුකම්වලින් සමන්විත විය යුතු අතර, නිවස වටා තාප්ප හා ගේට්ටු සවිකර ආරක්ෂිත පරිසරයක පිහිටා තිබිය යුතුය.
   iii. පැහැදිලි හා නිරවුල් ප්‍රවේශ මාර්ගයක් තිබිය යුතුය.
   iv. අපේක්ෂිත මාසික බදු කුලිය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

03. ජාතික තරගකාරී මිල ගණන් කැඳවීම යටතේ ටෙන්ඩර් කැඳවනු ලැබේ.

04. සියලුම ටෙන්ඩර්පත් 2022.06.21 දින ප.ව. 02.00 ට පෙර ශිෂ්‍ය සුබසාධන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු අතර, එදින ප.ව. 02.15 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සඳහා ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් සහකාර ලේඛකාධිකාරී (ශිෂ්‍ය සුබසාධන) 033-2222618 වෙතින් විමසිය හැකිය.

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය,**
**යක්කල.**
**2022.06.07**

## ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ දැන්වීම

**ප්‍රා.ලේ. යොමු අංකය : DSM/YT/LAND/5/8**

**ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 13/96/HA/381**

මෙහි උපලේඛනයේ විස්තර සඳහන් ඉඩම යටවත්ත ප්‍රාදේශීය ලේකම් සහ සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාස සඳහා රජයට පවරා ගැනීමට අදහස් කර ඇත. මේ පිළිබඳව වැඩි විස්තර සඳහා අංක 2272/41 හා 2022-03-23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය බලන්න.

### උපලේඛනය

| | |
|---|---|
| පළාත | : මධ්‍යම |
| දිස්ත්‍රික්කය | : මාතලේ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : යටවත්ත |
| ගමේ නම | : දීවිල්ල |
| ඉඩමේ නම | : ඩන්ගන්වත්ත |
| සැලැස්මේ අංකය (මූලික පිඹුර) | : මු.පි.මා. 1855 |

**ඩී.ආර්.කේ. හෙන්නායක,**
**ප්‍රාදේශීය ලේකම්,**
**යටවත්ත.**

2022-06-01
**යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී.**

## ජාත්‍යන්තර තරගකාරී මිල ගණන් කැඳවීම

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (පිරිපහදු කාර්යාංශය)**

### ප්‍රසිද්ධ ටෙන්ඩර් - 4435T

### ASTM A 283 Gr.C ප්‍රමිතියට සාදන ලද වානේ තහඩු (CARBON STEEL PLATES) සැපයීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, පිරිපහදු කාර්යාංශය, සපුගස්කන්ද, කැලණිය, ශ්‍රී ලංකාව හි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි සභාපති විසින් නිෂ්පාදකයන්ගෙන් හෝ විදේශයන්හි සිටින ඔවුන්ගේ බලය ලත් අපනයනකරුවන්ගෙන් හෝ ඔවුන් බලය පවරන ලද දේශීය නියෝජිතයන්ගෙන් හෝ මිල ගණන් කැඳවීමේ පත්‍රයේ සඳහන් පිරිවිතර හා කොන්දේසිවලට අනුකූල වූ ඉහත සඳහන් ද සැපයීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

කිසියම් ලංසු තබන්නෙකු, මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම්, අයදුම්පත් සඳහා ආපසු නොගෙවන රු. 3,500.00 ක මුදලක් 2022 ජූනි 27 දින 1500 වන පැය දක්වා කාර්යාල දිනවලදී අංක 609, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09, ස්ථානයෙහි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ප්‍රධාන කාර්යාලයහි 05 වන මහලෙහි මුදල් අයකැමිට හෝ පිරිපහදු කාර්යාංශය, සපුගස්කන්ද කැලණියහි මුදල් අයකැමිට ලිපියක් ඉදිරිපත් කිරීමෙන් මුදලින් කළ යුතු අතර, සියලු ගෙවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 004100110208633 දරන මහජන බැංකුවේ ගිණුම හරහා ටෙන්ඩර් අංකය සහ ලංසුකරුගේ නම කෙටියෙන් සඳහන් කරමින් මුදලින් කළ හැකිය.

මිල ගණන් කැඳවීමේ පත්‍රයේ කොන්දේසි සහ පිරිවිතර www.ceypetco.gov.lk සහ www.dgmarket.com යන වෙබ් අඩවියන්හි අන්තර්ගත වේ.

තවද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් අයගෙන්ද ලබාගත හැකිය.

මිල ගණන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2022 ජූනි 29 දින 1430 පැය දක්වා භාරගන්නා අතර, එම මොහොතේම පිරිපහදු පුහුණු ශ්‍රවණාගාරයේදී විවෘත කරනු ලැබේ.

**කළමනාකාර (ද්‍රව්‍ය)**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව,**
**පිරිපහදු කාර්යාංශය,**
**සපුගස්කන්ද, කැලණිය.**
**දු. ක. 011 2 400 110**
**වි.තැ. ref.materials@ceypetco.gov.lk**

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

### නෂ්‍යවන භාණ්ඩ විකිණීම

### වෙන්දේසි පවත්වන දිනය 2022-06-08

**මගේ අංකය LD/S/SLPA/2022/05/PC-19,**
**LD/S/SLPA/2022/05/PC-20,**
**LD/S/CICT/2022/05/PC-12,**
**LD/S/CICT/2022/05/PC-16**

කොළඹ වරායේ JCT සහ CICT අංගනයේ තැන්පත්කර ඇති නෂ්‍යවන සුළු භාණ්ඩ සහිත බහලු හයක් (ලොකු එළුණු, ඇපල්, සුදුළුණු) මිලදීගෙන ඉවත්කර ගැනීම සඳහා 2022-06-08 දින 10.00 පැයට බණ්ඩාරණායක තටාකයේ සුභසාධක ගොඩනැගිල්ලේ මෙම ප්‍රසිද්ධ වෙන්දේසිය කැඳවනු ලැබේ.

වෙන්දේසි භූමියට ඇතුළුවීම සඳහා අවසරපත් ලබා ගැනීමට හා ටෙන්ඩර් පෝරම, ආපසු නොගෙවනු ලබන රු. 1,000/- ක මුදලක් අගය මත බදු හා ආපසු ගෙවනු ලබන රු. 200,000/- ක ඇප මුදලක් ගෙවීමෙන් **කැනල් අංගනය, නො. 15, ලෝටස් වීදිය, කොළඹ 01** හි පිහිටා ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා සැපයුම් කොට්ඨාසයේ විකුණුම් අංශයේ කාර්යාලයෙන් 2022-06-07 දින 08.30 පැයේ සිට 12.00 පැය දක්වා කාලය තුළ ලබාගත හැක.

එදින 13.00 පැයේ සිට සවස 15.00 පැය දක්වා භාණ්ඩ අදාළ අංගන තුළදී පරීක්ෂා කළ හැක.

වැඩි විස්තර සඳහා (www.slpa.lk) වෙබ් අඩවියට පිවිසෙන්න.

**ප්‍රධාන කළමනාකරු (සේවා සැපයුම්),**
**2022-06-07**
**සේවා සැපයුම් කොට්ඨාසය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**නො. 15, ලෝටස් වීදිය,**
**කොළඹ 01.**

BIZLINE
දිනමිණ 2022 ජූනි 07 අඟහරුවාදා
ව්‍යාපාරික පුවත්
biz.dinamina@lakehouse.lk



# 'අනගි' ගිණුම්හිමියන්ට විශේෂ මිලකට රක්ෂණාවරණ

කොමර්ෂල් බැංකුවේ 'අනගි' කාන්තා බැංකුකරණ කළඹ යටතේ කාන්තා ගිණුම්හිමියන්ට අඩු වාරික සමඟ විශේෂ ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ දීම සඳහා බැංකුව රක්ෂණ සමාගම් කිහිපයක් සමඟ ඒකාබද්ධ වී ඇත.

කාන්තා ගිණුම් හිමියන්ට දක්වන සැලකිල්ල පුළුල් කරමින් ජීවිත රක්ෂණ, ව්‍යාපාරික රක්ෂණ සහ නිවාස රක්ෂණ විකල්ප දෙන බව බැංකුව සඳහන් කරයි.

මේ රක්ෂණ සඳහා අදාළ වන විශේෂ රක්ෂණ වාරික අනුපාතයන්ට අමතරව ඉතා සරල ක්‍රියාවලියක් මඟින් මේ රක්ෂණය ගත හැකි බවත් කාන්තාවන්ට මේ රක්ෂණය තම ස්වාමිපුරුෂයාටත් දීර්ඝ කළ හැකි බවත් බැංකුව සඳහන් කරයි. මේ වැඩසටහනින් රක්ෂණාවරණ දීම තුළින් 'අනගි' කාන්තා බැංකුකරණ කළඹේ ප්‍රධාන අරමුණක් වන්නේ මූල්‍ය සමානාත්මතාව ඇති කිරීම බව ද බැංකුව පවසයි.

මේ යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියනයේ සිට රුපියල් මිලියන 5ක් දක්වා වටිනාකමක් තිබෙන ජීවිත රක්ෂණාවරණයක් ගත හැකි අතර, රක්ෂණ ඔප්පු කාලසීමාව තුළදී වන 'ස්වාභාවික සහ හදිසි මරණ' මෙමඟින් ආවරණය වේ.

# එයිට්කන් ස්පෙන්ස් සමාගමට බිලියන 14.2ක ඉතිහාසගත ලාභයක්

ලෝකයේ කර්මාන්තකරුවන් ශ්‍රේණිගත කිරීමේදී එහි පළමු 100 දෙනා අතරට ඇතුළත් වූ එකම ශ්‍රී ලාංකීය සමාගම වන එයිට්කන් ස්පෙන්ස් සමාගම 2021/2022 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 14.2ක ලාභයක් වාර්තා කර තිබේ. එය එයිට්කන් ස්පෙන්ස් සමාගම විසින් මෙතෙක් වාර්තා කරන ලද ඉහළම ලාභය ලෙසින්, සමාගමේ වසර 150ක සාඩම්බර ඉතිහාසයට එක් වෙයි.

අන්තර්ජාතික වශයෙන් විශාල පිළිගැනීමක් ඇති එමෙන්ම මූල්‍ය වශයෙන් ඉතා ස්ථාවර තත්ත්වයක පිහිටි විවිධාංගීකරණය වූ සමාගමක් වන එයිට්කන් ස්පෙන්ස් සමාගම, 2021/2022 මූල්‍ය වර්ෂය සඳහා බදු ගෙවීමට පෙර රු. බිලියන 14.2ක ලාභයක් පෙන්වා තිබේ. ඒ මේ වසරේ මාර්තු මස 31 දායින් අවසන් වූ මාස 12ක කාලය වෙනුවෙනි.

පසුගිය වසරේ මේ කාලය වෙනුවෙන් විඳීමට වූ පාඩුව රුපියල් බිලියන 2.8ක් විය. එම කාලය හා සංසන්දනය කිරීමේදී මේ අතිවිශිෂ්ට කාර්යසාධනය මෙහෙයවනු ලැබුවේ රටවල් අටක් පුරා පැතිරී පවතින මෙහෙයුම් 16ක කාර්යශූරත්වය විසිනි.



සභාපති දේශමාන්‍ය ඩී. එච්. එස්. ජයවර්ධන

නියෝජ්‍ය සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ ආචාර්ය පරාක්‍රම දිසානායක

එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ මෙහෙයුම්වල විවිධත්වය සහ පවතින තත්ත්වයන්ට අනුවර්තනය වන සුවිශේෂී නායකත්වය මේ ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේදී කැපී පෙනෙන මෙහෙවරක් කර තිබේ. සියලු අංශ විසින් අනුගමනය කරන ලද කාර්යක්ෂමතාව සහ පිරිවැය දැඩි ලෙස කළමනාකරණය කිරීම මගින් ඉතා අසීරු සමාජ - ආර්ථික තත්ත්ව යටතේ වුව ද මැනවින් තම ව්‍යාපාරික කටයුතු කරගෙන යෑමට එයිට්කන් ස්පෙන්ස් සමූහයට ඇති හැකියාව පිළිබඳ වත්මන් තත්ත්වය කදිම සාක්ෂියකි. වත් පොහොසත්කම්වලින් අනූන සමාගමක් වන එයිට්කන් ස්පෙන්ස් සමාගම ගෙවී ගිය මූල්‍ය වර්ෂය තුළදී සිය මුළු වත්කම් පදනම 34.3%කින් වර්ධනය කර ගත්තේය.

2022 මාර්තු 31 දායින් නිමා වූ මූල්‍ය වර්ෂය අවසානයේදී එහි අගය රු. බිලියන 197.3ක් වී තිබිණ. මේ වත්කම්වලින් බිලියන 127.9ක් ක්ෂණිකව මුදලට පරිවර්තනය (තක්සේරු) කළ නොහැකි වත්කම් වේ. ඒවා ප්‍රධාන වශයෙන් දේපොළ, කම්හල් සහ උපකරණ මේ ක්ෂණිකව තක්සේරු කළ නොහැකි සම්පත්වලට අයත් වේ. සමූහයේ විවිධත්වය තවදුරටත් වර්ධනය වන්නේ එම මුළු වත්කම්වලින් 46.7%ක් විදේශීය මෙහෙයුම්වලින් පැමිණෙන බැවිනි.

මේ වසරේ මාර්තු 31 දා වන විට එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ ශුද්ධ වත්කම් කොටසක වටිනාකම රුපියල් 162.44ක් වී තිබිණ. එය පෙර වසරට වඩා 33.3%ක වර්ධනයකි.

## වසරකට හෙද රැකියා 500ක්

# IIHS හා NHS East of England අවබෝධතා ගිවිසුමක



මෙරට සෞඛ්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන IIHS (International Institute of Health Sciences) ආයතනය එංගලන්තයේ සෞඛ්‍ය සේවා සපයන ප්‍රධානම ආයතනයක් වන NHS East of England සමග ඓතිහාසික ගිවිසුමකට එළැඹිණි. IIHS ප්‍රධාන විධායක නිලධාරි වෛද්‍ය කිත්සිරි එදිරිසිංහ මහතා සහ James Paget University Hospitalහි හෙද අධ්‍යක්ෂ පෝල් මොරිස් යන මහත්වරුන් මේ ගිවිසුමට අත්සන් තැබූහ. මේ අවස්ථාවට NHS-East of Englandහි අධ්‍යක්ෂවරුන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ලෙස Paul Morris, Neil Fisher, Emma Wakelin, Dayani Baiai යන මහත්ම මහත්මීන් ඇතුළු 15කින් යුත් කණ්ඩායමක් සහභාගි වූහ. මේ ගිවිසුමට අනුව IIHS ආයතනය වාර්ෂිකව පුහුණු හෙද හෙදියන් 500ක් එංගලන්තයේ සේවය සඳහා යැවීමට නියමිතය. වාර්ෂිකව එංගලන්තයේ සෞඛ්‍ය සේවා සඳහා හෙද හෙදියන් 50,000ක් අවශ්‍ය වේ.

NHS ආයතනය පිරිනමන මේ රැකියා ගැනීමට IIHS ආයතනය හෙද හෙදියන් සඳහා සය මාසික විශේෂ පුහුණු පාඨමාලාවක් පවත්වයි. පාඨමාලාව සඳහා බැංකු ණය පහසුකම් ගැනීමට ද IIHS ආයතනය සහාය දක්වයි. ශ්‍රී ලංකා රජයේ පුහුණු ශ්‍රමිකයන් විදේශගත කිරීමේ සංකල්පයට අනුකූලව මේ ව්‍යාපෘතිය හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හෙද හෙදියන්ට මේ සය මාසික පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය. එංගලන්තයට යන හෙද හෙදියන්ට සිය සැමියා හෝ බිරිය නීත්‍යානුකූලව එරටට ගෙන්වා ගත හැකි අතර, ඔහුට හෝ ඇයට පූර්ණ වශයෙන් රැකියාවක් ද කළ හැකිය. එසේ යන සැමියා හෝ බිරිය සෞඛ්‍ය සේවා සහකාර :(Healthcare Assistant) ලෙස පුහුණු කිරීමට ද IIHS ආයතනය ක්‍රියා කරයි. සැමියාට හෝ බිරියට අමතරව දරුවන් ද එංගලන්තයට රැගෙන යා හැකිය. ඔවුන්ට නොමිලේ අධ්‍යාපනය ද ලැබිය හැකිය. වැඩි විස්තර info@iihsciences.edu.lk විද්‍යුත් ලිපිනයෙන් ගත හැකිය. “මේ අවස්ථාව ලැබුණේ NHS ආයතනය අප කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය නිසයි. අපගේ අධ්‍යාපන ක්‍රියාදාමයේ ඇති විනිවිදභාවය අපව තෝරා ගැනීමට ප්‍රධාන හේතුවක්.” IIHS ප්‍රධාන විධායක නිලධාරි කිත්සිරි එදිරිසිංහ මහතා පැවසීය.

# සිංගර් ශ්‍රී ලංකා TCL 20L+ සමඟින් සිය දුරකථන නිෂ්පාදන පෙළ පුළුල් කරයි

ශ්‍රී ලංකාවේ තාක්ෂණික උපාංග ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන සිංගර් ශ්‍රී ලංකා සමාගම හඳුන්වා දෙන නවතම ජංගම දුරකථන මාදිලිය වන TCL 20L+ සමඟින් සිය ජංගම දුරකතන පෙළ පුළුල් කිරීමට කටයුතු කර ඇත. TCL 20L+ ජංගම දුරකථන මාදිලිය TCL 20 ජංගම දුරකථන නිෂ්පාදන පෙළට අයත්, තිරයෙහි ගුණාත්මක භාවය වැඩි දියුණු කරන ලද නිෂ්පාදනයකි. මේ නව නිෂ්පාදනය තුළින්, උසස් තත්ත්වයෙන් යුතු ජංගම දුරකථන තිර නිෂ්පාදනය කිරීම පිළිබඳ TCL දක්වන විශේෂඥ භාවය නැවතත් තහවුරු කරන බව පැවසුවහොත් එය නිවැරැදිය.

NXTVISION තාක්ෂණයෙන් බලගන්වා ඇති Qualcomm Snapdragon 662 Octa-core ප්‍රොසෙසරය සහ අඟල් 6.67 FHD+ 60Hz තිරය මඟින් ඉහළ කාර්යසාධනයක් තහවුරු කරන TCL 20L+ ජංගම දුරකථනය Milky Way Black සහ North Star Blue යන මාදිලි දෙකෙන්ම වෙළෙඳපොළට නිකුත් කෙරෙන අතර, එය www.singersl.com වෙබ් අඩවිය මඟින්, ඕනෑම සිංගර් අලෙවිසලකින් මෙන්ම ඕනෑ ම බලයලත් අලෙවි නියෝජිතයකුගෙන් මිල දී ගත හැකිය.

සිංගර් ශ්‍රී ලංකා සමාගම බලශක්තිය ඉතිරි කරන නිෂ්පාදන ශ්‍රී ලාංකේය වෙළෙඳපොළ වෙත නිකුත් කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කරන බව පැවසුවහොත් නිවැරැදිය. Rheinland Circular Polarization සහතිකය සහ Low Blue Light සහතිකය ලබා ඇති TCL 20L+ ජංගම දුරකථනය 64-megapixel primary shooter, 8 megapixel wide-angle, 2-megapixel macro and 2-megapixel depth cameras ඇතුළුව පසුපස කැමරා හතරකින් සහ Selfie සඳහා වඩාත් සුදුසු 16-megapixel ඉදිරිපස කැමරාවකින් යුක්ත ආකර්ෂණීය කැමරා පද්ධතියකින් සමන්විතය.



# DIMO සහ Allianz වෙතින් TATA පාරිභෝගිකයන්ට විශේෂ රක්ෂණයක්

මෙරට ප්‍රමුඛ පෙළේ විවිධාංගීකරණය වූ සමාගමක් වන DIMO, දැනට ලොව සිටින විශාල රක්ෂණ හා මූල්‍ය සේවා සැපයුම්කරුවකු වන Allianz හා එක්ව DIMOහි TATA ගනුදෙනුකරුවන් වෙනුවෙන්ම නිර්මාණය වූ රථ වාහන රක්ෂණ සේවාවක් පසුගියදා හඳුන්වා දෙනු ලැබීය.


පසුගිය වසර 5 ඇතුළත නිෂ්පාදිත TATA වාහන අනතුරු අලුත්වැඩියා කිරීමේදී අයිතිකරු විසින් ගෙවිය යුතු මුදල ගෙවීමෙන් නිදහස් කිරීම මඟින් අගනා ප්‍රතිලාභයක් මේ නව රක්ෂණාවරණය හරහා පාරිභෝගිකයා හට ලබා දෙනු ලැබේ. තව ද මේ රක්ෂණ ක්‍රමවේදය හරහා DIMOහි සියලු TATA ගනුදෙනුකරුවන්ට සිය රක්ෂණ වාරික අලුත් කිරීමේදී විශේෂ ගෙවීම් අනුපාතිකයන් දීම ද සිදු වනු ඇත. කිසියම් හෝ අනතුරකින් පසු වාහනය ළඟම ඇති DIMOහි TATA වැඩපොළ වෙත රැගෙන යෑම, වඩා වේගවත් ඇස්තමේන්තු අනුමත කිරීමේ ක්‍රියාවලි, නිෂ්පාදකයාගේ නිර්දේශයන්ට අනුකූලව අලුත්වැඩියා කටයුතු කිරීම, අලුත්වැඩියා බිල්පත් ගෙවීම් හා තිබූ පරිදිම වාහනය නැවතත් අයිතිකරු වෙත භාර දීම දක්වා වන සියලු කාර්යයන් සම්බන්ධීකරණය කරමින් TATA පාරිභෝගිකයන් වෙත සුවපහසුව සැපයීම මෙමඟින් සිදු වේ.

DIMOහි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ රංජිත් පණ්ඩිතගේ මහතා ප්‍රකාශ කර සිටියේ, "මේ හවුල මඟින් අපගේ ගනුදෙනුකරුවන් වෙත තවදුරටත් මනා සේවාවක් සැපයීමට හැකි වෙනවා.

සමාගමක් වශයෙන් අප සේවාදායකයන්ගේ සිහින සහ අභිලාශ බල ගැන්වීම උදෙසා අප නිතරම කටයුතු කරන අතර, මෙවැනි කාලසීමාවක Allianz හා එක්ව මෙවැනි රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වාදීම පිළිබඳ මා සතුටු වෙනවා" යනුවෙනි.



# සෙලාන් ටිකිරි සහ WNPS 'Wild Kids' වෙතින් පරිසර වැඩසටහන් පෙළක්



සුහද හදක් ඇති දේශීය බැංකුව, සෙලාන් බැංකුව, වනජීවී හා ස්වභාවධර්ම ආරක්ෂණ සංගමයේ (Wildlife and Nature Protection Society - WNPS) 'Wild Kids' වැඩසටහන සමඟ එක් වී කොළඹ සහ යාපනය යන ප්‍රදේශවල විශේෂ වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කළේය. පරිසරයට ආදරය කරන දරුවන්ට පරිසරයේ අසිරිය විඳ ගැනීමට අවස්ථාව දීම මෙහි අරමුණ විය.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි Wetland Parkහි පවත්වන ලද 'Wetland Park Walk' වැඩසටහනේදී දරුවන්ට තෙත් බිම් පරිසරයක වැඩෙන ගහ කොළ සහ එහි සතුන්ගේ චර්යා සහ හැසිරීම් දැක බලා ගැනීමේ මහඟු අවස්ථාවක් හිමි විය. වෘත්තීය මඟ පෙන්වන්නන් විසින් මෙහිදී එම දරුවන්ට තෙත් බිම් පරිසර පද්ධතියක ස්වභාවය පිළිබඳ සවිස්තරව කරුණු කියා දෙන ලදි. එමෙන්ම මෙහිදී තරග ඉසව් කිහිපයක් පැවැත් වුණු අතර, ජයග්‍රාහකයන්ට වටිනා තෑගි පිරිනැමීමට සෙලාන් ටිකිරි කටයුතු කළේය.

මින් අනතුරුව සෙලාන් ටිකිරි සහ Fox Resort එක්ව 'Nature through Art' නමින් චිත්‍ර වැඩමුළුවක් සහ තරගයක් යාපනයේදී සංවිධාන කරන ලදි. මින් ජයග්‍රහණය කරන ලද දරුවන් තිදෙනකුට වටිනා තෑගිවලට අමතරව සෙලාන් ටිකිරි ගිණුම් සහ මුදල් ත්‍යාග ද හිමි වූ අතර, Fox Resortහි චිත්‍ර ගැලරිය සහ කෞතුකාගාරය ඇතුළු ස්ථාන දැකබලා ගැනීමට ද ඔවුන්ට අවස්ථාව උදා විය. මෙහිදී දරුවන් ඇමතූ සෙලාන් බැංකුවේ ප්‍රාදේශීය කළමනාකරු (යාපනය ප්‍රදේශය) නිර්මලන් නන්දකුමාර් මහතා, තම අනාගතය වෙනුවෙන් ඉතිරි කරන අතරම පරිසරය රැක ගැනීම සඳහා පියවර ගැනීමේ වැදගත්කම පැහැදිලි කළේය.



# සිනෙක් කැම්පස් වෙතින් ජීව විද්‍යා පාඨමාලා රැසක්

සිනෙක් කැම්පස්හි සෞඛ්‍ය අධ්‍යාපන අංශය වසර තුන හා හතර අධ්‍යයන කාල සීමා යටතේ ජීව විද්‍යා අංශයෙන් සෞඛ්‍ය Industrial Pharmaceutical Science, Bio Medical Science, Cosmetic Science යන විෂය ක්ෂේත්‍ර යටතේ උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක් හඳුන්වා දෙයි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සහිත මේ උපාධි පාඨමාලාවලට 40ක පමණ සීමිත සිසුන් පිරිසක් බඳවා ගැනෙයි. ඖෂධවේදි විද්‍යාඥයන් වීමට ද එමඟින් නව ඖෂධ සොයා ගැනීමට හා වැඩි දියුණු කිරීමට, ජාන පර්යේෂණ කිරීමට හා වැඩි දියුණු කිරීමට, නව රූපලාවණ්‍ය නිෂ්පාදන බිහි කිරීමට හා එවැනි කර්මාන්තයක රැකියා කිරීමට, ව්‍යවසායකයකු වීමට අදාළව ලොව පුරා වෘත්තීය අවස්ථා මේ හරහා බිහි වෙයි. මෙහිදී විශේෂ විද්‍යාගාර පහසුකම් සිනෙක් කැම්පස්හි ස්ථාපනය කර ඇති අතර, රෝහල් හා රසායනාගාරවලදී ද පුහුණුව දීමට නියමිතය.

උපාධි පාඨමාලා සඳහා උසස් පෙළ තෙවරකට වඩා නොවැඩි වාර ගණනකදී ජීව විද්‍යා හෝ ගණිත අංශයෙන් නියමිත විෂය තුනකට එක වර අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (S) ලබා තිබිය යුතුය. උසස් පෙළ සුදුසුකම් නැති සිසුන්ට ඩිප්ලෝමා පාඨමාලා හැදෑරිය හැකිය.

මෙරට අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසු ඉතිරි වසර දෙකේ අධ්‍යයන හා පුහුණු කටයුතු ඔස්ට්‍රේලියාවේදී ද හැදෑරිය හැකිය. සාමාන්‍ය පෙළ පමණක් හැදෑරූ සිසුන්ට ඔස්ට්‍රේලියාවේදි මනෝ විද්‍යාව හා හෙද සේවය හැදෑරීම සඳහා වැඩසටහනක් සිනෙක් කැම්පස් වැතම් යුනිවර්සිටි සමඟ එක් වී අරඹා ඇත.

එහිදී වසර 2ක් මෙරට අධ්‍යාපනය ලබා ඉතිරි වසර දෙක ඔස්ට්‍රේලියාවේදි වැඩිහිටියන් රැක බලා ගැනීමේ රැකියාවක් කරමින් අධ්‍යයන හා පුහුණු කටයුතු කිරීමේ හැකියාව ඇත. රැකියාව ඉලක්ක කර උපාධි ප්‍රදානය, විනය හා සංයමය ඇති සිසු පරපුරක් බිහි කිරීම උදෙසා ව්‍යාපාරික හා තාක්ෂණික අත්දැකීම් හා පළපුරුද්ද ඇති ආචාර්ය මණ්ඩලයක් සහිත සිනෙක් කැම්පස් උසස් අධ්‍යාපනය සඳහා කදිම තේරීමකි.

# මෙරට වටිනාම ආහාරපාන සන්නාමය නෙස්ලේ

## නෙස්ටමෝල්ට්-මයිලෝ-මැගී වැඩිම ජනාදරයට




ලෝක ප්‍රකට Brands Finance ආයතනය විසින් ශ්‍රී ලංකාවේ වඩාත් වටිනාම ආහාරපාන සන්නාමය ලෙස නෙස්ලේ පසුගිය දා නම් කෙරුණි. අඛණ්ඩව 19 වැනි වරටත් කෙරුණු මේ ශ්‍රේණිගත කිරීම ශ්‍රී ලාංකික සන්නාමවල වටිනාකම සහ ශක්තිය අගයනු ලබයි. LMD Brands Annual 2022හි පළ කරන ලද මේ ශ්‍රේණිගත කිරීමේදී විවිධ කර්මාන්ත ක්ෂේත්‍රවලට අදාළ මෙරට ආයතනික සන්නාම 100ක් අතුරින් 11 වැනි ස්ථානය හිමි කර ගැනීමට නෙස්ලේ සමාගම සමත්විය. Brands Finance ආයතනය විසින් කළ පුළුල් පර්යේෂණයකට අනුව නෙස්ලේ සන්නාමයේ වටිනාකම 2021 වසරට සාපේක්ෂව 2022 දී සියයට 20කින් වර්ධනය වී තිබීම ද කැපී පෙනේ.

නෙස්ලේ සතු සන්නාම තුනක්, ශ්‍රී ලංකාවේ වැඩිම ජනාදරයට පත් සන්නාම අතරට ද පත් විය. මේ ඇගයීමේදී විවිධ කාණ්ඩවලට අයත් සන්නාම 140ක් පමණ ආවරණය කෙරුණි. ඒ අනුව කිරි ආහාර - මෝල්ට් පාන යන කාණ්ඩයේ වැඩිම ජනාදරයට පත් සන්නාමය බවට 'නෙස්ටමෝල්ට්' පත් විය. ශ්‍රී ලංකාවටම ආවේණික නිෂ්පාදනයක් වන නෙස්ටමෝල්ට් වසර 60කටත් වැඩි කාලයක් පුරා විවිධ පරම්පරාවන්හි ශ්‍රී ලාංකික පාරිභෝගිකයන් ආදරයෙන් වැළඳගත් සන්නාමයක් බව මෙහිදී තවදුරටත් සනාථ විය. මේ අතර එම කාණ්ඩයේම දෙවැනි ස්ථානය දිනාගැනීමට 'මයිලෝ' සන්නාමයට හැකි වූ අතර, නූඩ්ල්ස් සහ වෙනත් තිරිඟු ආහාර යන කාණ්ඩයේ දෙවැනි ස්ථානය දිනාගැනීමට 'මැගී' සන්නාමය සමත්විය.

“ශ්‍රී ලංකාවේ වඩාත් වටිනාම ආහාරපාන සන්නාමය ලෙස ඇගයීමට ලක්වීම අපට විශාල ගෞරවයක්. මෙවන් අභියෝගකාරි කාල සමයකදී අපගේ සන්නාමයේ වටිනාකම සහ ශක්තිය පිළිබඳ මෙබඳු ඇගයීමක් ලැබීම අපට විශාල ධෛර්යයක්. වසර 115කට අධික කාලයක් පුරා ශ්‍රී ලංකාව තුළ කටයුතු කළ සමාගමක් වශයෙන් අපි අඛණ්ඩව ගුණවත් සහ රසවත් ආහාර අපගේ පාරිභෝගිකයින්ට දීමට බැඳී සිටිනවා. ඒ වගේම නෙස්ලේ සන්නාම තුනක් වැඩිම ජනාදරයට පත් සන්නාම ලෙස නම් වීමත් අපට විශාල සතුටක්.“ යනුවෙන් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙන්‍යා මහතා පැවසීය.

දසත දිනමිණ දස අත ම එක තැන

එල්.ඩබ්. ආරියරත්න උඩුගම්පොළ සමූහ

# විලේ අතිරික්ත ජලය බහින්නේ නෑ
# දොරණාගොඩ කුඹුරු අක්කර සිය ගණනක ගොවිතැන් නැවතිලා



මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගම්පොළ දොරණාගොඩ පිහිටා තිබෙන අක්කර තුනක් පමණ විශාල වූ විලේ අතිරික්ත ජලය බැස නොයෑමේ දුෂ්කරතාව නිසා යල මහ දෙන්නයට වගා කළ හැකි කුඹුරු අක්කර සිය ගණනක් වගා කළ නොහැකි තත්ත්වයට පත්ව ඇතැයි ගොවීහු පවසති. අතිරික්ත ජලය බැස නොයෑමේ ප්‍රශ්නයට විසඳුම් දෙකක් තිබෙන බව කෘෂි පර්යේෂණ නිලධාරීහු පෙන්වා දෙති.අනුරාධපුර යුගයේදී දොරණාගොඩ විහාරයක් ගොඩනංවා චෛත්‍යයක් ඉදිකිරීම පිණිස පස් සපයා ගත් භූමි භාගයේ විලක් ඉදිකර ප්‍රදේශයේ වී ගොවිතැනට ජලය සපයා ජනතාවගේ අටුකොටු ධාන්‍යයෙන් පිරවූ බව කියවෙයි.නමුත් දැනට වසර 30-40 ක කාලයක සිට මෙහි අතිරික්ත ජලය බැස නොයෑමේ ගැටලුවක් නිසා එකල වගා කළ කුඹුරු අක්කර සිය ගණනක් මෙසේ වගා නොකළ හැකි තත්ත්වයට පත් වී තිබේ.

මේ සම්බන්ධයෙන් යායේ ගොවි මහතෙකු වන විශ්‍රාමික ග්‍රාමසේවා නිලධාරී එච්.ඒ. ධර්මපාල මහතා මෙසේ කීය- මුල් කාලයේදී ජලය බැස නොයෑමේ ප්‍රශ්නයක් තිබිල නැහැ. විලේ මැදි ඇළේ ජලයෙන් තමයි වී වගා කළේ. නමුත් දැනට වසර 30-40ක කාලයක සිට විලේ අතිරික්ත ජලය බැස නොයෑම නිසා වී වගාව අතහැර දමා තිබෙන්නෙ.2015-2016 වසරේදී මෙම මැදි ඇළ ප්‍රතිසංස්කරණය කළා. එහෙත් එය එතරම් සාර්ථක වුණේ නැහැ.විල හරහා බෙම්මුල්ල දුම්රිය ස්ථානයට යෑමට පාරක් තිබෙනවා.මේ පාර විල හා සමාන්තර මට්ටමක පැවති නිසා මාර්ගය නිරන්තරයෙන්ම වැසි කාලවලට යටවුණා.

**අංක 110/3 දකුණු දොරණාගොඩ ග්‍රාමසේවා වසමේ කෘෂිකර්ම නිෂ්පාදන හා පර්යේෂණ නිලධාරී ලංකා සුදර්ශන මහතා** -විල අයත් ප්‍රදේශයේ කෘෂි පර්යේෂණ නිලධාරී වශයෙන් වැඩ කරන්නෙ මම. මෙම විලට නැගෙනහිර දොරණාගොඩ ප්‍රදේශයේ සිට ජලය ඒකරාශී වෙනවා.මෙම විලේ ජලයෙන් එම වසමේ කුඹුරු ප්‍රමාණයකුත් වැඩ කරනව.නැගෙනහිර සිට එන ජලයත් දකුණු ප්‍රදේශයේ ජලයත් වැසි ජලයත් එකතු වෙලා තමයි විල ජලයෙන් පෝෂණය වන්නෙ. මුල් කාලයේ සිටම විල මැදින් තිබෙන ඇළෙන් ජලය අරගෙනයි දෙපස වෙල්යායවල් වැඩ කරල තියෙන්නෙ.

විලේ අතිරික්ත ජලය බැසයෑම සඳහා අමුණක් ඉදිකර තිබී එය පසුකාලීනව කැඩී ගොස් තිබෙනවා. මෑත කාලයේදී එම අමුණ ප්‍රතිසංස්කරණය කර ජල දොරටු දෙකක් සවිකර තිබෙනවා. මෙම විලේ මැදි ඇලෙන් අතිරික්ත ජලය එම අමුණද සමගින් ජපන් පාලම අසල 'වයි හැඩයෙන්' යුත් ස්ථානයෙන් දී ඇල්ල ඔයට වැටෙනව. එමගින් අපේක්ෂා කරල තියෙන තව වැඩක් තමයි විලේ වතුර අඩුවන කාලයට දී ඇල්ල ඔයෙන් වතුර ගෙන කුඹුරු අස්වැද්දීම.නමුත් ඒ අදහසට වඩා දැන් සිදුවන්නෙ දී ඇල්ල ඔයේ ජලය වැඩි වූ විට එම ඇල මාර්ගය දිගේ විල ප්‍රදේශයට ජලය ආපසු ගලා ඒමයි. දී ඇල්ල ඔයේ ජලය බාධාවකින් තොරව කඩිනමින් ගලා යනව නම් එම ප්‍රශ්නයට මුහුණ දෙන්න වන්නෙ නැහැ. මේ වන විටත් එම අමුණෙ දොරවල් දෙකේ ඉහලම උපරිම මට්ටමට ජලය ළඟා වී තිබෙනව.එසේම විල ආශ්‍රිත වෙල්යාය ආසන්නයේ තිබෙන කොන්ක්‍රීට් මාර්ගයට යටින් දී ඇල්ල ඔයේ ජලය විලේ වෙල්යායට ගලා එනව.

දොරණාගොඩ විලේ අතිරික්ත ජලය බැස නොයාමේ ගැටලුවට විසඳුමක් වශයෙන් අක්කර තුනක් පමණ වූ විල වටා බැම්මක් ඉදිකිරීමෙන් පිටස්තරව විලට එක්කාසු වන ජලය වළක්වා ගත හැකි වෙනව.එවිට විලේ වැඩි ජලය යම් ප්‍රමාණයකින් මැදි ඇළ දිගේ දී ඇල්ල ඔයට මුදා හැරිය හැකියි .එවිට අතිරික්ත ජලය සුළු කාල සීමාවකින් ඉවත් කළ හැකියි.ඒ වැඩපිළිවෙළත් සමඟ තම්මිට හා මාකවිට අමුණුවල ප්‍රශ්නයද විසඳිය යුතුයි. දොරණාගොඩ විලේ ජලයෙන් වගා කරන ගොවීන් 17-20 ක් පමණ හඳුනාගෙන සිටිනව. මේ වන විටත් කීපදෙනෙකු සමග සාකච්ඡා කර යලට කුඹුරු කීපයක් වගාකර තිබෙනව. මේ වන විට ඒවාද ජලයෙන් යට වී තිබෙනව. එය සාර්ථක වුවොත් විලේ කුඹුරු වැඩි හරියක මා වී වැඩ කරන්න අදහස් කර තිබෙනවා. එසේම ගොවීන්ට අවශ්‍ය පොහොර ආදිය කලට ලබා දීමට හැකි වුවොත් එම අදහස එල දරාවි.

**තම්මිට ගොවි සංවිධානයේ සභාපති හා තම්මිට අමුණ ව්‍යාපෘති කමිටුවේ කළමනාකාර ඩබ්ලිව්.කේ. නිමලරත්න මහතා -**

අත්තනගලු ඔය වාරි යෝජනා ක්‍රමය යටතේ තම්මිට අමුණ ඉදිකර තිබෙනවා. තම්මිට අමුණෙ ජල දොරටු 10න් පිටකරන ජලකඳ පිට කරන්නෙ පහළින් තිබෙන මාකවිට ගල් වැටිය අමුණෙන්. මාකවිට ගල් වැටිය අමුණෙ දොරටු 4 යි තිබෙන්නෙ. එතකොට තම්මිට අමුණෙ ජල දොරටු 10 න් පිට කරන ජලකඳ බැස යෑමට තිබෙන මාකවිට ගල් වැටිය අමුණෙ දොරටු 4 කිසිසේත් ප්‍රමාණවත් නැහැ. මේ තත්ත්වය ගම්පහ දිස්ත්‍රික්කයේ ජල ගැලීම්වලටද හේතු වෙනවා.දොරණාගොඩ විලේ ප්‍රදේශයට බලපා තිබෙන්නෙත් මේ ගැටලුවමයි.මේ ගැන අදාළ බලධාරීන් දැනුවත් කළත් මේ දක්වා කිසිම පලක් වී නැහැ.

කේ.ඒ.මෛත්‍රීපාල - දමන සමූහ

## අරන්තලාව ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයට පානීය ජල ව්‍යාපෘතියක්



අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අරන්තලාව ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ පිරිසුදු පානීය ජල ව්‍යාපෘතියක් පසුගියදා ආරම්භ කෙරුණි. උතුරු නැගෙනහිර දෙපළාතේ අධිකරණ සංඝනායක ආචාර්ය කිරිදිවෙල සෝමරතන නාහිමියන්ගේ ඉල්ලීම පරිදි සෞඛ්‍ය අමාත්‍යංශයේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ තාක්ෂණ හා ශ්‍රම දායකත්වය මත ග්‍රාමීය ජනතාව වෙත පිරිසුදු පානීය ජලය ලබා දීමේ අරමුණින් මෙය ක්‍රියාත්මක කර තිබේ. මෙය ජනතා අයිතියට පත් කිරීම ශ්‍රී ලංකා නාවික හමුදාවේ ගිනිකොණ නාවික විධාන ආඥාපති රියර් අද්මිරාල් එම්.එස්.කේ.ආර්.මහවත්ත මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කෙරිණි.මෙම අවස්ථාවට උතුරු නැගෙනහිර දෙපළාතේ අධිකරණ සංඝනායක ආචාර්ය කිරිදිවෙල සෝමරතන නාහිමි ප්‍රමුඛ මහා සංඝරත්නය,අම්පාර මහ දිසාපති ජේ.එම්.ඒ.ඩග්ලස්,ශ්‍රීලංකා යුද හමුදාවේ නැගෙනහිර ආඥාපති මේජර් ජනරාල් ප්‍රියන්ත ජයවර්ධන,24වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජනරාල් සාලිය අමුණුගම,මහඔය ප්‍රාදේශීය ලේකම් තිලිණ වික්‍රමරත්න,අම්පාර කලාප අධ්‍යෂිකා එස්.ආර්.හසන්ති, යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.

නාඋල සමූහ



## කොන්ක්‍රීට් ඇතිරූ පාරක්: දැන් පයින් යන්නත් බැහැ


පෞද්ගලික ආයතනක් විසින් නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වෑකන්දෙයාය මාර්ගය ආසන්නයේ සිදුකරනු ලැබූ බොරළු කපා ප්‍රවාහනය කිරීමේ ක්‍රියාවලිය නිසා අබලන් වූ මාර්ගයේ පාගමනින් හෝ යෑමට නොහැකි තත්ත්වයක් උදාවී ඇතැයි ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණු නාඋල ප්‍රාදේශීය සභා මන්ත්‍රී නාඋල ඉන්ද්‍රසාර හිමියෝ කීහ.රාජ්‍ය ආයතන රැසකගේ අනුමැතියට යටත්ව සීගිරිය ප්‍රදේශයට රැගෙන යන ලද බොරළු කැපීමේ ව්‍යාපෘතියේ සියලු යන්ත්‍ර සූත්‍ර මේ වන විට හිමි කරුවන් විසින් රැගෙන ගොස් ඇතැයි උන්වහන්සේ සඳහන් කළහ. පසුගිය දා (02) පැවති නාඋල ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ දී කරුණු දක්වමින් උන්වහන්සේ සඳහන් කර සිටියේ තමන් වහන්සේ මෙම ව්‍යාපෘතියට කල්වේලා ඇතිවම විරුද්ධ වූ බවයි.

රුපියල් ලක්ෂ පහළොවක් වැය කරමින් වෑකන්දෙයායේ සිට පිළිහුඩුගොල්ල දක්වා කිලෝමීටරයක පමණ දුරක් තාර යොදා සහ වැන්දේ යාය මාර්ගයේ සිට ඇලහැර මාර්ග පිවිසුම තෙක් රුපියල් ලක්ෂ දහයක පමණ මුදලක් වැයකර කොන්ක්‍රීට් අතුරා මෙම මාර්ගය පසුගිය රජය සමයේ දි සංවර්ධන කරන ලදි.මේ වන විට මෙම මාර්ගයේ බොරළු ප්‍රවාහනය හේතුවෙන් කොන්ක්‍රීට් කොටස් කැඩී ගොස් ඇති අතර තාර යෙදු කොටස්වලට විශාල වශයෙන් හානි සිදුව තිබේ.අවස්ථා ගණනාවක දී ප්‍රදේශවාසින් මෙම මාර්ගය සම්බන්ධයෙන් සිදුවී ඇති හානි සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ගෙන් කරුණු විමසා ඇති අතර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාටද මේ සම්බන්ධයෙන් ලිඛිතව දන්වා ඇතැයි සිද්ධිය සම්බන්ධයෙන් කළ සොයා බැලීමේ දී වෑකන්දෙයාය ගම් වාසින් කියා සිටියහ.කෙසේ වෙතත් ප්‍රාදේශීය සභා මාසික රැස්වීම අමතමින් නාඋල ඉන්ද්‍රසාර ස්වාමින් වහන්සේ සඳහන් කර සිටියේ පසුගිය සභා වාරයක දී තමන් වහන්සේ මෙම බොරළු ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කළ විමසීමක දී සභාපති සනත් දසනායක මහතා (ශ්‍රී ලං පො ජ පෙ) මාර්ගයට සිදුවන අලාභ හානි නැවත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අදාළ පාර්ශව මඟින් රුපියල් ලක්ෂ පහක රැඳවුම් මුදලක් සභාව සතුව පවතින බව සඳහන් කළ බවයි.එබැවින් මෙම මුදල් යොදවා අබලන් වී ඇති මාර්ගය කඩිනමින් පිළිසකර කරන ලෙස ද උන්වහන්සේ ඉල්ලා සිටියහ. සභාපති සනත් දසනායක මහතා කියා සිටියේ සතියක් තුළ අදාළ ස්ථානීය පරීක්ෂාවන් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවයි.

ඩී.එස්. ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ

## තණමල්විලදී අනතුරට පත් තුන්රෝදයේ 9ක් ගිහින්






තණමල්විල-උඩවලව මාර්ගයේ 32 කණුව අසලදී සිදුවූ රිය අනතුරකින් අවුරුදු 06ක් වයසැති පිරිමි ළමයෙකු සහ අවුරුදු 44 පුද්ගලයකු මියගොස් ඇතැයි තණමල්විල පොලීසිය පවසයි.මෙලෙස මියගොස් ඇත්තේ වැල්ලවාය යාලබෝව මහවෙලමුල්ල පදිංචි ජී.එම්. මධුර එරංග අවු (06) සහ ජී.එම් ආරියපාල අවු (44) යන දෙදෙනාය.

ත්‍රිරෝ රථයකින් වැලිවේරිය ප්‍රදේශයේ ඥාතියෙකුගේ නිවෙසකට ගොස් වැල්ලවායට ආපසු එමින් සිටියදී උඩවලව-තණමල්විල මාර්ගයේ 32 කණුව අසලදී ත්‍රිරෝද රථයේ රියැදුරුට නින්ද යෑම නිසා ත්‍රිරෝද රථය පාර අයිනේ තිබූ සියඹලා ගසක ගැටී ඇත.

රියැදුරු ඇතුළු නවදෙනෙකු එහි සිට ඇති අතර ඒ අතර කුඩා ළමයින් තිදෙනෙකු සහ කාන්තාවක්ද වේ. අනතුරෙන් තුවාල ලැබූ අය තණමල්විල ප්‍රාදේශීය රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව ජී.එම්. ආරියපාල නමැති අය ඒවන විටත් මියගොස් සිටි බව මූලික පරීක්ෂණවලදී අනාවරණය වී ඇත.



කොළඹ 8, බොරැල්ල මැතිවරණ කොට්ඨාසයට අයත් වනාතමුල්ල කොට්ඨාසයට පිවිසෙන මාවතේ අපජලය ගලා යෑම අවිධිමත් ලෙස සිදු වීම නිසා නව කානු පද්ධතියක් ඉදිකර ඇත. නාගරික විමධ්‍යගත අරමුදලින් ඉදිකළ මෙය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ නාගරික මන්ත්‍රී එස්.නෙළුම්දෙණිය මහතාගේ නිරීක්ෂණයට ලක්වූ අයුරු.

**ඡායාරූපය-ආරියරත්න ගනේගොඩ මැද කොළඹ සමූහ**

බි.ඩබ්ලිව්.ඩී. ධර්මකීර්ති තලාව සමූහ

## සහතික මිලට තෙල්-පොහොර දුන්නොත් රටට ම කන්න දෙන්න පුළුවන්

### ජන ජයගම ගොවි සංවිධානයේ නිමල් රත්නායක කියයි



දැන් තියන තියෙන කෘමිනාශකවල කිසිම ප්‍රමිතියක් නෑ. ඒවායේ මිලත් දරා ගන්න බෑ. සහතික මිලකට නියම ප්‍රමිතියෙන් යුතු කෘමිනාශක සහ රසායනික පොහොර ටික හරියට වෙලාවට ලබා දෙන්න කියලා බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා යැයි 405/ඩී 4 ජන ජයගම ගොවි සංවිධායයේ නිමල් රත්නායක ගොවි ගොවි මහතා කියා සිටියේය.ඒ මහතා මෙසේද කීය.දැන් තියන තියෙන කෘමිනාශක කිසි ප්‍රමිතියක් නෑ.ඒවත් විකුණන්නෙ වැඩි මිලට.සහතික මිලකට නියම ප්‍රමිතියෙන් යුතු කෘමිනාශක සහ රසායනික පොහොර ටික ලබා දෙන්න කියලා අපි බලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා.

මේ විදියට ගොවිතැන් කරලා හරි ආදායමක් ගන්න බෑ.කුලියට කෙනෙක් ගත්තොත් රුපියල් දෙදහස් පන්සීයක් ගෙවන්න ඕන. පොහොර මිටියක් 40000 /=ක් වෙනවා ,රු.5000ට තිබූ තෙල් බෝතලය මේ වෙනකොට රුපියල් පහළොස් දාහක්.ඒවා එකතු කරල බලපුහාම අපි කීයටද මේවා විකුණන්නෙ.මේ දවස්වල බටු මිල හොඳයි. ඉතා මිළ ඉහළ එළවළුවක්. බටු තොග මිල 380/= ත් 400/=ත් අතර සිල්ලර මිල 500/= ඉහළ ගොස් තියනවා. තියෙන ගෙඩියක් හරියට ලොකු උනොත් එහෙම පස් ගුණයකින් බර වැඩි වෙනවා. කිලෝ සීයක් කඩන තැනින් කිලෝ පන්සියයක් හදාගන්න පුළුවන්. අක්කර එක හමාරකින් ඒ වගේ ආදායමක් ගන්න පුළුවන්. නමුත් මේ තියෙන ප්‍රශ්නත් එක්ක කිලෝ 50 කඩාගන්නේ බොහොම අමාරුවෙන්. ඒකත් කෙනෙක් කුලියට දාලා කළොත් එහෙම ඒකේ ආදායමත් අඩුවෙනවා. ඒ ප්‍රශ්නෙට මුහුණ දෙන්න බැරි නිසා තමා මං බටු කොටුව අත ඇරලා දැම්මා.ගොවියො වන අපි කාගෙන්වත් කොමිස් ගහලා නෑ. කොන්ත්‍රාත් පදනම මත කරන්නෙත් නෑ. අපිට පිට රටවලින් ආධාර ලැබෙන්නෙත් නෑ. කුඹුරු ටික පුරන් වෙනවා. ගොවියෝ ගොවිතැන් කරන්න කැමති නෑ. ගොවියන්ට කිසි සාධාරණයක් නෑ.

ජී. අයි. ආර්. ගරුසිංහ වැල්ලවාය විශේෂ

## මහආරගම විද්‍යාලයේ ප්‍රථම බාලදක්ෂ කණ්ඩායම නිල ලාංඡන පළඳති



වැල්ලවාය අධ්‍යපන කලාපයට අයත් මෝ/මහආරගම විද්‍යාලයේ ප්‍රථම බාලදක්ෂ කණ්ඩායමේ නිල ලාංජන පැළඳිමේ උත්සවය විද්‍යාලීය එළිමහන් වේදිකාවේදී පවත්වන ලදි. විද්‍යාලයේ දරුවන් 26 දෙනෙකු නිළ ලාංජන පැළඳීමට එක්ව සිටි අතර මොනරාගල දිස්ත්‍රික් දිසා කොමසාරිස් අනිල් විජේකෝන්,දිස්ත්‍රික් සංගමයේ සභාපති විජිත් රත්නායක, විදුහල්පති හා වැල්ලවාය තණමල්විල බාලදක්ෂ සහය දිසා කොමසාරිස් එල්.එම්. ඩබ්ලිව් මල්කාන්ති,බාලදක්ෂ ආචාරිනි මල්ශා ලක්මාලි, නෙලුම් උදයංගනි යන මහත්ම මහත්මිහු මේ අවස්ථාවට එක්වුහ.

සුමිත්‍රා කුමාරිහාමි කන්තලේ සමූහ

## හොර පාරෙන් ඩීසල් ගන්න හොරෙකුට විසිදහසක් පූජා කරලා

සේරුනුවර සිට කන්තලේ නගරයට පැමිණි පුද්ගලයෙකු රවටා ඩීසල් ගෙන එන්නට යැයි පවසා රුපියල් 20000ක් රැගෙන පලා ගිය පුද්ගලයෙකු අල්ලා අධිකරණය හමුවට පැමිණවීමෙන් පසු ලබන 10 වෙනිදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට කන්තලේ දිසාවිනිසුර හා මහේස්ත්‍රාත් එච්.දිනුදු සමරසිංහ මහතා නියෝග කළේය. මෙලෙස රිමාන්ඩ් කරන ලද්දේ කන්තලේ භාතියගම පදිංචි කන්තලේ භාතියගම පදිංචි 38 හැවිරිදි පුද්ගලයෙකි. එම ප්‍රදේශයේම පදිංචි අනෙක් පුද්ගලයා (27) සොයා මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත.සේරුනුවර ප්‍රදේශයේ ඩීසල් නොමැති හෙයින් තරමක් දැනහඳුනා ගෙන සිටි කන්තලේ පදිංචි පුද්ගලයෙකු ඩීසල් අරන් දීමට හැකි බව පැවසූ හෙයින් පැමිණිලිකරු ඔහු හමුවීමට පැමිණ ඇත.පැමිණිලිකරු මහජන බැංකුවෙන් රුපියල් 20000ක මුදලක් ද ගත් පසු එම මුදල ඩීසල් රැගෙන ඒමට යැයි පවසා ඉල්ලා ඇත. නමුත් ඩීසල් රැගෙන ආපසුව මුදල් දෙන්නම් යැයි පැමිණිලිකරු සැකකරුට පවසා ඇත. තමන් මාගා ආයතනයේ රැකියාව කරන බවත් එහි නිලධාරියකුගේ මාර්ගයෙන් තෙල් ලබා ගන්නා බැවින් ඔහු හමුවට යමු යැයි පවසා ඇත.එම පුද්ගලයා විශ්වාසය තහවුරු වන ලෙස හැසිරුණ බැවින් ගැණුම්කරු ඔහු අතට මුදල් ලබා දී ඇත.

ප්‍රියදර්ශනී කහවල ඉංගිරිය මධ්‍යම සමූහ

## පොල් කඩන අතරේ ගෙවල් 13කුත් කඩලා

හොරණ, අඟුරුවාතොට සහ මිල්ලනිය ප්‍රදේශයන්හි ගෙවල් බිඳුම් 13ක් සිදුකළ පොල් කඩන පුද්ගලයෙක් හොරණ පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු දිවා කාලයේ නිවෙස් බිඳ මුදල් හා රන් ආභරණ ඇතුළු දේපළ සොරාගෙන ඇති බවත් හොරණ පොලිස් වසමේ නිවෙස් බිඳීම් 11 ක්ද, අඟුරුවාතොට සහ මිල්ලනිය ප්‍රදේශයන්හි දේපළ සොරාගැනීම් එක බැගින්ද සිදුකර ඇති බවත් පොලීසිය පවසයි.

හොරණ පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක හේමාල් වීරසිංහ මහතාට ලද තොරතුරක් මත අත්අඩංගුවට ගනු ලැබූ සැකකරු අක්කර 90 වැලිකැටැල්ල ප්‍රදේශයේ පදිංචි 43 හැවිරිදි දෙදරු පියෙකු වන අතෙ ඔහු මත්ද්‍රව්‍ය වලට තදින් ඇබ්බැහි වූවකු බව හෙළිව තිබේ.සැකකරු විසින් සොරාගත් අඟල් 32 එල්.ඊ.ඩී. රූපවාහිනී යන්ත්‍ර දෙකක්, ලැප්ටොප් පරිගණකයක්, ඩීවීඩී හෝම් තියටරයක්, ජේබීඑල් දෙකක්, හෙට්සෙට් එකක්, ටැබ් පරිගණකයක්, කාන්තා අත් ඔරලෝසුවක්, පවුම් 06 ක් බරැති රන්මාල 04ක්, රන් පෙන්ඩන් 03ක්, රන් මුදු 02ක් හා පවුම් 1.5 ක් පමණ බර උණුකරන ලද රන් කැබැල්ලක් ලෙසින් රු. ලක්ෂ 13 ක පමණ දේපළ සොයාගැනීමට පොලීසිය සමත් වී ඇත.

2022 ජුනි 07 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.